# සංවර්ධනයට පෙර මහවැලි ව්‍යාපාරයේ එච්4 සහ එච්5 ප්‍රදේශවල පැවැති තත්වය පිළිබඳ ඇගයීමක්

පර්යේෂණ අධ්‍යයන මාලා 33

1979 දෙසැම්බර්

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

තැ: පෙ: 1522, කොළඹ 7.

2009/06
2010/04

# සංවර්ධනයට පෙර මහවැලි ව්‍යාපාරයේ
# එච් 4 සහ එච් 5 ප්‍රදේශවල පැවැති තත්වය පිළිබඳ ඇගයීමක්

ඒ. එස්. රණතුංග
එම්. පී. පෙරේරා
ඒ. එම්. ටී. ගුණවර්ධන
ඩබ්ලිව්. ඒ. ටී. අබේසේකර
යූ. එල්. ජේ. ජේ. පෙරේරා

පර්යේෂණ අධ්‍යයන - අංක 33 1979 දෙසැම්බර්

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත
කොළඹ

22126

ග්‍රන්ථාලය
LIBRARY
ගො.කො.ප.පු.ආ.
HARTI

22126

මෙම ප්‍රකාශණය පිළියෙල කිරීම
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි
ඩබ්ලිව්. ඒ. ටී. අබේසේකර විසිනි.

මුද්‍රණය 1980 මැයි

# පෙරවදන

දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතින විශාලතම සංවර්ධන ව්‍යාපාරය වන මහවැලි ව්‍යාපාරයට අයත් එච් 4 සහ එච් 5 ප්‍රදේශවල ඇති කිරීමට බලාපොරොත්තු වන සංවර්ධන කාර්යයන් තුලින් මතුවන කෘෂිකාර්මික, ආර්ථික හා සමාජමය ප්‍රතිඵල අගැයීමේ කාර්යය ලෝක බැංකුවේ නිර්දේශයකට අනුව, මහවැලි සංවර්ධන මණ්ඩලය මගින් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට පවරන ලදී. ඒ අනුව අප ආයතනය විසින් භාරගත් මෙම කාර්යයේ ප්‍රථම කොටස, 1978 වර්ෂයේ මුල් භාගයේදී, එනම් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට කලින් එහි තිබූ කෘෂිකාර්මික හා සමාජ –ආර්ථික පරිසරය විස්තරාත්මකව අධ්‍යයනය කරන ලද අතර මෙම වාර්තාව ඉදිරිපත් කරන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය කඩිනමින් නිම කිරීමට රජය විශේෂ අවධානයක් යොමු කිරීම හේතුවෙන් අප ආයතනය විසින්ද සිය පර්යේෂණ වැඩ සටහනේ ප්‍රමුඛත්වයක් මෙම අධ්‍යයනය සඳහා ලබා දුනි. මෙම කටයුත්ත සාර්ථකව නිම කිරීම ආයතනයේ පර්යේෂකයින් කණ්ඩායමක් විසින් භාර ගත් අතර ඔවුන්ට ඒ.එස්. රණතුංග, එම්.පී. පෙරේරා, ඒ.එම්.ටී. ගුණවර්ධන, ඩබ්ලිව්.ඒ.ටී. අබේසේකර සහ යූ.එල්.ජේ.ජේ. පෙරේරා යන නිලධාරි මහතුන් ඇතුළත් විය. අධ්‍යයනයට අදාල සම්බන්ධීකරණ කටයුතු ඒ.එස්. රණතුංග මහතා විසින් සිදු කරන ලදී.

අධ්‍යයනය තුලින් ප්‍රදේශය පිළිබඳව වැදගත් කරුණු රාශියක් හෙළිවන අතර මේවා ප්‍රදේශයේ සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී මහවැලි සංවර්ධන අමාත්‍යාංශයට, මහවැලි සංවර්ධන අධිකාරියට මෙන්ම මහවැලි සංවර්ධන මණ්ඩලයටද ප්‍රයෝජනවත් වනු නොඅනුමානය. විශේෂයෙන්ම මෙම වාර්තාවට අදාල සීමාවන් වන එච් 4 සහ එච් 5 ප්‍රදේශවල සංවර්ධන කටයුතු දැනට ඉතා සීඝ්‍රයෙන් කෙරීගෙන යන නිසා මෙම වාර්තාවෙන් හෙළිවන කරුණු ඉතා කාලෝචිත බව හැඟේ.

අවසාන වශයෙන් මෙම වාර්තාව ඉක්මනින් ප්‍රකාශනය කිරීම සඳහා ඉමහත් පරිශ්‍රමයක් දැරූ අධ්‍යයන කණ්ඩායමට මෙන්ම අනෙකුත් සියළුම අයටද මගේ කෘතඥතාවය හිමිවේ.

ටී.බී.සුබසිංහ
අධ්‍යක්ෂ

1979 දෙසැම්බර් මස.
ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණුකිරීමේ ආයතනය.

## ස්තූතිය

මෙම පර්යේෂණ වාර්තාව පිළියෙල කිරීමෙහි ලා ආයතනය තුළ මෙන්ම ඉන් පිටස්තර නිලධාරි මහතුන් ගණනාගේ සහයෝගය ලැබුණු අතර එම කටයුතු ඉටු කිරීමේදී විශේෂ පරිශ්‍රමයක් දැරූ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් වන එම්. පී. පෙරේරා, ජී. එම්. ටී. ගුණවර්ධන, ඩබ්ලිව්. ඒ. ටී. අබේසේකර සහ යූ. එල්. ජේ. ජේ. පෙරේරා මහතුන්ට අධ්‍යයනයේ සම්බන්ධීකරණ නිලධාරි ලෙස මගේ විශේෂ ස්තූතිය පිරිනැමීම මා සතු යුතු කමකි. මූලාරම්භයේ පටන් අවසානය තෙක්ම මෙම මහතුන් කණ්ඩායම එහි සාර්ථකත්වය සඳහා විශේෂ පරිශ්‍රමයක් දැරූ බව සඳහන් කළ යුතු වේ. කෙසේ වුවද මෙම වාර්තාව ලියා ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත දැක්වෙන පරිදි ඔවුන් අතර වගකීම් බෙදී ගොස් ඇත.

| | |
|---|---|
| සාරාංශය හා නිගමනය | ජී. එස්. රණතුංග<br>එම්. පී. පෙරේරා |
| හැඳින්වීම | එම්. පී. පෙරේරා<br>ජී. එස්. රණතුංග |
| අධ්‍යයන ප්‍රදේශය | එම්. පී. පෙරේරා |
| කුටුම්භයන්ගේ මූලික ලක්ෂණ | එම්. පී. පෙරේරා |
| ශ්‍රම බලකාය රැකියා නියුක්තිය හා ආදායම් | ඩබ්ලිව්. ඒ. ටී. අබේසේකර |
| භූමි පරිහරණය සහ භුක්ති ක්‍රම | ජී. එස්. රණතුංග<br>එම්. පී. පෙරේරා |
| ගොවිතැන් ක්‍රම | ජී. එස්. රණතුංග |
| අස්වනු මට්ටම් සහ එහි පරිහරණ රටාවන් | ජී. එස්. රණතුංග<br>ජී. එම්. ටී. ගුණවර්ධන |
| ආයතනික සම්බන්ධතා | ජී. එම්. ටී. ගුණවර්ධන |
| සමාජමය ව්‍යුහය සහ එහි පරිවර්තන ලක්ෂණ | යූ. එල්. ජේ. ජේ. පෙරේරා |

මෙහිදී මහවැලි සංවර්ධන මණ්ඩලයේ නිලධාරි මහතුන්ගේ ලැබුණු සහයෝගයද ඉතා අගය කොට සලකමි. ඔවුන් අතරින් එහි සාමාන්‍යාධිකාරි ආචාර්ය වෝල්ටර් අබේගුණවර්ධන මහතා සහ තොටිවීයා ගම, එප්පාවල, තලාව සහ තඹුත්තේගම ප්‍රදේශවල ඉඩම් නිලධාරි මහතුන් ගැනද විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මෙම අධ්‍යාපනය පිළිබඳව අප ආයතනය හා මහවැලි සංවර්ධන මණ්ඩලය අතර සම්බන්ධීකරණ කටයුතු ඉටු කළ මහවැලි සංවර්ධන මණ්ඩලයේ ආර්ථික විද්‍යාඥ ඩී. පතිරාජ මහතා විශේෂයෙන් සිහිපත් කළ යුතුවේ.

අධ්‍යයනයට අදාළ නියැදිය තෝරා ගැනීමේදී හා පර්යේෂණ සැලැස්ම සකස් කිරීම මෙන්ම දත්ත පිළියෙල කිරීම පිළිබඳව උපදෙස් ලබා දුන් ටී. ෂන්මුගම් මෙනවියටත් මෙම වාර්තාවේ මුල් පිටපත පිළිබඳව අදහස් දැක්වූ ආචාර්ය එච්. ඩී. සුමනසේකර යන මෙම ආයතනයේ පර්යේෂණ නිලධාරීන් දෙදෙනාටද මෙහිදී අපගේ විශේෂ ස්තූතිය හිමිවේ. ආයතනයේ සංඛ්‍යාන විමර්ශක වරුන් වන ඒ. පී. සමරකෝන්, කේ. පී. මල්ලිකාරච්චි, එම්. සිරිසේන, පී. වී. දසනායක සහ සමීක්ෂණය සඳහාම තාවකාලිකව බඳවා ගත් අනෙකුත් විමර්ශක මහතුන්ගේ සේවයටද කෘතඥතාවය පිරිනැමෙන අතර අධ්‍යයන දත්ත පිළියෙල කිරීමේදී ඒ. පී. සමරකෝන් මහතාගෙන් ලැබුණු සහාය විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මෙම සිංහල පිටපත සකස් කිරීමේදී ඉතා උනන්දුවෙන් සහාය දුන් ආයතනයේ විමර්ශක ඩෙන්සිල් මල්ලව ආරච්චි මහතාටද ස්තූතිය පිරිනැමීම යුතු කමකි.

මේ සඳහා සියලුම යතුරු ලියන කටයුතු කාර්යක්ෂමව ඉටු කළ චිත්‍රා අලිගම මෙනවියගේ සහායද මෙහිදී ස්තූති පූර්වකව සිහිපත් කෙරේ.

1979 දෙසැම්බර් මස,
ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණුකිරීමේ ආයතනය.

ඊ. එස්. රණතුංග
අධ්‍යයනයේ සම්බන්ධීකරණ නිලධාරි.

## පටුන


| පරිච්ඡේදය | | පිටුව |
|---|---|---|
| | සාරාංශය හා නිගමනය | 1 |
| 1 | හැඳින්වීම | 20 |
| | 1.1 ආරම්භය | 20 |
| | 1.2 අධ්‍යයනයන්ගේ අරමුණු | 20 |
| | 1.3 අධ්‍යයන ක්‍රමය | 22 |
| 2 | අධ්‍යයන ප්‍රදේශය | 27 |
| | 2.1 පිහිටීමේ ස්වභාවය | 27 |
| | 2.2 වෙනත් පහසුකම් | 28 |
| 3 | කුටුම්භයන්ගේ මූලික ලක්ෂණ | 34 |
| | 3.1 ජනගහණ ලක්ෂණ | 34 |
| | 3.2 නිවාස පහසුකම් | 38 |
| | 3.3 සේවා මධ්‍යස්ථාන හා ඒවායේ සමීපතාවය | 39 |
| | 3.4 ගෘහ භාණ්ඩ අයිතිය | 39 |
| | 3.5 ගොවි උපකරණ අයිතිය | 40 |
| | 3.6 සත්ව පාලන කටයුතු | 41 |
| 4 | ශ්‍රම බලකාය, රැකියා නියුක්තිය සහ ආදායම | 42 |
| | 4.1 වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහණ සංයුතිය | 42 |
| | 4.2 අධ්‍යාපනික තත්වය | 42 |
| | 4.3 වයස් කාණ්ඩ අනුව පාසැල් යාමේ අනුපාතිකය | 43 |
| | 4.4 ශ්‍රම බලකාය | 44 |
| | 4.5 ආදායම | 49 |
| 5 | ඉඩම් පරිහරණය සහ භුක්ති ක්‍රම | 54 |
| | 5.1 ඉඩම් පරිහරණ රටාව | 54 |
| | 5.2 වගා ක්‍රම | 56 |
| | 5.3 ඉඩම් භුක්තිය | 57 |
| | 5.4 ගොවිපොලේ ප්‍රමාණය | 63 |

| පරිච්ඡේදය | | පිටුව |
|---|---|---|
| 6 | ගොවිතැන් ක්‍රම | 67 |
| (අ) | කුඹුරු ගොවිතැන | 67 |
| | 6.1 වාරිමාර්ග මූලයන් සහ එහි මට්ටම | 67 |
| | 6.2 වාරිමාර්ග ක්‍රමය සහ වගාසුක්ෂම තාවය | 68 |
| | 6.3 සී සෑම | 70 |
| | 6.4 වගා කාල සීමාව | 74 |
| | 6.5 බීජ වර්ග භාවිතය | 75 |
| | 6.6 වගා ක්‍රම | 77 |
| | 6.7 පොහොර භාවිතය | 78 |
| | 6.8 වල් මර්ධනය | 80 |
| | 6.9 කෘමි රෝග හා වසංගත මර්ධනය | 81 |
| | 6.10 ශ්‍රම භාවිතය | 81 |
| | 6.11 මෙහෙයුම් කටයුතු සඳහා වූ මුදල් වියදම් | 83 |
| (ආ) | ගොඩ ඉඩම් | 85 |
| | 6.12 හේන | 85 |
| | 6.13 අනෙකුත් ගොඩ ඉඩම් | 88 |
| 7 | අස්වනු මට්ටම් හා එහි පරිහරණ රටාව | 89 |
| | 7.1 අස්වනු මට්ටම් | 89 |
| | 7.2 වී පරිහරණ රටාව | 91 |
| | 7.3 හේන් නිෂ්පාදන හා එහි පරිහරණ රටාව | 93 |
| 8 | ආයතනික සම්බන්ධතා | 96 |
| | 8.1 ග්‍රාමීය ආයතන | 96 |
| | 8.2 වගා ණය | 98 |
| | 8.3 ද්‍රව්‍යමය යෙදවුම් සැපයුම් | 101 |
| | 8.4 ව්‍යාපෘති සේවාවන් ප්‍රයෝජනයට ගැනීම | 102 |
| | 8.5 ආයතනික පහසුකම් යටතේ වී අලෙවිය | 104 |
| 9. | සමාජ ව්‍යුහය හා එහි පරිවර්තන ලක්ෂණ | 105 |
| | 9.1 ජනාවාස | 105 |
| | 9.2 ඥාති සම්බන්ධතා | 107 |
| | 9.3 සමාජීය වෙනස්වීම් | 108 |
| | 9.4 නව ජනාවාස පිළිබඳව ගොවීන්ගේ ආකල්පයන් | 111 |
| | උප ග්‍රන්ථය | 113 |

# වගු ලේඛණය


| වගු අංකය | | පිටුව |
|---|---|---|
| | 1 වන පරිච්ඡේදය | |
| 1.1 | එච් 4 එච් 5 ප්‍රදේශවල නියැදි කුටුම්භයන්ගේ ව්‍යාප්තිය | 24 |
| | 2 වන පරිච්ඡේදය | |
| 2.1 | 1978 වන විට එච් 4, එච් 5 ප්‍රදේශවල ලියා ලියා පදිංචිව තිබූ පාසැල් | 29 |
| 2.2 | 1978 ජනවාරි 01 දින වන විට ක්ෂේත්‍රය අනුව පුහුණු ගුරුවරුන්ගේ ව්‍යාප්තිය | 29 |
| 2.3 | 01.01.1978 දිනට තිබූ ගුරු සිසු අනුපාතය | 30 |
| 2.4 | 01.01.1978 දින වන විට ප්‍රදේශයේ තිබූ ග්‍රාමීය ආරෝග්‍යශාලා හා බෙහෙත් ශාලා | 30 |
| | 3 වන පරිච්ඡේදය | |
| 3.1 | නියැදි ගෘහයන්ගේ මූලික ජනගහණ සාධක | 35 |
| 3.2 | නියැදි කුටුම්භවල වයස් සංයුතිය හා එහි යැපුම් තත්වය | 36 |
| 3.3 | නිවාසවල ස්වභාවය | 38 |
| 3.4 | මූලික සේවා පහසුකම් සපයන ස්ථානයන්ට ඇති දුර ප්‍රමාණය අනුව නිවෙස්වල ව්‍යාප්තිය | 39 |
| 3.5 | සංවර්ධන ප්‍රදේශ අනුව නිවාසවල ගෘහභාණ්ඩ අයිතියේ ව්‍යාප්තිය | 40 |
| 3.6 | ගොවි උපකරණ අයිතියේ ප්‍රතිශතක ව්‍යාප්තිය | 41 |
| 3.7 | පශු සම්පත් අයිතියේ ව්‍යාප්තිය | 41 |
| | 4 වන පරිච්ඡේදය | |
| 4.1 | ජනගහණයේ අධ්‍යාපනික මට්ටම්වල ව්‍යාප්තිය | 43 |
| 4.2 | වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව පාසැල් යාමේ ව්‍යාප්තිය | 44 |
| 4.3 | වයස් කාණ්ඩ අනුව ශ්‍රම බලකායේ ව්‍යාප්තිය | 45 |
| 4.4 | අධ්‍යයන ප්‍රදේශයේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන ජනගහණය | 46 |
| 4.5 | රැකියා කාණ්ඩ අනුව ශ්‍රම බලකායේ වර්ගීකරණය | 47 |
| 4.6 | කෘෂිකාර්මික නොවන රැකියා කාණ්ඩයන්හි ව්‍යාප්තිය | 48 |
| 4.7 | ආදායම් මාර්ග අනුව ගෘහයන්ගේ ව්‍යාප්තිය | 50 |

වගු අංකය පිටුව


4.8 ගොවිපළක දළ ආදායමේ සංයුතිය 51

4.9 කන්න අනුව කෘෂිකර්මයෙන් ලද සාමාන්‍ය වාර්ෂික දළ ආදායමේ සංයුතිය 51

4.10 කෘෂි කර්මයෙන් ලද ... මුදල් සංයුතිය 52

4.11 සංවර්ධන ප්‍රදේශ අනුව ගෘහයන්හි වාර්ෂික දළ ආදායමේ ව්‍යාප්තිය 53

5 වන පරිච්ඡේදය

5.1 ඉඩම් පරිහරණ ඒටාවේ විවිධ ක්‍රම අනුව ශුද්ධ හා දළ අක්කර ගණන 54

5.2 වගා කන්න අනුව, ගොවිපළේ සාමාන්‍ය ප්‍රමාණය හා වාරිතා කළ ගොවීන්ගේ ප්‍රතිශතය අනුව ගොවිපල වර්ගීකරණය 56

5.3 ඉඩම් අයිතියේ ස්වභාවය අනුව මෙහෙයුම් හිමියන්ගේ ව්‍යාප්තිය 58

5.4 බදු ක්‍රමය හා ඉඩමේ ස්වභාවය අනුව ඉඩම් ව්‍යාප්තිය 59

5.5 ඉඩම් අයිතියේ ස්වභාවය සහ සංවර්ධන ප්‍රදේශ අනුව කුඹුරු ඉඩම්වල ප්‍රතිශතක ව්‍යාප්තිය 60

5.6 බද්ද වෙනුවෙන් ගෙවනු ලබන අස්වනු කොටස 61

5.7 කෘෂි කාර්මික ඉඩම් නොමැති හෝ සුළු ප්‍රමාණයක් අයිති ගෘහ මූලිකයන්ගේ ප්‍රතිශතය – 1978 මහ 62

5.8 කුඹුරු ඉඩම් නොමැති හෝ සුළු ප්‍රමාණයක් අයිති ගෘහ මූලිකයන්ගේ ප්‍රතිශතය – 1978 යල 62

5.9 මෙහෙයුම් හිමියන්ගේ සංයුතිය (එක් ගොවිපලකට) 1978 63

5.10 වාර්ෂික කෘෂිකාර්මික ආදායමේ සාමාන්‍ය ව්‍යාප්තිය 65

6 වන පරිච්ඡේදය

6.1 සංවර්ධන ප්‍රදේශ හා ජල සැපයුම් මාර්ගය අනුව වී වගා කළ අක්කර ගණනේ ප්‍රතිශතක ව්‍යාප්තිය 68

6.2 සංවර්ධන ප්‍රදේශ අනුව වී වගාවේ සූක්ෂමතාවය 68

6.3 1973 සිට 1978 දක්වා සම්පූර්ණ කුඹුරු ඉඩම් ප්‍රමාණය වගා නොකළ කන්න ගණන අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 69

6.4 යොදාගනු ලැබූ ගොවිපල බලය – 1977/78 මහ 71

6.5 යොදාගනු ලැබූ ගොවිපල බලය – 1977 යල 71

6.6 වී වගාව සඳහා යොදා ගනු ලැබූ ගොවිපල බල අයිතියේ ස්වභාවය 72

6.7 වැපිරීමේ කාල සීමාව අනුව ගොවීන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය 1977/78 මහ 74

| වගු අංකය | | පිටුව |
|---|---|---|
| 6.8 | වගා කළ බීජ වර්ගය හා ජල සැපයුම් මාර්ගය අනුව ගොවීන් ගේ ව්‍යාප්තිය – 1977/78 මහ | 75 |
| 6.9 | වගා කළ බීජ වර්ගය හා ජල සැපයුම් මාර්ගය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 1977 යල | 75 |
| 6.10 | සංවර්ධන ප්‍රදේශ අනුව විවිධ වී වර්ග වගා කළ ප්‍රමාණයේ ව්‍යාප්ති ප්‍රතිශතය – 1977/78 මහ | 76 |
| 6.11 | වගා ක්‍රම අනුව ගොවීන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය | 77 |
| 6.12 | සංවර්ධන කලාපයන්හි පැල සිටුවීම – 1977/78 මහ | 77 |
| 6.13 | සංවර්ධන ප්‍රදේශයන්හි පොහොර භාවිතා කළ ප්‍රමාණයේ ව්‍යාප්ති ප්‍රතිශතය | 78 |
| 6.14 | වල් වර්ධනය කළ බිම් ප්‍රමාණය හා මර්ධන ක්‍රමය | 80 |
| 6.15 | කාර්යය අනුව වී වගාව සඳහා ශ්‍රම භාවිතය | 81 |
| 6.16 | වී වගාව සඳහා භාවිතා කළ ශ්‍රම වර්ගය | 82 |
| 6.17 | භාවිතා කළ ප්‍රධාන යෙදවුම් අනුව වී වගාව සඳහා අක්කර යකට වැය වූ මුදල්මය මෙහෙයුම් පිරිවැය 77/78 මහ | 84 |
| 6.18 | සංවර්ධන ප්‍රදේශ අනුව හේන් වගා කළ ගොවීන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය – 1977/78 මහ | 85 |
| 6.19 | හේන් වගා කටයුතු මෙහෙය වූ කාලය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය– 1977/78 මහ | 86 |
| 6.20 | හේන් වගා කටයුතු මෙහෙය වූ කාලය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 1977 යල | 86 |
| 6.21 | හේන්වල භෝග වගා රටාව | 87 |


## 7 වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 7.1 | සංවර්ධන ප්‍රදේශ තුළ අක්කර 1 කට ලැබුණු වී අස්වනු ප්‍රමාණය | 89 |
| 7.2 | වී පරිහරණ රටාව | 92 |
| 7.3 | හේන් භෝග නිෂ්පාදනය හා අලෙවිය (1977/78 මහ හා 1977 යල | 93 |
| 7.4 | හේන් නිෂ්පාදනයන්ට ලැබුණු මිල මට්ටම් | 94 |

වගු අංකය — 8 වන පරිච්ඡේදය — පිටුව


| වගු අංකය | | පිටුව |
|---|---|---|
| 8.1 | සංවර්ධන ප්‍රදේශ අනුව ග්‍රාමීය ආයතන හා ඒවායේ සේවා අංශයන්හි ව්‍යාප්තිය | 97 |
| 8.2 | වී වගාවට සම්බන්ධ සේවාවන් ලබා ගැනීම සඳහා ආයතනික පහසුකම් මත රඳා පැවැත්ම 1977/78 මහ | 98 |
| 8.3 | වී වගාව සඳහා ණය ලබා ගැනීම | 99 |
| 8.4 | වී වගාව සඳහා ණය පහසුකම් ප්‍රයෝජනයට ගැනීම –1977/78 මහ | 100 |
| 8.5 | ආයතනික මාර්ග වලින් පොහොර මිලදී ගැනීම | 101 |
| 8.6 | ව්‍යාප්ති සේවාවන් මගින් සැපයුනු සේවාවන් ප්‍රයෝජනයට ගැනීම | 102 |
| 8.7 | කෘෂිකාර්මික ප්‍රවෘත්ති කියවන්නන් සහ කෘෂිකාර්මික ගුවන් විදුලි වැඩ සටහන් අසන්නන්ගේ ව්‍යාප්තිය | 103 |

## සාරාංශය හා නිගමන

මෙම අධ්‍යයනය මගින් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ කොටසක් වන කලාඔය නිම්නයේ එච් 4 සහ එච් 5 ප්‍රදේශවල සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට පෙර, එනම් 1978 වර්ෂයේ පැවැති කෘෂිකාර්මික, සමාජයීය හා ආර්ථික තත්වය පිළිබිඹු කෙරෙන සවිස්තර හැඳැරීමක් ඉදිරිපත් කෙරේ. මෙහිදී යොදාගත් විමර්ශන කාල සීමාව වන්නේ 1977 යල් කන්නය සහ 1977/78 මහ කන්නය ඇතුළත් වූ වගා වර්ෂයයි. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් යොදාගත් එච් 4 හා එච් 5 ප්‍රදේශවලට සංවර්ධන ප්‍රදේශ අංක 5, 6, 7 සහ 8 අයත් වන අතර මෙහි නියැදිය වශයෙන් සසම්භාවී ක්‍රමයට තෝරාගත් කුටුම්භයන් 512 ක් අඩංගු විය. මෙය ප්‍රදේශයේ මුළු ගෘහයන් සංඛ්‍යාවෙන් 7% කි.

1. අධ්‍යයන ප්‍රදේශය තුළ දැනට ඇති ජනගහන ප්‍රමාණය පුද්ගලයින් 45000 පමණ බව තක්සේරු කරන ලදී. ගෘහමූලිකයන්ගෙන් කොටසක් (5%) මෑතදී එනම් 1971 ට පසු පිට පළාත් වලින් පැමිණ පදිංචි වූ අය වේ. ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් වයස අවුරුදු 25 ට අඩු අයගෙන්ද, 40%ක ප්‍රමාණයක් අවුරුදු 14 ට අඩු අයගෙන්ද සමන්විත වීමෙන් පෙනී යන්නේ නිවැසියන්ගෙන් වැඩි කොටසක්ම ළාබාල අයගෙන් සමන්විත වන බවයි. මේ අයුරින් තරුණ පෙළ ජනගහනයෙන් වැඩි කොටසක්ම නියෝජනය කිරීම, පවත් සැලකිය යුතු ද්විතියක ප්‍රතිඵල රාශියක් සමාජය තුළ වර්ධනය කිරීමට මග පාදා ඇත. මේවා අතරින් ඉතා වැදගත් වන්නේ ගොවිපල කාර්‍යයන් සඳහා යොදාගත හැකි ශ්‍රම ප්‍රමාණය මුළු ජනගහනයෙන් හරි අඩක් පමණ වීමයි. මෙවැනි තත්වයක් හේතුවෙන් ප්‍රදේශය තුළ අනාගත කෘෂිකාර්මික සංවර්ධන කාර්යයේදී අවශ්‍ය ශ්‍රම ප්‍රමාණය ප්‍රදේශය තුලින් සපයා ගැනීම අපහසු විය හැකි අතර ඒ සඳහා අවශ්‍ය ශ්‍රමය ප්‍රදේශයට පිටතින් ලබා ගැනීමටද සිදුවිය හැක.

   මේ ප්‍රදේශයේ අනාගත ශ්‍රම හමුදාවන්ගෙන් වැඩි ප්‍රමාණයක්ම තරුණ ශ්‍රමය තුලින් ඇතිවන නිසා ප්‍රදේශයේ ඊනියා අවස්ථාවන් සැලසුම් කිරීමේදී එම තරුණ ආකල්ප හා බලාපොරොත්තු ගැනද සැලකිලිමත් වීම වැදගත් කොට සැලකිය හැක. වර්තමානයේ දැනට ලැබෙන තත්වය අනුව නාගරික මෙන්ම ගම්බදවද තරුණ පරපුරේ ආකල්ප, බලාපොරොත්තු හා අපේක්ෂා වන් නවීන සමාජ රටාවන්ට නැඹුරුවක් දක්වයි. ඊනියා අවස්ථාවන් සැලසුම් කිරීමේදී මෙන්ම ජනතාවට අවශ්‍ය වෙනත් සේවා පහසුකම් එනම් අධ්‍යාපන, සෞඛ්‍ය හා වෙනත් සුබසාධක සේවා සැපයීමට සැලසුම් පිළියෙල කිරීමේදී ද ඉහත කී ලක්ෂණ ගැන සැලකිලිමත් විය යුතු වේ.

2. අධ්‍යාපනය අතින් සලකා බලන විට පාසැල් යාම අවසන් කර ඇති හා දැනට පාසැල් යමින් සිටින සංඛ්‍යාව වයස අවුරුදු 5 ට වැඩි සියළුම පුද්ගලයින්ගේ ප්‍රමාණයෙන් 86% කි. **මේ අනුව** ජනගහනයෙන් කියවීමට ලිවීමට හැකි අයගේ අනුපාතය ඉහල මට්ටමක පවතින **බව** පෙන්විය හැක. ප්‍රදේශයේ පාසැල් වල දක්නට ලැබෙන තත්වය අනුව සෑම ශිෂ්‍යයන් 31.4 කටම ඇත්තේ එක් ගුරුවරයෙක් වන අතර දිස්ත්‍රික්කය තුල පවතින්නේ 1:23:3 ගුරු සිසු අනුපාතයකි. මේ අනුව ප්‍රදේශයේ පවතින ගුරු සිසු අනුපාතය දිස්ත්‍රික්කයේ පවතින තත්වයට වඩා අඩු මට්ටමක පවතින බව කිව හැක. මුළු ගෘහයන්ගේ ප්‍රමාණයෙන් හතරෙන් තුනක පමණ ප්‍රමාණයකටම සැතපුමක් ඇතුලත පාසැලක් බැගින් පිහිටා ඇත. අධ්‍යයන ප්‍රදේශය තුල පාසැල්වල උපාධිධාරී විද්‍යා ගුරුවරුන්ගේ දැඩි හිඟයක් පවතී.

3. ප්‍රදේශයේ දැනට ඇති නිවාස වලින් ස්ථාවර නිවාස වශයෙන් සැලකිය හැක්කේ පහෙන් එකක ප්‍රමාණයක් පමණක් වන බැවින් මෙහි නිවාස වල සාමාන්‍ය තත්වය සතුටුදායක මට්ටමක පවතින බව කිව නොහැක. ප්‍රදේශය තුල සනීපාරක්ෂාව පවත්වා ගැනීම සඳහා ඇති පහසුකම්ද සතුටුදායක තත්වයක නොපවතී. වැසිකිලි ඇත්තේ නිවෙස් වලින් 30% කට පමණි. නිවෙස් වලින් 95% ක්ම බීම සඳහා ළිං ජලය ප්‍රයෝජනයට ගන්නා අතර, තමාටම අයත් ළිඳක් තිබෙන බව වාර්තා කර ඇත්තේ මොවුන්ගෙන් තුනෙන් එකක් පමණි. නිවෙස් වලින් 80% ක් පමණ වන ප්‍රමාණයක්ට වාහනයක් ලඟ විය හැකි වන අතර මේවා බස් පාරේ සිට සැතපුමක් ඇතුලත පිහිටා තිබේ.

4. ප්‍රදේශයේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවල තිබෙන පහසුකම් සලකා බැලීමේදී හැම පුද්ගලයන් 1000 කට ඇඳන් 2.6 ක පමණ අනුපාතයක් ඇත. මෙම අනුපාතය දිස්ත්‍රික්කයටම 3.5 වන අතර ජාතික මට්ටමේදී එය 3.0 අගයක් ගනී. සියළුම නිවෙස් ඩිස්පෙන්සරි හෝ ආරෝග්‍යශාලාවකට සැතපුම් 5 ක දුර ප්‍රමාණයක් ඇතුලත පිහිටා ඇත.

5. අධ්‍යයන ප්‍රදේශය සාමාන්‍යයෙන් තැපැල් පහසුකම් අතින් දුර්වල **තත්වයක පවතින** බව පෙනේ. නිවෙස් වලින් තුනෙන් එකක් පමණ තැපැල් කාර්යාලයකට සැතපුමක් හෝ ඊට අඩු දුරකින් පිහිටා ඇති අතර පළාතේ සෑම නිවෙසක්ම තැපැල් කාර්යාලයකටම සැතපුම් පහක් ඇතුලත පිහිටා ඇත.

6. බැංකු පරිහරණය පිළිබඳ පුරුද්ද පළාත් වාසීන් අතර ක්‍රමයෙන් වැඩි දියුණුවෙමින් පවතින බව පෙනේ. 1977 වර්ෂයේදී එච් 4 සහ එච් 5 ප්‍රදේශ දෙකේ සෑම පුද්ගලයින් 1000 කින් 325 දෙනෙකුටම බැංකු ගිණුමක් තිබුනි. එච් 4 ප්‍රදේශයේ පමණක් මෙය පුද්ගලයින් 1000 කට 160 සහ එච් 5 ප්‍රදේශයේ පුද්ගලයින් 1000 කට 640 පමණ විය.

7. රැකියාවන් සහ එහි ව්‍යුහාත්මක අංග පිළිබඳව සැලකීමේදී රැකියාවන්හි විරල භාවයක් සහ ඒවායේ විවිධත්වයෙන් තොර බවත්ද කැපී පෙනුනි. මුළු ශ්‍රම හමුදාවෙන් 80% තරම් විශාල ප්‍රමාණයක් කෘෂිකාර්මික අංශය සමග මූලික සම්බන්ධතාවයක් දක්වයි. බොහෝවිට මොවුන් කුඩා ඉඩම් හිමියන් අඳ ගොවියන් කෘෂිකාර්මික කුලී කරුවන් වශයෙන් යෙදී ඇත. මුළු ශ්‍රම හමුදාවෙන් 6% ක ප්‍රමාණයක් රජයේ සේවාවන්හි නියැලී සිටිති. මෙය පළාතේ ස්ථිර ආදායම් මාර්ග අතරින් වැදගත් ස්ථානයක් ගනී.

8. කර්මාන්ත ක්ෂේත්‍රයට හා සේවාවලට අදාළ අංශවල විරල බව හේතුවෙන් කෘෂිකාර්මික නොවන අංශයේ රැකියා අවස්ථාවන් ඉතාමත් පහත් මට්ටමක පවතී. මෙම තත්වය ඇති වීමට පදනම් වී ඇති වැදගත් මූලික හේතු අතුරින් දෙකක් ලෙස, කුඹුරු ගොවිතැනට පළාත් වාසීන් ලබාදී ඇති ප්‍රමුඛත්වයක් කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය හිඟකමත් දැක්විය හැක.

කෙසේ වුවද ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා දැනට යෝජනා කොට ඇති සංවර්ධන යෝජනා ක්‍රමයට සම්බන්ධ බෝග විවිධාංගකරණය සත්ව පාලනය සහ මිරිදිය මසුන් ඇති කිරීම, යනාදී වැඩ පිළිවෙල තුලින් කෘෂිකාර්මික නොවන අංශවලරැකියා අවස්ථාවන් වැඩිවීමක් බලාපොරොත්තු විය හැක. අධ්‍යයන ප්‍රදේශය තුල රැකියා සුලභ කිරීමෙහිලා රජයේ මෙන්ම පුද්ගලික අංශයේ ආයෝජන මගින්ද කෘෂිකාර්මික නොවන අංශය වැඩි දියුණු කිරීමේ වැදගත් කම ඉස්මතු කොට දැක්විය යුතුය.

9. එක් ගොවිපලක වාර්ෂික දළ ආදායම සාමාන්‍යයෙන් රුඃ 5200 පමණ වේ. මේ අනුව ඒක පුද්ගල ආදායම වර්ෂයකට රුඃ 880 කි. ආදායම් බෙදී යාම දැක්වෙන දත්තයන් මගින් පෙන්නුම් කරන පරිදි ගෘහ ඒකකයන්ගෙන්

හරි අඩක් පමණ රු: 3000 කට හෝ ඊට අඩු වාර්ෂික ආදායමක් ලබති. ගෘහ ආදායමෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් කෘෂිකාර්මික නිෂ්පාදනය මත රඳා පවතී. කුලී වැඩ වලින් ලබා ගන්නා ආදායම නිවෙසේ මුළු ආදායමින් 13% ක් පමණ වේ. නිවසේ ආර්ථිකයේ පදනම කුඹුරු ගොවිතැන බව පැහැදිලි කරමින් කුඹුරු වලින් ලැබෙන ආදායම මුළු ආදායමින් 66% පමණ තත්වයක පවතී. නිවසේ මුළු දළ ආදායමින් 30% ක් පමණ හේන් ගොවිතැන් මාර්ගයෙන් ලබා ගන්නා බැවින් මෙය ආදායම් මාර්ග වල වැදගත් කමින් දෙවන ස්ථානය ගනී. කෙසේ වුවද යෝජනා කර ඇති සංවර්ධන වැඩ පිළිවෙලට අනුව ක්‍රමයෙන් කලකින්ම හේන් ගොවිතැන ප්‍රදේශයෙන් තුරන් වී යන බව පැහැදිලි වන නිසා කුඹුරු මෙන්ම ගොඩ ඉඩම්ද නිරන්තරයෙන්ම වගා කිරීමට කටයුතු සැලැස්වීමේ වැදගත් කම අමුතුවෙන් කිවයුතු නොවේ. නිවෙස්වල ආදායම් මාර්ගයක් වශයෙන් ගව, එලු, කුකුල් ආදී සතුන් ඇති කිරීමෙන් ලැබෙන ආදායම ඉතාමත් අඩු තත්වයක පවතී. මෙවැනි ආදායම් මාර්ගයන් බහුල කොට එමගින් නිවසේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු සැලසීම වැදගත් පියවරක් ලෙස දැක්විය හැක.

10. ඉඩමේ ප්‍රමාණය අක්කර 3.5 ට අඩු වූ සියළුම අවස්ථාවල වී ගොවිතැනින් ලද ආදායම, හේන් ගොවිතැනින් ලද ආදායමට වඩා දෙගුණයකට ආසන්න ප්‍රමාණයක් වී ඇත. බිම් ප්‍රමාණය අක්කර 3.5 සිට 4.0 දක්වා අවස්ථාවල වී ගොවිතැනින් ලද ආදායම හේන් ගොවිතැන මෙන් තුන් ගුණයක් බවද පෙනේ. මෙම තත්වය ඇති වීමට ප්‍රධාන හේතු අතර හේන් වලවවන ක්ෂේත්‍ර බෝග සඳහා ස්ථාවර මිලක් නොමැති වීම, මෙන්ම අඩුපාඩු දායක අලෙවි පහසුකම් නිසා ඇතිවන අඩුමිල මට්ටම් වැදගත් වේ. වී වගාවේදී එම නිෂ්පාදන සඳහා සහතික මිලක් මෙන්ම ප්‍රමාණවත් තරම් අලෙවි පහසුකම්ද පවතින බැවින් ලැබිය හැකි ආදායම් මට්ටම්ද ඉහළ තත්වයක පවතී.

11. අධ්‍යයනය ප්‍රදේශය තුළ ඇති පහත සඳහන් ආකාරයේ ඉඩම් භාවිතයක් පවතී.

| | ප්‍රතිශතය | ඇස්තමේන්තු දළ අක්කර ප්‍රමාණය |
|---|---|---|
| කුඹුරු | 39 | 15,717 |
| හේන් | 30 | 12,090 |
| ගෙවතු | 24 | 9,672 |
| වෙනත් | 7 | 2,821 |
| | 100 | 40,300 |

බහුල වශයෙන් පළාතේ කෘෂිකර්මය සමන්විතව ඇත්තේ වැව් හෝ අහස් දියෙන් වගා කෙරෙන කුඹුරු ගොවිතැනත්, හේන් ගොවිතැනත් සම්මිශ්‍රිත වගා රටාවකිනි. බොහෝ විට මෙම කුඹුරු ගම්බද, සුළු වැව් යටතේ පිහිටා ඇත. මෙවැනි වගා රටාවක් වර්ෂා ජලය ලැබීමේ අවිනිශ්චිත තත්වය තුලින් මතුවූ අවදානම් පරිසරයක් තුල ස්ථාවරත්වයක් සපයයි. ගොවිපල ආර්ථිකයට අවශ්‍ය ගොවීන්ගේ වාර්ෂික කෘෂිකාර්මික ආදායමින් භාගයක් පමණ හේන් ගොවිතැනින් ලබා ගන්නා අතර, මුදල් ලබා ගැනීමේ මාර්ගයක් වශයෙන් වී ගොවිතැනට වඩා හේන් ගොවිතැන කෙරෙහි ගොවියා වැඩි විශ්වාසයක් තබා ඇත. අධ්‍යයන කළ ගොවිපල වලින් ආදායම් ලබා ගැනීමේ එකම මාර්ගය ලෙස ගොවිතැන ගැන පමණක් විශ්වාසය තබා ඇත්තේ දහයෙන් එකක් පමණ වන සුළු පිරිසක් වීමද මෙයට අදාළ විශේෂ ලක්ෂණයකි. ගොවිතැනේදී දක්නට ලැබෙන අස්ථිර නිෂ්පාදන තත්වය එයට හේතු වී ඇති බවය. මෙයින්ද පෙනී යන්නේ දැනට පවත්නා තත්වයන් යටතේ ජීවනෝපාය සලසා ගැනීම සඳහා ගොවීන්ට කුඹුරු ගොවිතැන පමණක්ම ප්‍රමාණවත් නොවන බවයි.

12. අධ්‍යයන ප්‍රදේශය තුළ පුරාණ ගම්මාන 160 ක් පමණ අඩංගු වේ. කුටුම්භ වලින් අඩකට ආසන්න සංඛ්‍යාවකට තමාටම අයිති කෘෂිකාර්මික ඉඩම් නො මැති බව දත්තයන්ගෙන් හෙළි වෙයි. අධ්‍යයන ප්‍රදේශය කෘෂිකාර්මික ප්‍රදේශයක් වන නිසා මෙවැනි තත්වයක් ඇතිවීම අසාමාන්‍ය තත්වයක් බව

පෙනී යයි. ඉඩම් අයිතිය අහිමි මෙවැනි තත්වයක් මේ අයුරින් ඉහළ අනුපාතයකින් තවමටම අයිති ඉඩම් නොමැති කුටුම්භ පැවතීමට එක් මූලික හේතුවක් වශයෙන් පළාතට අලුතින් පැමිණි සංක්‍රමිකයන්ගේ පදිංචිය දැක්විය හැකිය. ප්‍රදේශයේ අනාගතයේ ඇතිවන සංවර්ධන කටයුතු වලින් ප්‍රයෝජන ලැබීමේ මහා බලාපොරොත්තු ඇතිව බොහෝ විට නීත්‍යානුකූල අයිතියක් ප්‍රකාශ කළ නොහැකි ඉඩම්වල පදිංචිව සිටින අය වෙති. තවද ජනගහණයේ වැඩිවීම මෙන්ම අවට ප්‍රදේශයේ භූමි ප්‍රමාණයෙන් වැඩි කොටසක්ම රජයේ ආරක්ෂිත කැලෑ සඳහා වෙන්කොට තිබීමද මෙයට හේතුවක්වශයෙන් දැක්විය හැක.

ගොවීන් විසින් අයිතිය ප්‍රකාශ කර ඇති ඉඩම් ප්‍රධාන වශයෙන් අනවසරයෙන් අල්ලා ගත් රජයේ ඉඩම් වන අතර වගා කරනු ලබන භූමි ප්‍රමාණයෙන් පහෙන් දෙකක් මෙම වර්ගයට අයත් වේ. මෙම ඉඩම් වල ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ හේන් ගොවිතැනය. තවමටම අයත් කෘෂිකාර්මික ඉඩම් අයිතිව තිබීම දක්නට ලැබෙන්නේ වගාකල ලබන ඉඩම් ප්‍රමාණයෙන් 30% පමණ ප්‍රමාණයක් පමණක් වේ. පුරාණ ගම්වල පිහිටි මඩ ඉඩම් සහ ගෙවතු මූලික වශයෙන් මෙම ඉඩම් වලට අයත් වේ. කුඹුරු ඉඩම් බද්දට දීම බහුලවන අතර වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් හතරෙන් පංගුවක් කිසියම් බදු ක්‍රමයක් යටතේ පවතී. මෙම කුඹුරු සඳහා අඳ කුලී වශයෙන් අස්වැන්නෙන් භාගයක් ඉඩම් හිමියාට දෙනු ලැබේ. මෙවැනි ඉහළ බද්දක් ගෙවීම ප්‍රධාන ලෙස මඩ ඉඩම් සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම මගින් පැහැදිලි කළ හැකිය. භූමි ප්‍රමාණය අනුව බලන කළ අධ්‍යයන ප්‍රදේශය තුළ ඉඩම් හිඟ බවක් ඇතත් ගම්බද වැව් වලින් ස්ථිර ජල සැපයුමක් ලබන මඩ ඉඩම් ඇත්තේ මද වශයෙනි.

13. යෝජිත ඉඩම් බෙදා දීම යටතේ ජනපදික පවුලක් සඳහා වාරි පහසුකම් ලබන ඉඩම් අක්කර 2.5 ක් සහ ගෙවත්ත සඳහා අක්කර භාගයක් බෙදා දීමේදී දැනටමත් ඉඩම් ඇති නිවෙස් වලින් 10% පමණකට අයිතිව ඇති ඉඩම් වලින් හරි අඩක් පමණ අහිමි වනු ඇත.

14. ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හා අදාල ඉදිකිරීම් ව්‍යාපාරවල නිරත වී සිටින විවිධ මට්ටමේ පුද්ගලයන්ගේ පරස්පර විරෝධී උපදේශයන් නිසා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන කටයුතු කෙරෙහි පුරාණ ගම් වල ජනතාව අවිනිශ්චිත හා සැකමුසු ආකල්පයක් දක්වන බව අනාවරණය වේ. එමෙන්ම ප්‍රදේශයේ දැනට පවතින පැරණි සමාජ ක්‍රමයන්ද අභාවයට යා නොදී එක ගනිමින් ඉදිරියට ගෙන යාමට බොහෝ ගම් වැසියන් කැමැත්තක් දක්වති. මෙවැනි අසතුටුදායක තත්වයක් මඟ හරවා සංවර්ධන ව්‍යාපාරය කෙරෙහි පළාතේ ජනතාවගේ නොයෙක් සාධකයන්ගේ බලපෑම නිසා යම් තරමකින් ආකල්ප වැඩි දියුණු තත්වයකට ගෙන ඒම සඳහා ගත යුතු පියවරවල් කිහිපයක් මෙහි ලා දැක්විය හැක. මේවා අතරින් වැදගත් ඒවා ලෙස, කාර්යක්ෂම නිලධාරීන් ප්‍රදේශයට පැමිණ වැසියන්ගේ දුක් ගැනවිලි වලට ඇහුම් කම් දීම හා ඒ ගැන සාකච්ඡා කිරීමත්, මෙසේ පැවති නොයෙක් ගැටලු නිරාකරණය කිරීමට පියවර ගැනීමත් සඳහන් කළ හැක. එමෙන්ම ගුවන් විදුලිය මගින් ප්‍රචාරය වන ගම්වාසීන් හා නිලධාරීන් අතර වන සංවාද මගින්ද මෙවැනි වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කළ හැක. ජනපදිකයන් හෝ‌රා ගැනීමේදී අවට ගම් වාසීන් පළාතේ දැනට ඇති අනවසර පදිංචි කරුවන් යනාදීන්ට විශේෂ තැනක් දීමද මේ සඳහා අධාරෝපකාරී විය හැක.

15. වාරිමාර්ග පහසුකම් අතින් සලකා බලන විට පළාතේ දැනට ඇති කුඹුරු ඉඩම් අඩු දියුණු තත්වයක පවතී. සංවර්ධන කලාප අංක 5 තුල කුඹුරුවල ඉතා හොඳ ජල සැපයුම් තත්වයක් ඇතත් ප්‍රදේශ අංක 7 සහ 8 තුලඇත්තේ දුර්වල වාරිමාර්ග යටතේ කෙරෙන ප්‍රමාණවත් නොවූ ජල සැපයුමකි. ජල සැපයුමේ ඇති මෙම ගුණාත්මක වෙනස පහත දැක්වෙන වගා සූක්ෂමතාවයන් මගින් පෙන්නුම් කරයි. මෙම වගා සූක්ෂමතාවයන් මූලික ලෝක බැංකු වාර්තාවේ දක්වා ඇති ඇස්තමේන්තු වලට වඩා පහළ අගයක් ගනී.

| සංවර්ධන ප්‍රදේශ | වගා සුක්ෂමතාවය | | |
|---|---|---|---|
| | යල% | මහ% | වාර්ෂික% |
| 5 | 58 | 84 | 142 |
| 6 | 37 | 59 | 96 |
| 7 | 27 | 89 | 116 |
| 8 | 16 | 88 | 103 |
| සියළු ප්‍රදේශ | 39 | 81 | 120 |

යල කන්නය තුලදී දක්නට ලැබෙන පහත් වගා සූක්ෂමතා දර්ශනය මගින් දැක්වෙන පරිදි අස්වැද්දුම් කරන ලද බිම් ප්‍රමාණයෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් අවුරුද්දේ මාස හයකට වැඩි කාල සීමාවක් තුල පුරන්ව පවතින බැව් පෙනේ. මේ අනුව ගොවිතැනින් ලැබෙන ආදායම පහත් මට්ටමක පැවතිය හැකි බව අමුතුවෙන් කිව යුතු නො වේ.

16. වී වගාව සඳහා මහ කන්නයේදී ලැබෙන වර්ෂාව එතරම් වලදායි ලෙස ප්‍රයෝජනයට නොගනී. ගොවීන්ගෙන් හරි අඩකටත් වඩා කුඹුරු බිම් සකස් කිරීම ආරම්භ කර තිබුනේ ප්‍රථම වරට ජලය නිකුත් කිරීමෙන් පසුවයි. දැනට පවතින තත්වයට අනුව මහ කන්නයේදී ඇතිවන පළමු වර්ෂාව හා කුඹුරු බිම් සකස් කිරීම ආරම්භය අතර සති කිහිපයක කාලා න්තරයක් ඇතිවේ. මෙවැනි පමාවීමක ප්‍රතිඵලයක් වශයෙන් මාස් වැස්සෙන් කුඹුරු ගො විතැන සඳහා යොදා ගත හැකි වැසි ජල ප්‍රමාණයෙන් වැඩි කොටසක් අපතේ යාමක් ඇතිවේ. වැසි ජලයෙන් උපරිම ප්‍රයෝජනයක් ගැනීම සඳහා වර්ෂාව ලැබීමට පෙර බිම් සකස් කිරීම වඩා උචිත වුවද ගොවීන් කල්වේලා ඇතිව බිම් සකස් කර නොගැනීමට හේතු සාධක කිහිපයක් දැක්විය හැක.

(I) ස්ථිර බලාපොරොත්තු තැබිය නො හැකි ජල සැපයුම නිසා කලින් කරන වගා කටයුතු පිළිබඳව අවදානමක් ඇති බව.

(II) යල් කන්නය අවසාන වීමත් සමග ඇතිවන තද හා වියලි පස් සහිත භූමිය, ජලය නො මැතිව සකස් කිරීමට අපහසු බව.

(III) ට්‍රැක්ටර් මී හරක් වැනි ගොවිපල බල ඒකකයක් ලබාගැනීමට ඇති අපහසුතාවය.

(IV) මහ කන්නයේ ආරම්භක කාල සීමාවේදී පවුල් ශ්‍රමය හේන් වගා කටයුතු වල යෙදී සිටීම.

කාර්යක්ෂම ලෙස ජලය පාවිච්චි කිරීම සඳහාත් උසස් වගා සූක්ෂම භාවයන් ලබා ගැනීම සඳහාත් කුඹුරු ඉඩම්, මාස් වැසි ලැබීමට පෙර එනම් වියලි තත්වයක් යටතේ බිම සූදානම් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. මෙම වැසි ආරම්භයත් සමග බිම වැපිරීම කල හැකි වන අතර වැසි ජලය අපතේ යාමක් ඇති නො වේ. මෙවැනි වැඩ පිළිවෙලක්, පළාතේ කුඹුරු ඉඩම් හිමියන් අතර යො දා ගැනීමේදී ඇතිබාධක වශයෙන් එයට සුදුසු උපකරණ සකස්කොට ගො වීන්ට ඉදිරිපත් කිරීමට ප්‍රමුඛස්ථානයක් දිය යුතුය.

17. වර්තමානයේදී අධ්‍යයන ප්‍රදේශය තුල ට්‍රැක්ටර් හා මීහරක් යන ගොවිපල බල මාධ්‍යයන් දෙකම එක සමාන වැදගත් ආකාරයකින් භාවිතා [illegible] අතර ඉන් 80% ක් පමණ කුලියට ලබා ගනිති. ට්‍රැක්ටර් භාවිතා කිරීමේදී සාමාන්‍යයෙන් දෙවරක් (පළමුහිය හා දෙවනහිය) සී සෑම සඳහා අක්කර 1 ට රුපියල් 160/- ක් පමණ වැයවන අතර මී හරක් භාවිතා කිරීමේදී මී හරක් බානක් සඳහා දිනකට ගාස්තුව රුපියල් විස්සකි. මී හරකුන් දැක්කීම සඳහාද කුලියට මිනිසුන් යොදවා ගතයුතු බැවින්, වියදම අතින් සලකා බලන විට මෙම බල මාධ්‍යයන් දෙකම එක සමාන වන බව පෙනී යයි. දැනට මෙම ප්‍රදේශයේ ඇති ට්‍රැක්ටර් ප්‍රමාණය මෙන්ම මීහරක් සංඛ්‍යාවද ඉතාමත් අල්ප වන බැවින් මෙම අංශයේ සැපයුම වැඩි කිරීම අත්‍යාවශ්‍ය කාර්‍යයක් බව පෙනී යයි.

කෙසේ වුවද අනාගතයේදී පොල් මිල මෙන්ම ට්‍රැක්ටර් මිලද ඉහල යාමට නැඹුරුතාවයක් දක්වන බැවින් මෙවැනි යාන්ත්‍රික ගොවිපල

බලයන් කෙරෙහි තව දුරටත් රැඳී සිටීම නුසුදුසු තත්වයක් වේ. මේ සඳහා සුදුසු විකල්ප ක්‍රියා මාර්ගයක් ලෙස මීහරක් ඇති කිරීමේ කාර්‍යය දැක්විය හැක. මෙම තත්වය යටතේ ඉදිරි කාලයේදී තමාගේ කටයුතු වලට අවශ්‍ය මී හරකුන් තමන්ම ඇතිකර ගැනීම අවශ්‍ය වුවද ඒ සඳහා බාධක වන කරුණු කීපයක් ඇත. මේ අතරින් වැදගත් වන්නේ, ගෙවත්ත අක්කර 1/2 ක පමණ කුඩා එකක් වීම, උලා කෑමට ඇති තණ පිට්ටනි හිඟකමත්, වතුර වලවල් අතින් ප්‍රදේශය තුල ඇති හිඟකමත් ය. පැරණි ක්‍රමයට මී හරක් රංචු වශයෙන් නිදැල්ලේ ඇති කිරීමද අපහසු කරුණක් වන බැවින් මේ සඳහා ඇති එකම පිළියම වන්නේ තම ගෙවත්ත තුළ සුළු වශයෙන් හෝ මී හරකුන් ඇති කරවීමට ඉඩකඩ සලසා ගැනීමයි.

විශේෂයෙන් බිම් සකස් කිරීම ආදී කාර්‍යයන් අනුව සලකා බලන විට, එම කටයුතු හැකි ඉක්මනින් අවසන් කර ගැනීම වී ගොවිතැනේදී වැදගත් වන කරුණකි. මෙහිදී වාරිමාර්ග යෝජනාක්‍රම මගින් ලැබෙන ජලයද පිරිමසා ගනිමින්, අදාළ කටයුතු කෙටි කාලයකදී හමාර කර ගැනීමට ගොවීහු පොදු සම්මුතියකට එළඹෙන බැවින් සෑම ගොවියෙකුම එම කටයුතු එකම කාලසීමාවකදී නිම කිරීමට උත්සාහ ගැනීමෙන් ගොවිපල බලය සපයා ගැනීමේදී ප්‍රශ්න මතු විය හැක.

දැනට මෙම ප්‍රදේශයේ මීහරක්, රෝද 2 ට්‍රැක්ටර් හා රෝද 4 ට්‍රැක්ටර් යන තුන් ආකාර බල මාධ්‍යයන් යොදා ගැනේ. මෙම තුන් වර්ගය එකිනෙකින් වෙනස් වන්නේ මූලික ප්‍රාග්ධනය හා නඩත්තු වියදම් අතින් පමණක් නොව, විදේශ විනිමය හා දේශීය පිරිවැය මෙන්ම ඒවායේ නිෂ්පාදන ධාරිතාවයද අතිනි. මේ අනුව කුඩා ගොවිපලවල් සඳහා අවශ්‍ය බල මාධ්‍යයන් සැලසුම් කිරීමේදී ඉහත කී අංගයන් ගැනද සැලකිලිමත් වීම වැදගත් වේ.

18. අධ්‍යයනයට භාජනය වූ ගොවිපලවල් අතුරෙන් 90% ක්ම වැඩි අස්වනු ලබා දෙන බී.ජී. කාණ්ඩයේ වී වර්ග භාවිතා කළහ. කුඹුරු ඉඩම් වල පුළුල් වශයෙන් පැතිරුණු නවීන ශිල්පීය ක්‍රමයක් වශයෙන් සැලකිය හැක්කේ මෙය පමණි. කෙසේ වුවද සංවර්ධන ප්‍රදේශ අංක 5 තුළ නියමාකාර ජල සැපයුම් තත්වයක් යටතේ පැල සිටුවීම, පොහොර භාවිතය වැනි සම්ප්‍රදායික වගා ක්‍රමයන්ද භාවිතා කෙරින. මෙම ප්‍රදේශයේ වී වගා කළ බිම් ප්‍රමාණයෙන් 80% ක පමණ පොහොර භාවිතා කළ අතර මෙය ප්‍රදේශ අංක 8 තුළ අඩු වර්ෂාපතන තත්වයක් යටතේවූ පොහොර භාවිතය 23% හා සසඳන විට ඉහල අගයක් වේ. නියමාකාර ජල සැපයුම් තත්වයක් යටතේ ප්‍රදේශ අංක 5 තුළ සම්පූර්ණ පොහොර මිශ්‍රණය භාවිතා කෙරිනි. වර්ෂාපතන තත්වය යටතේ ප්‍රධාන වශයෙන් මතුපිට පොහොර ලෙස යොදන ලද්දේ යූරියා මිශ්‍රණයයි. අක්කර 1 ක් සඳහා යොදන ලද පොහොර ප්‍රමාණය හොණ්ඩර හොණ්ඩර 1.3 ක් වූ අතර එය අක්කරයක් සඳහා අනුමත පොහොර ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් විය. ජල සැපයුම ආදී අවදානම් තත්වයට මුහුණ දීම පිණිස ගොවියන් විසින් සකස් කරගත් ශිල්ප ක්‍රමයන් භාවිතා වීම නිසා මෙසේ දියුණු වගා ක්‍රම භාවිතාවේ වෙනස්කම් සිදුවීමට ඉඩ ඇත. කෙසේ වෙතත් වාරිමාර්ග පහසුකම් මනා ලෙස සැපයීමෙන් පසු මෙම කාල ගුණික තත්වයන් කෙරෙහි ඇති අවදානමට උපරිම අත්දැකීම් ගොවීන්ට මුහුණ දීමට හැකිවනු ඇත. කාලීන යෙදවුම් ලබා දීමේ ක්‍රමයක් යටතේ කෘෂි කාර්මික අධ්‍යාපනයක් ලබා දීමෙන් කුඹුරු සඳහා පාරම්පරික වගා විධි භාවිතා කරවීම අපහසු නො වන බව සලකා බලන ලද කුඹුරු වල කෘෂිකාර්මික සංවර්ධනය ඇති කරවීම ආශ්‍රයෙන් දැනගත හැක.

19. මහ කන්නයේ වී වගාව සඳහා අක්කරයක සාමාන්‍ය මුදල්මය වියදම රුපියල් 450/- ක් වූ අතර මෙය පොළොන්නරුව වැනි ප්‍රදේශයක ඇති මුදල් වියදමෙන් භාගයකටත් වඩා අඩු ප්‍රමාණයක් වේ. පාරම්පරික වගා ක්‍රමයන්ට අනුව යෙදවුම් මිලදී ගැනීම ඉතා අඩු මට්ටමක සිදු වීම මෙයට බල පෑ හේතුව විය හැක. වාරිමාර්ග ජල සැපයුම් හිඟ තත්වය මත ඇතිවූ අවිනිශ්චිත භාවය නිසා කුලී ශ්‍රමය හා මුදල්මය යෙදවුම් සඳහා ඇති පහත් මට්ටමේ ආයෝජනය ප්‍රදේශයේ වගා කටයුතු වලදී පුළුල් වශයෙන් දැකගත හැකි විය.

20. වී වගාව ආශ්‍රයෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණයක් නම් ශ්‍රම භාවිතයේ ඇති පහත් මට්ටම යි. පොළොන්නරුව වැනි ප්‍රදේශයක අක්කරයක් සඳහා භාවිතා කළ මිනිස් දින 92 හා සසඳන විට මෙම ප්‍රදේශයේ භාවිතා කර ඇත්තේ අක්කර 1 ට මිනිස් දින 50 ක ප්‍රමාණයකි. අනෙක් ප්‍රදේශවලට වඩා සංවර්ධක ප්‍රදේශ අංක 5 තුළ ප්‍රමාණවත්වාරි මාර්ග පහසුකම් නො වීම වැඩිපුර ශ්‍රම භාවිතයක්කිරීමට තිබූ අවස්ථාවන් සීමාවීමට හේතු විය. මෙයට බලපාන තවත් හේතුවක් නම් අද ගොවිතැන් ක්‍රමය විශාල වශයෙන් භාවිතා කිරීමයි. වර්ෂාපෝෂිත පරිසරයක පවත්නා ඉඩම් භුක්ති ක්‍රමයන්ද උසස් ශ්‍රම භාවිතයකට ඇති අවස්ථාවන් අඩු කර ඇත. පවුල් ශ්‍රමය යොදාගෙන ගොවිතැන්කටයුතු මෙහෙයවීමේදී වැයවෙන ශ්‍රම ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් පමණ තම පවුලෙන්ම ලැබෙන බව දත්ත මගින් පැහැදිලි වේ. ගෙයේ වෙනත් සලකා බලන අක්කර 40,000 ක් වූ කෘෂිසංවර්ධන ප්‍රදේශයේ නිෂ්පාදන කටයුතු ආශ්‍රයෙන් වර්තමානයේ පවතින ප්‍රධාන බාධකයන් වන්නේ ජලය සපයා ගැනීමේ අපහසුව හා ඉඩම් භුක්තිය ආශ්‍රිතව ඇති ගැටලු සහිත තත්වයන්ය. මෙවැනි තත්වයක් යටතේ උසස් මට්ටමින් ශ්‍රම භාවිතයක් කරමින් වැඩිපුර බිම් ප්‍රමාණයක් වගා කටයුතු සඳහා භාවිතා කිරීම නො කළ හැකි දෙයක් මෙන්ම එය ව්‍යාපාරයේ ආයෝජන පිරිවැය පියවා ගැනීම සම්බන්ධයෙන්ද අත්‍යාවශ්‍ය කරුණක් වේ. ශ්‍රමය සඳහා ඇති ඉල්ලුමේ විශාල වැඩිවීමක් ඇතිවුවහොත් එය බොහෝ විට ලබා ගැනෙනුයේ ව්‍යාපාර ප්‍රදේශයෙන් පිටස්තර වශයෙනි. මෙම පිටස්තර කුලී ශ්‍රමය වර්තමානයේ මෙම ප්‍රදේශයේ කෘෂි කර්ම සංවර්ධනය සම්බන්ධයෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. මේ නිසා මෙම ප්‍රදේශයේ නාගරික මධ්‍යස්ථාන හා ග්‍රාමීය සේවා මධ්‍යස්ථාන සැලසුම් කිරීමේදී මෙම සංක්‍රමණික ශ්‍රමයට අවශ්‍ය පහසුකම් සැලසීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. ඇතැම් විට මෙම ශ්‍රමිකයන් සඳහා ගොවිපලවල් තුළම කාලීන වශයෙන් නවාතැන් පහසුකම් සැලසීමට ද හැකියාවක් ඇත.

21. අධ්‍යයන ප්‍රදේශය තුළ තිබූ ගොඩ ඉඩම් පුළුල් වශයෙන් හේන් ගොවිතැන සඳහා යොදා ගනු ලැබීය. වර්තමානයේදී වගාකරනු ලබන හේන්වලින් 80% ක් පමණ අවුරුදු දෙකක තුනක තරම් කෙටි කාලපරිච්ඡේදයකට ඇතුළත් වේ. මෙම ඉඩම්වල බහුල වශයෙන් වගා කරනු ලබන භෝග අතර මිරිස් පළමු ස්ථානයද තව්පි දෙවන ස්ථානයද ලබා ගනී. හේන් වගා වලින් ලැබෙන මුදල් ආදායම සලකා බලන විට වී ගොවිතැනින් ලැබෙන පහත් කරුණක් වේ. ආදායම අනුව එය [illegible] ජල සැපයුම් තත්වයක් යටතේ කරනු ලබන වී ගොවිතැන් කටයුතුවල ඇති අවදානම් සහිත තත්වය නිසා මෙසේ ගොවීන් වැඩි වශයෙන් හේන් ගොවිතැනට සම්බන්ධවීමට හේතු වේ.

එච් 4 හා එච් 5 ප්‍රදේශවලට වාරිජල පහසුකම් ලැබීමත් ඒවා සංවර්ධිත තත්වයට පත් වීමෙන් පසු දැනට මෙහි සිදුවන හේන් වගා කටයුතු වලට අවශ්‍ය ඉඩම් නුදුරු කාලයේදීම නැතිවී යනු ඇත. කෙසේ වුවද ගොවීන් තදින්ම සම්බන්ධ වී සිටින මෙම හේන් ගොවිතැනින් ඔවුන් ඉවත් කරවීම අපහසු කාර්යයක් වනු ඇත. මේ සඳහා පර්යේෂණ ව්‍යාප්ති හා සැලසුම් කරුවන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය. ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනයට අවශ්‍ය වාරිමාර්ග පහසුකම් සැලසීමද වැදගත් කරුණක් වේ. මේ අනුව ව්‍යාප්ති නිලධාරීන් විසින් ගොවීන්ගේ හැකියාවන් හා පසුගිය අත්දැකීම් අලුත් ගොවිතැන් ක්‍රම සඳහා ඇති ඔවුන්ගේ ආකල්ප අවදානම දැරීමේ ශක්තිය හා අනෙකුත් සීමාවන් දැන හඳුනා ගත යුතුය. වර්ෂා ජලයෙන් ක්ෂේත්‍ර භෝග වගා කරනු ලබන එච් 4 එච් 5 ප්‍රදේශවල හේන් ගොවීන් සම්බන්ධයෙන් මෙය ඉතා අවශ්‍ය තත්වයක් වේ. වාරිමාර්ග සැපයුම් තත්වය යටතේ අතිරේක භෝග වගා කිරීම මෙම ප්‍රදේශයේ ගොවීන්ට අලුත් අත්දැකීමක් වන නිසා ව්‍යාප්ති නිලධාරීන්ට අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම විශාල වගකීම් සහිත කාර්යයක් වේ. මෙහිදී පළමුව මෙම අතිරේක භෝග නිෂ්පාදනය නිසා ගොවීන්ට ලැබෙන ආර්ථික සහනාධාර පිළිබඳව වැටහීමක් ලබා දීමත් දෙවනුව වාරිමාර්ග සම්පාදිත බිම් සඳහා අලුත් වගා ක්‍රම භාවිතා කිරීම පිළිබඳව දැනුමක් හා අවබෝධයක් ලබා දීමත් කළ යුතු වේ. එබැවින් මේ පිළිබඳව විශාල ව්‍යාප්ත සේවයක් සඳහා අදාළ අංශයේ

LIBRARY
HARTI
22126

විශේෂඥයින්ගේ විශාල උනන්දුවක් මේ පිළිබඳව ඇති කරවිය යුතුය. එසේ වුවද ව්‍යාප්ති වැඩ පිළිවෙළේ සාර්ථක භාවය රඳා සිටීමට යෙදවුම් සැපයීම, ණය පහසුකම් හා අලෙවි මාර්ගයන්ගේද සම්බන්ධතාවය අවශ්‍ය වේ.

ගව කුකුළු ආදී සතුන් ඇති කිරීම මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන්නේ සුළු වශයෙනි. ගොවිපල බලය සපයා ගැනීම සම්බන්ධයෙන් මීහරක් ඇති කෙරෙන්නේද ඉතා සීමිත ප්‍රමාණයකිනි. මෙම ප්‍රදේශයේ සත්ව පාලන කටයුතු වැඩි දියුණු කිරීම එක් අංගයක් වශයෙන් වැදගත් වේ. සත්වපාලන කටයුතු සම්බන්ධයෙන් සෑහෙන අවබෝධයක් මෙම ප්‍රදේශයේ ඇති කරවීමත් මේ සඳහා අදාල ව්‍යාප්ති සේවාවන් සමඟ අලෙවි පහසුකම් සැලසීමත් අවශ්‍ය කරුණු වේ.

22. යල මහ කන්න දෙක තුල අධ්‍යයන ප්‍රදේශයේ අක්කරයකට ලැබුණ අස්වැන්න පහත සඳහන් වේ.

| | අක්කර 1කට ලැබුණු බුසල් ප්‍රමාණයේ සාමාන්‍යය | සම්මත දෝෂය | 95% විශ්වාස ප්‍රාන්තරය |
|---|---|---|---|
| 1977/78 මහ | 53 | 1.7 | 50 - 57 |
| 1977 යල | 42 | 1.9 | 38 - 46 |

මහ කන්නය තුලදී වර්ෂාපතනයේ ඇති අඩුකම නිසා, වර්ෂාපෝෂිත වැව් යටතේ වගා කල කුඹුරුවලින් ලැබී ඇත්තේ අඩු අස්වැන්නකි. මේ අනුව සංවර්ධන ප්‍රදේශ හතර තුල අස්වනු ප්‍රමාණයේ සාමාන්‍යයන්හි පැහැදිලි වෙනසක් දැකිය නොහැක. කලින් සඳහන් කල පරිදි වාරිමාර්ග සැපයීමේ වෙනස්කම් මත ප්‍රදේශාන්තර වෙනස්කම් දක්නට ලැබුණත් හොඳින් ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් ලැබෙන විට එවැනි

තත්වයක් දක්නට නොලැබේ. යල කන්නයේ අංග 8 ප්‍රදේශයෙන් අක්කරයකට බුසල් 29 ක තරම් අඩු අස්වැන්නක් ලැබුණු අතර මෙම කන්නය තුළදී අස්වැන්න අතින් ප්‍රදේශාන්තර වෙනස්කම් බහුල වශයෙන් දක්නට ලැබිණ.

වී අස්වැන්න වැඩි කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් පොහොර භාවිතය වැදගත් වන බව දත්ත ආශ්‍රයෙන් පැහැදිලි වේ. අක්කර 1 කට හොන්ඩර 1.3 ක් භාවිතා කළ කුඹුරු වල පොහොර භාවිතා නොකළ කුඹුරු වලට වඩා බුසල් 12.5 ක අස්වැන්නක් ලැබී තිබිණ. මේ අනුව වී නිෂ්පාදනයේ ඇති පහත් මට්ටම නැති කිරීම සඳහා ඇති වැදගත් විසඳුමක් වශයෙන් පොහොර භාවිතය වැඩි දියුණු කිරීම දැක්විය හැක. රජය විසින් පොහොර කලට වේලාවට ලබා දීම වැදගත් වේ. එමෙන්ම ගොවීන්ට අවශ්‍ය ගොවිපල බලය, නිෂ්පාදන උපකරණ ආදිය කලට වේලාවට සැපයීමත් සමඟ හොඳ වාරිමාර්ග පහසුකම් මත අලුත් නිෂ්පාදන ක්‍රම හඳුන්වා දීමෙන් මහ කන්නයේදී අක්කරයකට බුසල් 80 ක් පමණ ලබා ගත හැකිවනු ඇත.

23. අලෙවි කටයුතු ආශ්‍රයෙන් බලන විට පසුව විකිණීම සඳහා ඉතා සුළු ප්‍රමාණයක් තබාගෙන අස්වනු නෙළූ විගසම තම අස්වැන්න අලෙවි කිරීම සාමාන්‍ය සිරිතක් වේ. වී සඳහා සහතික මිලක් තිබීම නිසා පසු අවස්ථාවකදී ඉහළ මිලක් ලබා ගැනීමේ අරමුණෙන් වී විකිණීම කල් දැමීම අවශ්‍ය නොවේ. එම නිසා අස්වනු නෙළීමේ උච්චතම කාල සීමාව තුළදී වී මිලදී ගැනීම සම්බන්ධව ගමනාගමන හා අලෙවි පහසුකම් සැලැස්වීම වැදගත් ක්‍රියා මාර්ගයකි. දැනට එච් 5 ප්‍රදේශයේ වී ගබඩාවක් නොමැති අතර එච් 4 ප්‍රදේශයේ වී ගබඩාවන්ද ප්‍රදේශයේ නිෂ්පාදන පරිමාවට අනුව ප්‍රමාණවත් නොවේ.

වී හැර අනෙකුත් අතිරේක කෘෂි භෝග නිෂ්පාදනයන් අලෙවි කිරීමේ ප්‍රධාන මාර්ගය වශයෙන් පවතින්නේ පොළවල්ය. ප්‍රදේශ

අංක 6 දළ සැලසුම් 5ත් ඇතුලත පොලවල් 6 ක් පිහිටා ඇත.

වර්තමානයේදී මුදල්දපයන හේන් භෝග අතුරින් වම්බටු වගාව ප්‍රධාන වේ. මෙම භෝගය විශාල වශයෙන් වගා කිරීම නිසා ලැබෙන අස්වනු ප්‍රමාණය විකුණා ගැනීමේදී නොයෙක් විදියේ ප්‍රශ්න මතු වේ. සාමාන්‍යයෙන් මෙය කල්තබා ගත නොහැකි භෝගයක් නිසා මිළ අඩු අවස්ථාවල දී වුවද එය විකිණීමට ගොවීන්ට සිදු වී ඇත. මෙවැනි භෝග සඳහා සහතික මිළ ක්‍රමයක් නො මැති වීම මෙම ගොවීන් මුහුණ දී ඇති ප්‍රශ්නයකි.

භෝග සඳහා ස්ථිර මිළ ක්‍රමයක් නො මැති වීමත් එම භෝග නො කඩවා වෙළඳපලට ඉදිරිපත් කිරීමට නො හැකි වීමත්, එම භෝග සඳහා ගොවීන්ට ලැබෙන පහත් මිලට අමතරව එම නිෂ්පාදනවල මිළ උච්චාවචන යන්ට ද හේතු වී ඇත. මෙම අතිරේක භෝග සඳහා ගොවීන් උනන්දු කරවීමට නම් මේ සඳහා ස්ථිර මිළ මට්ටමක් සමග අලෙවි පහසුකම් සැලසීම වැදගත් වේ.

24. ක්ෂේත්‍ර දින, පුහුණු පන්ති, වැනි පාරම්පරික ව්‍යාප්ති සේවා වන් වල වැදගත්කම ඉතා අඩු බව පුද්ගලික වශයෙන් උපදෙස් ලබා දීම මගින් සිදුවන ව්‍යාප්ති සේවා හා සසඳා බලන විට පැහැදිලි වේ. මෙම පාරම්පරික ව්‍යාප්ති ක්‍රම පිළිබඳව ගොවීන් දක්වන වැඩි සැලකිල්ල නිසා මෙම ක්‍රම ඉවත් කිරීම හෝ ඒ සඳහා අඩු සැලකිල්ලක් නොදක්වෙන අයුරින් එයට අදාල ඉදිරි පියවරක් ගත යුතුය. උදාහරණ වශයෙන් එවැනි ගො විසම්බන්ධීකරණ වැඩ පිළිවෙලක් මගින් ලැබූ ප්‍රතිඵල පහත සඳහන් වේ.

| ගොවි සම්බන්ධීකරණ වැඩපිළිවෙල හඳුන්වා දීමට පෙර පැවති තත්වය | ගොවිසම්බන්ධීකරණ වැඩ පිළිවෙල හඳුන්වාදීමෙන් පසු සිදුවූ ප්‍රතිඵල |
|---|---|
| (අ) පුද්ගලික උපදෙස් | සාමූහික උපදෙස් (අනුගමනය කරන ගොවීන්) (කුඩා කණ්ඩායම් තත්වයේ) |
| (ආ) සාමූහික ව්‍යාප්ති ක්‍රම (පුහුණුපංති, ක්ෂේත්‍ර දින ආදාය) (විශාල හෝ කුඩා කණ්ඩායම්) | සාමූහික ව්‍යප්ති ක්‍රම (පුහුණු පංති, ක්ෂේත්‍ර දින ආදිය) (විශාල හෝ කුඩා කණ්ඩායම්) |
| (ඇ) ජන සංනිවේදන මාධ්‍යය | ජන සංනිවේදන මාධ්‍ය |

කෘෂිකර්ම ව්‍යාප්ති සේවා වැඩ පිළිවෙලක් සඳහා ගුවන් විදුලිය, පුවත්පත් වැනි ජන මාධ්‍යයන් සහභාගි කරවා ගත යුතු අතර, මෙම ගොවීන් තුළ ඇති උසස් මට්ටමේ ලිවීමේ, කියවීමේ හැකියාවද ප්‍රයෝජනයට ගත යුතුය. බොහෝ දියුණු වෙමින් පවතින රටවල තත්වය සමඟ සංසන්දනය කරන විට , ජන සංනිවේදන මාධ්‍යයන් ගොවිජනතාව අතර ඉක්මනින් පැතිර ගියත්, කෘෂිකා ර්මික තොරතුරු ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් මෙය එතරම් ප්‍රතිඵලදායක නොවන බව පෙනේ.

ලිවීමට, කියවීමට හැකි සමාජයක් තුළ, ගුවන්විදුලිය චිත්‍රපට වැනි අනෙකුත් ජන මාධ්‍යයන්ට වඩා මුද්‍රිත ලියකියවිලි වලට වැදගත් ස්ථානයක් හිමිවේ. එය වියදම අතින්ද අඩු වන අතර සංඛ්‍යා ප්‍රස්ථාර සටහන්, නිෂ්පාදනය බෙදා හැරීම්, විමධ්‍ය ගත කිරීම් ආදිය පහසුවෙන් , අවබෝධකරවිය හැකි ක්‍රමයක්ද වේ.

25. කෘෂිකාර්මික ණය සම්බන්ධයෙන් , වැදගත් නිරීක්ෂණ හතරක් වශයෙන් පහත සඳහන් කරුණු දැක්විය හැක.

I. ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය මුදල් සැපයීම සම්බන්ධයෙන් ආයතනික නොවන මාර්ගයන් වැදගත්කමින් අඩුවීම.

II. කලින් ගත් ණය නොපියවූතත්වයක දී වුවද මහ කන්නය සඳහා ණය පහසුකම් සැපයීම.

III. ලබාගත් ණය ප්‍රමාණය අනුව සසඳා බැලීමේදී ගොවීතැන් කටයුතු සඳහා වැය වූ මුදල්මය යෙදවුම් ප්‍රමාණයේ අඩු බව.

IV. දැනට පවතින තත්වය යටතේ ණය ලබා ගැනීම සඳහා ගොවීන් එතරම් උනන්දුවක් නොදැක්වීම.

මීට අමතරව මෙම වාර්තාව විසින් සැලසුම් කරුවන් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය අංශ කීපයක් වෙත යොමු කර ඇත. ඒවායින් සමහරක් නම්; I. ශ්‍රම බලකායෙන් වැඩි කොටසක්ම තරුණ වියේ පසුවීම II. රැකියා අවස්ථාවන්හි විවිධත්වයක් ඇතිකරවීම (මෙය විශේෂයෙන් කෘෂිකාර්මික නොවන අංශය සම්බන්ධයෙන් බලපා ඇත.) III. ප්‍රදේශයේ ඇති පුරාණ ගම්වල ඉඩම් අයිතියේ සිදුවී තිබෙන විශාල ව්‍යුහාත්මක වෙනස්කම් විමසීමකට භාජනය කිරීම. IV. සංවර්ධන කාර්යය නිසා සිදුවිය හැකි සමාජ විපර්යාස V. කුඩා ගොවිපලවල් සඳහා අවශ්‍ය උපකරණ හා සේවා අදාල කාල සීමාවන්ට අනුව අවශ්‍ය ප්‍රමාණයෙන් සැපයීම VI. දිය සීරාවෙන් තොර ඉඩම්වල ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය වඩා පුළුල් කිරීමVII. ගොවිපල නිෂ්පාදනයන් සඳහා නිසි පරිදි අලෙවි පහසුකම් සැපයීම හා මිල ස්ථායී තත්වයට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම (මෙය බෙහෙවින් ම බල පාන්නේ වී හැර අනෙකුත් අතිරේක භෝග සම්බන්ධයෙනි) VII භෝග වගාව හා සත්ව පාලනය දියුණු කිරීමට ඒකාබද්ධ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

මෙවැනි යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු කරුණක් නම් ජලය ලබා දුන් පමණින්ම ගොවීන්ගේ වගා රටාව වෙනස් වේ යයි බලාපොරොත්තු විය නොහැකි බවයි. එබැවින් ජල පාලනය මගින් වාරිමාර්ග ව්‍යාපාරයේ ප්‍රයෝජන උපරිම කර ගැනීමට උත්සාහ දැරිය යුතුය. ඒ අනුව මෙම ව්‍යාපාරයේ උපරිම ප්‍රතිඵල නෙළා ගැනීමට නම් වා රි මාර්ග සම්පාදනය හා ප්‍රතිසංස්කරණය පමණක්ම නොව මෙහිදී සාකච්ඡා කෙරෙන අනෙකුත් කරුණු කෙරෙහිද සැලකිල්ල යොමු කිරීම අවශ්‍ය වේ.

# 1. හැඳින්වීම

## 1.1 ආරම්භය

මහවැලි සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීමක් අනුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් 1978 වර්ෂයේ කලාඹය ප්‍රදේශයේ සිදු කල කෘෂිආර්ථික සමීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් මෙම පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කෙරේ.

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ මූලික සැලසුමට අනුව අදියර තුනක් යටතේ අක්කර 900,000 බිම් ප්‍රදේශයක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන අතර 'ඒ' සිට 'එම්' දක්වා ප්‍රධාන වාරිමාර්ග පද්ධති 14 ක් යටතේ මෙම බිම් ප්‍රදේශය කොටස් කර ඇත. මෙහි පළමුවන අදියරයට යෝජනා ක්‍රම තුනක් අයත් වන අතර මින් පළමුවැන්න වන්නේ පොල්ගොල්ලේදී වේල්ලක් බැඳීමෙන් ගඟ හැරවීමයි. පළමුවන අදියරයට අනුව පොල්ගොල්ල හා බෝවතැන්නේ ප්‍රධාන වැඩ කොටස අවසන් වීමත් සමග මහවැලි ජලය කලාවැවට හා කන්දලම වැවට එක්රැස් වනු ඇත. එමගින් ප්‍රධාන යෝජනා ක්‍රමය යටතේ පවත්නා උතුරු මැද හා ඊසාන දිග බිම් ප්‍රදේශවලට වාරි පහසුකම් සැපයේ. 'එච්' වාරිමාර්ග පද්ධතිය ලෙස නම් කෙරෙන 'දෙවන අදියර' සැලසුම් කර ඇත්තේ කලාඹය නිම්නයේ පිහිටි ගොවිබිම් වශයෙන් දියුණු කළ හැකි අක්කර 71,000 ක ප්‍රදේශයක් සංවර්ධනය කිරීමටයි. සැලසුම ක්‍රියාත්මක කිරීමෙ පහසුව සඳහා 'එච්' 1 සිට 'එච්12' දක්වා 'එච්' වාරිමාර්ග පද්ධතිය උප ප්‍රදේශ 12 කට බෙදා ඇත.

ඉඩම් අක්කර 40,300 කින් සමන්විත එච් 4 හා එච් 5 ප්‍රදේශවල පමණක් මෙම සමීක්ෂණ කටයුතු මෙහෙයවීමට ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට පැවරී තිබුණි. (අංක 1 සිතියම) මෙම ප්‍රදේශ සඳහා අවශ්‍ය වාරි මාර්ග පහසුකම් හා සමාජ පසුබිම් සකස් කිරීමත් සමග ඉඩම් ලබාදීමේ ක්‍රමය යටතේ එක් පවුලක් සඳහා වාරිමාර්ග පහසුකම් සහිත අක්කර දෙකහමාරක ගොවිපලක් හා අක්කර භාගයක ගෙවත්තක් ලැබෙනු ඇත.


1978 සිට ආරම්භ කිරීමට නියමිතව තිබූ 'එච් 4' හා 'එච් 5' ප්‍රදේශවල කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වලට පෙර, එම ප්‍රදේශවල තිබූ කෘෂි ආර්ථික, ආර්ථික හා සමාජ පසුබිම පිළිබඳව හැදෑරීමක් කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය.

## 1.2 අධ්‍යයනයේ අරමුණු

I. ප්‍රදේශය තුල පිහිටි කුඹුරු හා ගොඩ ඉඩම් වගාවේදී දක්නට ලැබෙන වගා රටාවන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, යෙදවුම් භාවිතය, ගොවිපල නිෂ්පාදන මට්ටම්, ගොවිපල ආදායම්, අලෙවි පහසුකම් හා මිල මට්ටම්, ඉඩම් අයිතියේ ස්වභාවය යනාදිය ගැන පවතින තත්වය අධ්‍යයනයක් කිරීම.

II. ශ්‍රම බලකායේ ආවේනික ගුණාංගයන් වන වයස, අධ්‍යාපන මට්ටම්, විශේෂ නිපුනතා හා රැකියා නියුක්ති රටාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.

Fig: 1


LAYOUT
OF THE STUDY AREA
MAHAWELI SCHEME - H4 AND H5
From Puttalam
To Anuradhapura
Pahamuneqama
To - Jaffna
ANGAMUWA TANK
Talawa
RAJANGANA
RESERVOIR
Jambuttegama
R. B. MAIN CANAL
Kiralogama
Kanwewa
Amunukole
From Kurunegala
Eppawala
Alutwewa
Kuttikulam
KATTIYAWA
MAHILLUPPALLAMA
SRI LANKA
Location of Study Area
REFERENCE
Tank
Road
Railway Line
Canal

III. වගා කටයුතු සඳහා පවත්නා ආයතනික හා අනෙකුත් පහසුකම් වල අඩුපාඩු හඳුනාගැනීම

IV. අධ්‍යයන ප්‍රදේශය තුලින් තෝරාගත් ගමක පවතින සමාජ සංවිධානය හා සමාජ සැලැස්ම පරීක්ෂා කර බැලීම.

1.3 අධ්‍යයන ක්‍රමය

1.3.1 නියැදිය තෝරා ගැනීම

සංවර්ධනය සඳහා අරමුණු කළ 'එච්' ප්‍රදේශය වාරිමාර්ග කොට්ඨාශ 41 කට බෙදා ඇති අතර ඉන් එක් කොටසකට අක්කර 3000 සිට 4000 දක්වා ප්‍රමාණයක් අයත් වේ. මෙම කොට්ඨාශ වෙන් කිරීමේ මායිම් ලෙස යොදා ගෙන ඇත්තේ කඳු වැටි දිය පාරවල් වැනි ස්වාභාවික මායිම් වන අතර එම ඇල මාර්ග පද්ධතියට පහත සඳහන් පරිදි අංක යොදා ඇත.


| | දකුණු ඉවුර | වම් ඉවුර |
|---|---|---|
| කන්දලම වැව | 101 සිට 104 දක්වා | 201 සිට 205 දක්වා |
| කලා වැව | 401 සිට 421 දක්වා | 301 සිට 311 දක්වා |

එමෙම අධ්‍යයනය ප්‍රදේශය තුල පිහිටි එක් සංවර්ධන ප්‍රදේශයකට වාරිමාර්ග කොට්ඨාශ හතරේ සිට හය දක්වා ප්‍රමාණයක් අඩංගු වේ.

---

1. සෑම සංවර්ධන ප්‍රදේශයක්ම අක්කර 8000 සිට 12000 ක තරම් ප්‍රමාණයකින් යුක්ත වේ. වාරිමාර්ග පද්ධතීන්වල නියමාකාර ක්‍රියාකාරීත්වයක් හා පරිපාලනයක් ඇති කරවීම සඳහා මහවැලි සංවර්ධන මණ්ඩලය මගින් මෙම ප්‍රදේශ සීමාවන් තීරණය කර ඇත. වාරිමාර්ග සැලැස්මට අනුකූල වන ලෙස නගරය, ග්‍රාමීය මධ්‍යස්ථානය හා කුඩා ගම්මාන වලින් යුක්ත වන පරිදි ජනපදයකට සංවර්ධන කලාපයක් ඇතුලත් වන අයුරින් මහවැලි සංවර්ධන මණ්ඩලය මගින් මෙම සැලැස්ම පිහිටුවා ගෙන තොට ඇත. සෑම කුඩා ගම්මානයකටම පවුල් 100 සිට 125 ක ප්‍රමාණයක් ඇතුලත් වන පරිදි එවැනි කුඩා ගම්මාන 4 ක් හෝ 5 ක් එක් වීමෙන් එක් ග්‍රාමීය මධ්‍යස්ථානයක්ද ගම්මාන කීපයක එකතුවෙන් නාගරික මධ්‍යස්ථානයක්ද නිර්මාණය වී ඇත. ගම්මාන 4 ක් හෝ 5 ක් ඇතුලත් වන ග්‍රාමීය මධ්‍යස්ථානයේ සමුපකාර සමිති ශාඛා ගබඩා පහසුකම් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථාන ආදී බොහෝ සේවා මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. පවුල් 3000 සිට 4000 අතර ගණනකට සේවා පහසුකම් සපයන නාගරික මධ්‍යස්ථානය විශාලතම සේවා මධ්‍යස්ථානය වනු ඇත. ප්‍රාථමික සමුපකාර සමිති, ගබඩා, වී මෝල් හා ඇඹරුම් හල් ආදී පහසුකම් වලින් සමන්විත වනු ඇත.

Fig: 2


IRRIGATION BLOCKS AND
DEVELOPMENT REGIONS
MAHAWELI SCHEME - H4 AND H5
From Puttalam
To Anuradhapura
To Jaffna
Talawa
Pahamunegama
Tambuttegama
Eppawala
ANGAMUWA TANK
RAJANGANA
RESERVOIR
From Kurunegala
KATTIYAWA
MAHILLUPPALLAMA
Kiralogama
Konwewa
Amunukole
Alutwewa
Kuttikulam
R. B. MAIN CANAL
H5
H4
DR 5
DR 6
DR 7
DR 8
401
402
403
404
405
406
407
408
409
410
411
412
413
414
415
416
417
418
419
420
421
SRI LANKA
Location of Study Area
REFERENCE
DR = Development Region
= Tank
= Road
= Railway line
= Canal

මෙම ප්‍රදේශයේ ඇති කරනු ලබන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ දැනට පවතින පැරණි ගම් අනුව නොව සංවර්ධන ප්‍රදේශ අනුව වන බැවින් අධ්‍යයන නියැදිය තෝරා ගැනුනේද එම සංවර්ධන ප්‍රදේශ පදනම් කරගෙනය. මේ අනුව නියැදියේ ප්‍රාථමික ස්තර වශයෙන් සංවර්ධන ප්‍රදේශ 5, 6, 7 සහ 8 ප්‍රදේශ යොදා ගනිමින් සසම්භාවී ක්‍රමයට කුටුම්භයන් තෝරා ගන්නා ලදී. එච් 4 හා එච් 5 ප්‍රදේශවලට අයත් සංවර්ධන ප්‍රදේශ වලින් තෝරාගත් නියැදියේ විස්තර පහත දැක්වේ.

1.1 වගුව එච් 4 සහ එච් 5 ප්‍රදේශවල නියැදි කුටුම්භයන්ගේ ව්‍යාප්තිය.

| සංවර්ධන ප්‍රදේශය | වාරිමාර්ග කොට්ඨාශ | මුළු නිවාස ඒකක ගණන | නියැදියේ ප්‍රමාණය |
|---|---|---|---|
| 5 | 401<br>402<br>403<br>404<br>407 | 2637 | 180 |
| 6 | 405<br>406<br>408<br>409 | 1804 | 125 |
| 7 | 410<br>411<br>418<br>419<br>420<br>421 | 1476 | 103 |
| 8 | 412<br>413<br>414<br>415<br>416<br>417 | 1505 | 104 |
| එකතුව | | 7422 | 512 |

## 1.3.2 නියැදි රාමුව

අධ්‍යයනය සඳහා නියැදිය තෝරා ගැනීමේදී පදනම වශයෙන් ආහාර පාලකගේ නිවාස ඒකකයන් පිළිබඳ ලැයිස්තුව යොදා ගැනින.

මෙම ක්‍රමය හැර වෙනත් යුදුසු නියැදි රාමුවක් නොමැති වීමේ හේතුවෙන් මෙම රාමුව යොදා ගැනුනු අතර එමඟින්ද යම් යම් අඩු ලුහුඬුකම් මතු වූ බව සඳහන් කළ යුතුය. මෙවැනි ප්‍රශ්නයන් වැඩි වශයෙන්ම මතු වූයේ අධ්‍යයනයේ මූලික ඒකකයින් වශයෙන් සැලකෙන කුටුම්භයින් විග්‍රහ කිරීමේදීය. එකම නිවසක වාසය කළද, ගොවිතැන් කිරීමේදී හා ගෘහ කටයුතු සඳහා වෙන් වෙන් වශයෙන් වියදම් කරන්නේ නම් ඔවුන් වෙනස් කුටුම්භයන් වශයෙන් සලකන ලදී.

නියැදිය සඳහා තෝරා ගැනුනේ ගෘහ ඒකකයන් 500 ක් එනම් මුළු සංඛ්‍යාවෙන් 7% ක ප්‍රමාණයකි. මෙම ප්‍රමාණය ස්තරවල ජනගහන ප්‍රමාණය අනුව බෙදී ගොස් ඇත.

### 1.3.4 දත්ත රැස් කිරීම

මෙම අධ්‍යයනයේදී 1977 අප්‍රේල් සිට 1978 මාර්තු දක්වා කාල පරිච්ඡේදයේදී ප්‍රදේශයේ පැවැති කෘෂි ආර්ථික හා ආර්ථික විද්‍යාත්මක තත්වය සැලකිල්ලට ගෙන ඇත. මෙම කාල සීමාවට 1977 යල හා 1977/78 මහ කන්න ඇතුලත් වගා වර්ෂය ඇතුලත් විය. මෙහිදී අවශ්‍ය තොරතුරු ලබා ගනු ලැබුවේ ප්‍රශ්න මාලාවක් ඇසුරෙනි.

දත්ත රැස් කිරීමේ ක්ෂේත්‍ර කටයුතු 1978 අප්‍රේල් මාසයේ සිට මාසයක කාලයක් තුල සිදු විය. ප්‍රශ්න මාලා වට අදාල සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට සඳහා පුහුණු විමර්ශකයින්ගේ සේවය ලබාගත් අතර සමීක්ෂණ කාල සීමාව අවසානය දක්වා ක්ෂේත්‍රයේ ගතකල පර්යේෂණ නිලධාරීන් හතර දෙනෙකු ඔවුන්ට අවශ්‍ය උපදෙස් සපයන ලදී. අධ්‍යයන ප්‍රදේශයේ සේවය කරන මහවැලි සංවර්ධන මණ්ඩලයේ ඉහළ නිලධාරීන්ට ඉදිරිපත් කළ වෙනත් ප්‍රශ්න මාලාවකින් ද තව දුරටත් අවශ්‍ය තොරතුරු සපයා ගන්නා ලදී. මෙම තොරතුරු වල ප්‍රධාන වශයෙන් අඩංගු වූයේ ප්‍රදේශය තුල පැවැති කෘෂිකාර්මික නොවන අංශය, සෞඛ්‍ය, අධ්‍යාපනයාදී පහසුකම් පිළිබඳ කරුණුය.

අධ්‍යයන ප්‍රදේශයේ සමාජ ව්‍යුහය සහ එහි පවතින වෙනස්වීම් පිළිබඳව සාමාන්‍ය අදහසක් ලබාගැනීම පිණිස එක් පුරාණ ගමක් වැඩිපුර අධ්‍යයනයට භාජනය කරන ලදී. මෙහිදී අනිවාර්යයෙන්ම මතුවන ප්‍රශ්නයක් වන්නේ මෙවැනි එක් පුරාණ ගමක් අධ්‍යයනය කිරීමෙන් පමණක් මුළු ප්‍රදේශය පිළිබඳව පොදු අවබෝධයක් ලබා ගැනීමට හැකිවේද යන්නයි. ජාතික සංවර්ධනයේදී ඔවුනොවුන් අතර බල පවත්වන සමාජ ක්‍රියාවන්සමඟපරිසර විද්‍යාත්මක සාධකවූ භෞතික, දේශගුණික හා ප්‍රජා විද්‍යාත්මක සාධක සම්බන්ධ වේ. මේ අනුව එච් 4 හා එච් 5 ප්‍රදේශ ඒකාකාරී ස්වාභාවික ලක්ෂණ වලින් යුත් ප්‍රදේශයක් ලෙස වටහා ගත හැක. එම නිසා එම ජන කොට්ඨාශයේ සැකැස්ම; උදාහරණ වශයෙන් එම ග්‍රාමීය කොට්ඨාශයන්හි පදනම, ඉඩම් භුක්තික්‍රම සහ ආර්ථික සංවිධානය එකිනෙකින් එකිනෙකට වෙනස්කම් වලින් යුක්ත නො වේ. එම නිසා ප්‍රදේශය තුල ඇති එක් සමාජ කොට්ඨාශයක් ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් මුළු ප්‍රදේශය පුරාම විහිදී පවතින සාමාන්‍ය ආර්ථික ගුණාංග පිළිබඳව සෑහෙන අවබෝධයක් ලබාගත හැක. මෙම අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබුවේ 'තඹුත්තේගම' ග්‍රාමයයි. එසේ තෝරා ගැනීමට බලපෑ ප්‍රධාන සාධක දෙකක් වේ.

I. මෙය පළාතේ පවතින විශාලතම පුරාණ ගම්මානය වශයෙන් සැලකිය හැක.

II. එමෙන්ම මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කිරීමෙන් පසුවද මෙම ගම්මානය නාගරික මධ්‍යස්ථානයක් බවට පත්වේ.

මෙම ග්‍රාමය පිළිබඳ අධ්‍යයනය සමාජ විද්‍යාව පිළිබඳ පර්යේෂකයෙකු විසින් සහ විමර්ශක වරුන් දෙදෙනෙකුගේ සහාය ඇතිව සිදුකරන ලදී. මෙහිදී අවශ්‍ය තොරතුරු

මූලික වශයෙන් ලබා ගැනුනේ ප්‍රදේශ වාසීන් සමඟ සාකච්ඡා පැවැත්වීමෙන් වුවද ඊට අ අමතරව ප්‍රශ්නාවලියක් මගින් හා කායනාලීය ලියකියවිලි මගින්ද තව දුරටත් තොරතුරු ලබා ගැනින.

## 2. අධ්‍යයන ප්‍රදේශය

### 2.1 පිහිටීමේ ස්වභාවය

අධ්‍යයන ප්‍රදේශය වූයේ 'එච්' 4 හා එච් 5 යන උප ප්‍රදේශයන්ය. ශ්‍රී ලංකාවේ උතුරු මැද වියළි කලාපයේ අනුරාධපුරයට සැතපුම් 10 ක් පමණ නිරිත දිගින් කලාඔය නිම්නය ආශ්‍රිතව 'එච්' වාරිමාර්ග පද්ධතිය පිහිටා ඇත. ගම්බද කුඩා වැව් යටතේ විශාල වශයෙන් සිදුවන වී වගාව මෙම ප්‍රදේශයේ පහත් බිම් ආශ්‍රිතව දැක ගත හැක. වාරි - මාර්ග පහසුකම් නොමැති ගොඩ ඉඩම් වැඩි වශයෙන් ලඳු කැලෑ ලෙස පවතින අතර මෙවැනි ඉඩම් බහුල වශයෙන් හේන් ගොවිතැන සඳහා යොදවා ගනු ලැබේ. වර්තමානයේ විශාල වාරිමාර්ග කටයුතු සම්පාදනය වෙමින් පවතින අක්කර 45,000 ක ප්‍රදේශයකට ජල පහසුකම් සැපයිය හැකි, කන්දලම වැට සහ කලාවැව ආසන්නයේ මෙම ඉඩම් පිහිටා ඇත. අක්කර 106,000 ක් ලෙස තක්සේරු කර ඇති 'එච්' ප්‍රදේශයේ සංවර්ධනය හා මෙම වැව් දෙක අතර අන්තර් සම්බන්ධතාවයක් ඇත. එයට හේතුව එම ප්‍රදේශයට ජලය ලබා දෙන්නේ මෙම වැව් දෙක මගින් වීමයි. 'එච්' ප්‍රදේශයේ මූලික ජල සැපයුම් මාර්ග වන්නේ ප්‍රදේශයේ ඇති ස්වාභාවික ඇළ මාර්ග හා පොල්ගොල්ල - බෝවතැන්න සංකීර්ණය මගින් මහවැලි ගඟ හරස් කිරීමෙන් ලැබෙන ජලයයි.

කලාඔය ප්‍රදේශයේ වම් ඉවුරේ දක්නට ඇති පාරවල් හා සසඳා බලන විට දකුණු ඉවුරේ පාරවල් වැඩි දියුණුවක් පෙන්වයි. කොළඹ සිට ඇති උතුරු දිග දුම්රිය මාර්ගය හා නැගෙනහිර දුම්රිය මාර්ගය මෙම ප්‍රදේශයේ හරහා වැටී ඇති අතර වර්තමානයේ මෙම ප්‍රදේශයේ දුම්රිය නැවතුම් ස්ථාන හතරක්ද පිහිටා ඇත. කුඩා ග්‍රාමීය වැව් ආසන්නයේ එකිනෙකට කිට්ටුවෙන් ඉදිකරනු ලැබූ නිවාසවල පදිංචි වූ පාරම්පරික සමාජක්‍රම වලින් යුත් පුරාණගම් 'එච්' ප්‍රදේශයේ වැඩි වශයෙන් ඇති බව එම ජනපද ක්‍රමය පිළිබඳව කරනු ලැබූ සොයා බැලීමකදී හෙළිවිය. මෙවැනි ජනාවාස ක්‍රමයක පවතින ප්‍රධාන ලක්ෂණයක් වූ හේන් පිහිටා ඇත්තේ මෙම ප්‍රධාන ගම්වලට ඈතිනි. මහ කන්නය තුළදී මෙම ප්‍රදේශයේ ජනතාවගේ මූලික සේවා නියුක්ති මාර්ගය වන්නේ ග්‍රාමීය වැව් යටතේ වී ගොවිතැන් කිරීම සහ හේන්වල විවිධ ක්ෂේත්‍ර භෝග වගා කිරීමයි. (අංක 1 උප ග්‍රන්ථය මගින් ප්‍රදේශයේ දේශගුණික හා පස පිළිබඳ විස්තරයක් දක්වා ඇත.

අධ්‍යයන ප්‍රදේශයේ වූ එච් 4 හා එච් 5 ප්‍රදේශ අංක 401 සිට 421 දක්වා වූ වාරිමාර්ග කොට්ඨාශ 21 කින් යුක්ත වේ. අංක 401 සිට 410 එච් 4 ප්‍රදේශයේද, 411 සිට 421 දක්වා එච් 5 ප්‍රදේශයේද මේවා පිහිටා ඇත. එකී වාරිමාර්ග

කොට්ඨාශයකට අක්කර 1750 සිට 2250 ප්‍රමාණයක් අයත් වන පරිදි මුළු අධ්‍යයන ප්‍රදේශය අක්කර 40,300 කින් සමන්විත වේ. 1977 වර්ෂය වන විට අධ්‍යයන ප්‍රදේශය තුළ තිබූ ඉඩම් හා එහි පදිංචිව සිටි පවුල්වල ව්‍යාප්තිය පහත සඳහන් පරිදි වේ.

| | එච් 4 | එච් 5 | එකතුව |
|---|---|---|---|
| යෝජිත සංවර්ධන ප්‍රදේශය (දළ වශයෙන් අක්කර) | 23200 | 17100 | 40300 |
| පදිංචි පවුල් සංඛ්‍යාව | 4764 | 2658 | 7422 |
| ගණිස්සෙරූ කළ ජනගහනය | 29060 | 15071 | 44131 |

මෙම ප්‍රදේශයේ ජනතාව ගොවිතැන් කටයුතු සඳහාත් සත්ව පාලන කටයුතු සඳහාත්, නෑම, රෙදි සේදීම ආහාර පිසීම වැනි ගෘහ සේවා කටයුතු සඳහාත් අවශ්‍ය ජලය සපයා ගනු ලබන්නේ ග්‍රාමීය වැව් මගිනි. එච් 4 වාරිමාර්ග ප්‍රදේශයේ අක්කර 5650 ක පමණ කොටසකට ග්‍රාමීය වැව් සියයකටත් අධික ප්‍රමාණයක් මගින් ජලය සපයයි. මේවායින් 40 ක් පමණ ප්‍රධාන වාරිමාර්ගයක් වන යෝධ ඇල හා සම්බන්ධ වී එමගින් පෝෂණය වන අතර අක්කර 3100 ක පමණ ප්‍රදේශයක වී වගාව සඳහා ජලය සපයයි. එච් 5 ප්‍රදේශයේ වැව් සංඛ්‍යාවෙන් 50 කට ආසන්න ප්‍රමාණයක්ම වැසි දියෙන් පෝෂණ වේ. මෙම වැව් බොහෝ අවුරුදු වල මහ කන්නයේදී වී වගාව සිදුවන කුඹුරු අක්කර 3350 ට පමණ ඇති ප්‍රධාන ජල සැපයුම් මාර්ගය වේ. මේ අනුව වර්ෂා පෝෂිත වැව් වලින් වාරිමාර්ග පහසුකම් ලැබෙන්නේ එච් 4 ප්‍රදේශයේ මුළු අක්කර ප්‍රමාණයෙන් දහයෙන් කොටසකටත්, එච් 5 ප්‍රදේශයේ පහෙන් එක් කොටසකටත් වන අතර වී වගා ව මහ කන්නයට පමණක් සීමා වේ.

මෙමගින් පෙන්නුම් කරන්නේ අධ්‍යයන ප්‍රදේශය ඇතුළත් ඔ යෝජිත සංවර්ධන ප්‍රදේශයේ දළ අක්කර ප්‍රමාණයෙන් 15% ක් පමණ වර්ෂාපෝෂිත මෙම ගම්බද වැව් වලින් ජලය ලබන බවත්, එයද මහ කන්නයට පමණක් සීමා වන බවත්ය. කන්න දෙක තුළදීම යෝධ ඇල මගින් මුළු බිම් ප්‍රදේශයෙන් 8% ක පමණ කොටසකට වාරිමාර්ග පහසුකම් සපයයි. අධ්‍යයන ප්‍රදේශය තුළ දැනට ලැබුණු සාම්ප්‍රදායික ඉඩම් භාවිතා ක්‍රම තුන් ආකාරයකට දැක්විය හැක.

(I) වාරිමාර්ග සැපයුතු මඩ ඉඩම් වල සිදුවන වී වගාව

(II) ගොඩ ඉඩම්වල ගෙවතු වගාව

(III) කැලෑ ඉඩම් වල සිදුවන හේන් වගාව

2.2 වෙනත් පහසුකම්

ප්‍රදේශය තුළ පිහිටා ඇති පාඨශාලා, වෛද්‍ය ආයතන හා තැපැල් කාර්යාල, බැංකු සේවා වැනි බාහිර අංගෝපාංග පිළිබඳ කෙටි විස්තරයක් පහත සඳහන් වේ.

2.2.1

ප්‍රදේශයේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලන්නේ ප්‍රදේශය තුළ පිහිටා ඇති පාඨශාලා 34 ක් මගිනි. මෙම අධ්‍යාපනික ආයතන ප්‍රාථමික (5 වන ශ්‍රේණිය දක්වා) කනිෂ්ඨ (6 සිට 9 ශ්‍රේණිය දක්වා) සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10 ශ්‍රේණිය හා 11 ශ්‍රේණිය) වශයෙන් තුන් ආකාරයක ස්වභාවයක් ගනී.

1978 වන විට ප්‍රදේශයේ ලියා පදිංචි ව තිබූ පාසැල් සංඛ්‍යාව පහත සඳහන් අංක 2.1 වගුව මගින් පෙන්නුම් කරයි.

2.1 වගුව 1978 වන විට එච්4 හා එච් 5 ප්‍රදේශවලලියාපදිංචි පාසැල්

| වර්ගය | පාසැල් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව | පාසැල් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ප්‍රාථමික | 7 | 984 | 4 | 418 |
| කනිෂ්ඨ | 7 | 1927 | 11 | 2095 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික | 2 | 2353 | 3 | 2891 |
| එකතුව | 16 | 5264 | 18 | 5404 |

ප්‍රදේශයේ සේවය කරන උපාධිධාරී ගුරුවරු 96 ක ගෙන් විද්‍යා අංශයේ සුදුසුකම් ලත් අය ඇත්තේ දෙදෙනකු (2) පමණි.

2.2 වගුව

2.2 වගුව 1978 ජනවාරි 01 දිනවන විට ක්ෂේත්‍රය අනුව පුහුණු ගුරුවරුන්ගේ ව්‍යාප්තිය

| | එච් 4 | | | එච් 5 | | |
|---|---|---|---|---|---|---|
| | විද්‍යා | කලා | එකතුව | විද්‍යා | කලා | එකතුව |
| නුපුහුණු | 11 | 24 | 35 | 8 | 33 | 41 |
| පුහුණුගුරු | 4 | 97 | 101 | 15 | 52 | 67 |
| උපාධිධාරී ගුරු | 2 | 44 | 46 | 00 | 50 | 50 |
| එකතුව | 17 | 165 | 182 | 23 | 135 | 158 |

ජාතික මට්ටමින් 21.7 ක් හා දිස්ත්‍රික් මට්ටමින් 23.3 ක් වූ ගුරු සිසු අනුපාතය මෙම ප්‍රදේශයේ 31.4 ක ඉහල අගයක් ගනී. මූලික පහසුකම් අහිමි පවා මෙම ප්‍රදේශයේ දක්නට ඇති අඩු දියුණු තත්වය අනුව මෙය පුදුමයට කරුණක් නොවේ. (2.3 වගුව)

1. ළමයින් පිළිබඳ සංඛ්‍යා දත්ත පොතින් උපුටා ගත් පාසැල් සංඛ්‍යා ලේඛන – 1977 ශ්‍රී ලංකා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

2.3 වගුව

ගුරු සිසු අනුපාතය

| ප්‍රදේශය | ගුරුවරු | | ශිෂ්‍යයන් | | ගුරු සිසු අනුපාතය |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දිස්ත්‍රික්කයේ මුළු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | සංඛ්‍යාව | දිස්ත්‍රික්කයේ මුළු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | |
| එච් 4 | 182 | 4.6 | 5264 | 5.7 | 28.9 |
| එච් 5 | 158 | 4.0 | 5404 | 5.8 | 34.2 |
| එච් 4 හා එච්5 | 340 | 8.6 | 10668 | 11.5 | 31.4 |

2.2.2

ප්‍රදේශයේ පවතින සෞඛ්‍ය පහසුකම් දෙස බලන විට රජය මගින් පාලනය වන බාහිර බෙහෙත් ශාලා කිහිපයක් හා ග්‍රාමීය ආරෝග්‍යශාලා ප්‍රධාන සෞඛ්‍ය සේවා ආයතන අතර වේ. පහත දැක්වෙන වගුව මගින් ඒ පිළිබඳ විස්තර දැක්වේ.

2.4 වගුව 1979 ජනවාරි 01 දින වන විට ප්‍රදේශයේ තිබූ ග්‍රාමීය ආරෝග්‍යශාලා සහ බෙහෙත් ශාලා

| ප්‍රදේශය | ආරෝග්‍යශාලා ගණන | ඇඳන් ගණන | බෙහෙත්ශාලා ගණන | පුද්ගලයින් 100 කට රෝහල් වල ඇති ඇඳන් ගණන | එක් බෙහෙත් ශාලාවකින් සේවය සැලසෙන පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| එච් 4 | 2 | 49 | 3 | 1.7 | 7265 |
| එච් 5 | 2 | 66 | 3 | 4.4 | 5024 |
| එච් 4 හා එච්5 | 4 | 115 | 6 | 2.6 | 6304 |

පුද්ගලයින් 1000 ක් සඳහා ඇති ඇඳන් ගණන ජාතික මට්ටමේදී 3.0ක් හා දිස්ත්‍රික් මට්ටමේදී 3.5 ක් ප්‍රමාණය, මෙම ප්‍රදේශයේ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවල පුද්ගලයින් 1000 ක් සඳහා ඇති ඇඳන් ගණනේ සාමාන්‍ය වූ 2.6 තරම් අඩු අනුපාතයක් බව පෙන්නුම් කරයි.[1] ප්‍රදේශයේ පවතින වෛද්‍ය ආයතන මගින් ලබා ගත හැකිවූ තොරතුරු මගින් පෙන්නුම් කළ පරිදි මැලේරියා රෝගීන්ද සැලකිය යුතු සංඛ්‍යාවක් 1977 වර්ෂය තුලදී මෙමගින් ප්‍රතිකාර ලැබූ බවයි. එච් 5 ප්‍රදේශයේ පුද්ගලයින් 1000 කට 160 ක් මැලේරියා ප්‍රතිකාර ලබා තිබුනු බවද මෙම ප්‍රමාණය එච් 4 ප්‍රදේශයේ පැවැති අනුපාතයට වඩා ඉහල අගයක් ගන්නා බවද ලැබුණු තොරතුරු වලින් හෙළිවේ. මේ හැර ආයුර්වේද වෛද්‍යවරු සෑහෙන සංඛ්‍යාවක් විසින් පිහිටුවා ඇති බාහිර බෙහෙත් ශාලා ප්‍රදේශයේ සුලභ ලෙස දක්නට ලැබෙන අතර මොවුන් අතින් සැපයෙන විශේෂ ප්‍රතිකාර අතර කැඩුම් බිඳුම් සඳහාත්, සර්පයින් සපා කෑ අවස්ථාවලදී වන විෂ වෛද්‍ය ප්‍රතිකාරත් වැදගත් වේ.

---

1. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙනුවෙන් ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ "ළමයින් පිළිබඳ සංඛ්‍යා දත්ත" වාර්තාව

2.2.3

තැපැල් පහසුකම් අතින් එච් 5 ප්‍රදේශය , එච් 4 ප්‍රදේශයට වඩා දියුණු තත්වයක් පෙන්වයි. එච් 4 ප්‍රදේශයේ පුද්ගලයින් 29,000 කට සේවා පහසුකම් සැලසීම සඳහා ඇත්තේ තැපැල් කාර්යාල තුනක් වුවද එච් 5 ප්‍රදේශයේ පුද්ගලයින් 15,000 කට සේවය සැලසීම සඳහා තැපැල් කාර්යාල 4 ක් පිහිටා ඇත. දුරකථන පහසුකම් ඇත්තේ එච් 4 ප්‍රදේශයේ එක් තැපැල් කාර්යාලයකට හා එච් 5 ප්‍රදේශයේ තැපැල් කාර්යාල දෙකකටත් පමණි.

2.2.4

ලංකා බැංකුව හා මහජන බැංකු ශාඛා කිහිපයක් ප්‍රදේශය තුල පිහිටා ඇත. මේවායින් තුනක් එච් 4 ප්‍රදේශයේද හතරක් එච් 5 ප්‍රදේශයේද ස්ථානගත වී ඇත. 1977 වර්ෂය වන විට මෙම ප්‍රදේශයේ පුද්ගලයින් 1000 කගෙන් 325 කට බැංකු ගිණුම් තිබුනි. ප්‍රදේශ දෙක වෙනවෙනම ගත්විට එච් 5 ප්‍රදේශයට එච් 4 ප්‍රදේශයට වඩා සිව් ගුණයකින් ඉහල මට්ටමක ගිණුම් සංඛ්‍යාවක් හිමිව තිබිණ. (එච් 4 ප්‍රදේශයේ පුද්ගලයින් 1000 කට අඩු ගිණුම් සංඛ්‍යාව 160 ක් පමණි) එච් 5 ප්‍රදේශයෙන් මෙතරම් විශාල ගිණුම් සංඛ්‍යාවෙක් වාර්තා වීමට අධ්‍යයන ප්‍රදේශය තුල පිහිටි රාජාංගන ජනපද යෝජනා ක්‍රමයේ පදිංචි ගොවීන්ගේ සමෘද්ධිමත් භාවය සමහරවිට හේතුවක් විය හැක. තවද ප්‍රදේශයේ මුළු ජන සංඛ්‍යාවෙන් තුනෙන් කොටසකට ආසන්න සංඛ්‍යාවකට බැංකු ගිණුම් හිමිව තිබීම, ඉතිරිකිරීමේ පුරුද්ද කෘෂිකාර්මික කටයුතු වල නිරතවන පුද්ගලයින් සමඟ අන්‍යොන්‍ය සබඳතාවයක් දක්වන තත්වයක් බව පෙන්නුම් කරයි.

2.2.5

ප්‍රදේශය තුල විවිධ සේවා සමුපකාර සමිති 27 ක් ක්‍රියාත්මක වන අතර ඒවායින් සේවා පහසුකම් ලබන පාරිභෝගික සංඛ්‍යාවේ සාමාන්‍යය පහත දැක්වෙන පරිදිවේ.

| | එච් 4 | එච් 5 | එච්4සහඑච්5 | එච් ප්‍රදේශය |
|---|---|---|---|---|
| විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව | 13 | 14 | 27 | 84 |
| එක් සමුපකාර සමිතියකින් සේවය සැලසෙන පාරිභෝගිකයින් සංඛ්‍යාවේ සාමාන්‍යය | 2235 | 1076 | 1635 | 1500* |

*'එච්' ප්‍රදේශයේ සංවර්ධනය නොවූ කොටස්වල පිහිටි විවිධ සේවා සමුපකාර සමිතියකින් සේවය සැලසෙන පුද්ගලයින් සංඛ්‍යාවේ සාමාන්‍යය 2500 ක් පමණවේ.

ආහාර පාන, ඇඳුම් පැළඳුම් වැනි ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් මෙම ආයතන මගින් සපයන බැවින් සමුපකාර සමිති මෙම ග්‍රාමීය ජන කොට්ඨාශයේ ජීවන ක්‍රමය හා එකට බැඳී පවතී. මෙයට අතිරේකව නිෂ්පාදන කටයුතු සඳහා ණය පහසුකම් සැපයීමේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් මෙන්ම ගොවීන්ගේ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් ලෙසද මෙමගින් සේවා පහසුකම් සපයයි.

2.2.6

එච් 4 හා එච් 5 ප්‍රදේශවල පිහිටුවා ඇති පොලිස් ස්ථාන දෙකට මෙම ප්‍රදේශයේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත. එච් 4 ප්‍රදේශයේ පුද්ගලයින් 1000 ට පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාව 1.4 ක් සහ එච් 5 ප්‍රදේශයේ 2.7 වේ. මේ අනුව ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පෙන්නුම් කරයි.

2.2.7

අධ්‍යයන ප්‍රදේශය තුල සේවය සඳහා ඇති ට්‍රැක්ටර්, ට්‍රේලර් සහ වෙනත් අධි යාන්ත්‍රික පහසුකම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | එච් 4 | එච් 5 |
|---|---|---|---|
| ට්‍රැක්ටර්– | රෝද 2 | 95 | 14 |
| | රෝද 4 | 15 | 18 |
| ට්‍රේලර්– | රෝද 2 | 67 | 12 |
| | රෝද 4 | 12 | 15 |
| ට්‍රැක්ටර් අලුත් වැඩියා කරන ස්ථාන | | 3 | 3 |
| ඉන්ධන පිරවුම් මධ්‍යස්ථාන | | 1 | 2 |
| වී ගබඩා | | 3 | 0 |
| වී මෝල් | | 20 | 11 |

ට්‍රැක්ටර් වර්ග දෙකම ගත්විට එච් 4 ප්‍රදේශයේ අක්කර 211ක් හා එච් 5 ප්‍රදේශයේ අක්කර 534 ක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සේවා පහසුකම් සලස්වා ගත හැක.

සේවක මහතුන් 24 ක් සේවය කරන එච් 4 හා එච් 5 ප්‍රදේශවල ට්‍රැක්ටර් අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන 6 ක් ඇත. වාහන සඳහා අවශ්‍ය පෙට්‍රල් හා ඩීසල් මෙන්ම නඩත්තු පහසුකම් සපයනු ලබන්නේ එච් 4 ප්‍රදේශය තුල පිහිටි ඉන්ධන පිරවුම් හලක් හා එච් 5 ප්‍රදේශය තුළ පිහිටි ඉන්ධන පිරවුම් හල් දෙකක් මගිනි. එච් 5 ප්‍රදේශය තුල වී ගබඩා ස්ථානගත වී නැති අතර එච් 4 ප්‍රදේශයේ වී බුසල් 250,000 කට ගබඩා පහසුකම් සපයයි. ප්‍රදේශයේ වී මෝල් 31 ක් ඇති අතර මින් තුනක් වී අලෙවි මණ්ඩලයේ ලියා පදිංචි වී ඇත. මේවා මගින් ප්‍රදේශයේ වී කෙටීමේ පහසුකම් සපයන අතරම පුද්ගලයින් 150 කට රැකියා පහසුකම්ද සලසා ඇත.

2.2.8

ප්‍රදේශය තුළ පිහිටි කාර්මික රැකියා රහිත ගොවූ සේවා මධ්‍යස්ථාන කිහිපයක්ද පහත දැක්වේ.

| | එච් 4 | එච් 5 |
|---|---|---|
| බේකරි | 10 | 11 |
| ගඩොල් සාදන ස්ථාන | 01 | 02 |
| ලී මෝල් | 01 | -- |
| අත් යන්ත්‍ර රෙදි විවීමේ මධ්‍යස්ථාන | 01 | 01 |
| වළං සාදන ස්ථාන | 09 | -- |
| ස්වර්ණාභරණ සාදන ස්ථාන | 02 | 01 |
| රථ වාහන අළුත් වැඩියා කරන ස්ථාන | 06 | 02 |
| බයිසිකල් අළුත් වැඩියා කරන ස්ථාන | 16 | 17 |

ඉහත කී සේවා මධ්‍යස්ථානවල තවත් පුද්ගලයින් 225ක් සේවා නියුක්ත වී සිටිති.

## 3. කුටුම්භයන්ගේ මූලික ලක්ෂණ

මෙම පරිච්ඡේදයේදී මූලිකව අවධානය යොමු වී ඇත්තේ අදාළ ප්‍රදේශයේ පදිංචි කරුවන් හා ඔවුන්ගේ නිවාස වල තත්වය, සේවා මධ්‍යස්ථාන වලට ඇති සමීපතාවය, මෙන්ම ගොවි උපකරණ අයිතිය, වැනි අංගයන් කෙරෙහිය.

### 3.1 ජනගහණ ලක්ෂණ

සමීක්ෂණ අවධියේ අධ්‍යයන ප්‍රදේශය තුල ජනගහණය පුද්ගලයින් 45,000 ක් පමණ විය. ගෘහමූලිකයන්ගෙන් 5% ක් පමණ මෑතකදී පිටතින් පැමිණි -1971 දී මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භ කිරීමෙන් පසු පැමිණි අයගෙන් සමන්විතය. ලබාගත් දත්තයන්ට අනුව කුටුම්භ වලින් 45% ක් පමණ 1971 ට පෙර දශක තුනක් තුලදී ප්‍රදේශයට සංක්‍රමණය වී ඇත. මෙම සංක්‍රමිකයන් ප්‍රධාන වශයෙන්ම කුරුණෑගල, අනුරාධපුර, කොළඹ, නුවර, ගාල්ල සහ කෑගල්ල දිස්ත්‍රික්ක වලින් පැමිණි අය වූහ. සංවර්ධන ප්‍රදේශ වශයෙන් සලකා බැලූ විට එනම් ප්‍රදේශ අංක 6 හි ගෘහමූලිකයන්ගෙන් 68% ක් ද ප්‍රදේශ අංක 5 හි 44% ක්ද ප්‍රදේශ 7 හි 34% ක්ද, ප්‍රදේශ අංක 8 හි 26% ක්ද, එම ප්‍රදේශ වලට ආ සංක්‍රමණිකයන් වේ. මුළු අධ්‍යයනය ප්‍රදේශය තුල වැසියන් මුළු මනින්ම සිංහල බෞද්ධයන් වූහ.

මූලික පුරා විද්‍යාත්මක සාධක වලින් සමහරෙක් පිළිබඳව විස්තර පහත 3.1 වගුවේ දක්වා ඇත.

3.1 වගුව: නියැදි ගෘහයන්ගේ මූලික ජනගහණ සාධක

| ජනගහණ ලක්ෂණ | ප්‍රදේශ අංක 5 | 6 | 7 | 8 | නියැදියේ සියළුම ප්‍රදේශවල |
|---|---|---|---|---|---|
| කුටුම්භයක සාමාන්‍ය ප්‍රමාණය | 6.0 | 6.2 | 5.6 | 5.7 | 5.9 |
| පවුලක සාමාන්‍ය ප්‍රමාණය | 5.3 | 5.7 | 5.1 | 5.2 | 5.3 |
| ස්ත්‍රී පුරුෂ අනුපාතය (ස්ත්‍රීන් 100 කට පුරුෂ ප්‍රමාණය) | 95.8 | 100.0 | 118.2 | 91.7 | 100.0 |
| පුද්ගලයින් 1000 ට උපත් අනුපාතය | 32.0 | 29.8 | 17.6 | 25.4 | 27.4 |
| පුද්ගලයින් 1000 ට මරණ අනුපාතය | 4.7 | 2.6 | 8.8 | 3.4 | 4.7 |
| පුද්ගලයින් 1000 ට ස්වාභාවික වැඩිවීමේ අනුපාතය | 27.3 | 27.2 | 8.8 | 22.0 | 22.7 |

අධ්‍යයන ප්‍රදේශය තුළ කුටුම්භයක සාමාන්‍ය සාමාජික ප්‍රමාණය පුද්ගලයන් 5.9 ක් වන අතර මෙම අගය සම්පූර්ණයෙන්ම වාගේ, 1973 "ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය" පිළිබඳ සමීක්ෂණයේදී වියලි කලාපයේ ග්‍රාමීය අංශයේ කුටුම්භයක දක්නට ලැබුණු ප්‍රමාණයට සමානය. ස්වාභාවික ජනගහණ වැඩිවීමේ අනුපාතය ලෙස දක්නට ලැබෙන්නේ පුද්ගලයන් 1000 ට 22.7 කි. මෙම අනුපාතය අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුපාතය වන 31.4 ට වඩා සැලකිය යුතු තරම් පහත්ය. මෙයට හේතුව අධ්‍යයන ප්‍රදේශය තුළ උපත් අනුපාතය පහත වැටී ඇති නමුත් මරණ අනුපාතය සාමාන්‍ය අයුරින්ම පැවතීමය. මෙහිලා සැලකිය යුතු විශේෂ ලක්ෂණයක් වන්නේ සංවර්ධන ප්‍රදේශ අංක 7 තුළ දක්නට ලැබෙන අඩු, එනම්, 1000 කට 8.8 වන ස්වාභාවික ජනගහණ වර්ධනයයි. මෙම ප්‍රදේශය බහුල වශයෙන්ම වගා නොකල ඉඩම් වලින් ගහණ, අඩු ජනගහණයකින් යුක්ත වන අතර එහි ස්ත්‍රී පුරුෂ අනුපාතය 100:118 ක් වේ. මේ අනුව මෙම ප්‍රදේශයේ අඩු ජනගහණ වර්ධනයට හේතු වන සාධක අතුරින් ඉහල මරණ අනුපාතය මෙන්ම පුරුෂ සංඛ්‍යාව අධික බවද වැදගත් ලක්ෂණයක් බව පෙනේ. සංවර්ධන ප්‍රදේශ අංක 5 සහ 8 හි ජනගහණ ලක්ෂණයන් පෙන්වන පරිදි, එහි ස්ත්‍රී සංඛ්‍යාව, පුරුෂ සංඛ්‍යාවට වඩා වැඩි බවයි පෙන්නුම් කෙරේ. මෙම ලක්ෂණය අනාගත ශ්‍රම හමුදාවේ සැපයුම් තත්වයනට බලපෑම් කල හැකි එක් සාධකයක් විය හැක.

3.1.1 වයස් සංයුතිය හා යැපුම් තත්වය.

ජනපදිකයින්ගේ වයස් පිළිබඳ විශ්ලේෂණයකදී පැහැදිලිවම ඉස්මතුව පෙනෙන අංගයක් ලෙස එහි ලාබාල බව දක්නට ලැබේ. අවුරුදු 25 ට අඩු අය මුලු ජනගහණයෙන් 67% ක් වන අතර වයස අවුරුදු 14 ට අඩු ළමුන් 40% ක් පමණ වේ. සාමාන්‍යයෙන් වැඩෙහි යෙදිය හැකි කාල සීමාව වන අවුරුදු 14–65 අතර පුද්ගලයින්ගේ අනුපාතය මුලු ජනගහණයෙන් 58% ක් පමණ වේ.


3.2 වගුව සියැදි ඇටුම්හවල වයස් සංයුතිය සහ එහි යැපුම් අනුපාතය


| ප්‍රදේශය | වයස් කාණ්ඩ | | | | | |
|---|---|---|---|---|---|---|
| | සියළුම වයස් (%) | 0–13 (%) | 14–25 (%) | 26–65 (%) | 66 සහ රට වැඩි (%) | යැපුම් අනුපාතය |
| සියළුම ප්‍රදේශවල | 100.00 | 39.4 | 27.6 | 30.1 | 2.9 | 0.73 |
| ප්‍රදේශ අංක 5 | 100.00 | 38.3 | 27.6 | 31.3 | 2.9 | 0.69 |
| ප්‍රදේශ අංක 6 | 100.00 | 42.1 | 26.4 | 28.6 | 2.9 | 0.81 |
| ප්‍රදේශ අංක 7 | 100.00 | 36.4 | 28.9 | 30.5 | 4.2 | 0.65 |
| ප්‍රදේශ අංක 8 | 100.00 | 41.8 | 27.1 | 29.4 | 1.7 | 0.76 |


මෙවැනි ලාබාල ජනගහණය පැවැත්මක් තුලින් වැදගත් අංග කීපයක් මතු විය හැක. මේවා අතුරින් වැඩි මහලු (අවු 14–65)–බාල(අවු 14 ට අඩු) අය අතර ඇති අනුපාතය වන 100:73 වැදගත් වේ. මේ අනුව වැඩෙහියෙදිය හැකි වයසේ සිටින එනම් අවු 14 සිට 65 අතර සුලු ප්‍රමාණයකට, ඔවුන්ට වඩා ලාබාල සහ වැඩි මහලු උදවිය විශාල ප්‍රමාණයක් නඩත්තු කිරීමේ ගැටලුවට මුහුණ දීමට සිදුව ඇත. ජනගහනයේ ඇති ළමා වයස් සීමාවන් තුල සිටින අයගේ අධික අනුපාතය හේතුවෙන් මෙම ප්‍රදේශයට අදාල සැලසුම් සකස් කිරීමේදී ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය, ළමා ශුභ සාධක ආදී පහසුකම් වලට වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.


අධ්‍යයනය කරන ලද සංවර්ධන ප්‍රදේශ හතරෙහි, වයස් පිරමීඩ 3 වන සටහනෙහි දැක්වේ. සංක්‍රමණ වලින් උපත් හා මරණ සංඛ්‍යාවල වැඩි වෙනස්කම් නොදක්වන සාමාන්‍ය ජනගහණයක් සඳහා පිළියෙල කරන ලද මෙවැනි පිරමීඩයක, හැඩය එහි මුදුනට යද්දී ඒකාකාරව අඩු විය යුතුය. එනමුත් මෙම ජනගහණය සඳහා අඳින ලද පිරමීඩ මෙවැනි ලක්ෂණයක් නොපෙන්වීමෙන් හැගෙන්නේ සෑහෙන ප්‍රමාණයක සංක්‍රමණයක් හා උපත්–මරණ සංඛ්‍යාවේ වෙනසක් සිදු වී ඇති බවයි.


ග්‍රාමීය සාමාජිකයන්ගේ වයස් ව්‍යුහය



## 3.2 නිවාස පහසුකම්

පළාතේ දැනට ඇති නිවාස වලින් කොටසක් කටු මැටි බිත්ති හා ස්ථිර සෙවිල්ලක් නැති වහල වලින් යුක්ත වන අතර ගඩොලින් බැඳි උළු සෙවිලි කළ නිවාස මුළු නිවෙස් ප්‍රමාණයෙන් පහෙන් එක් කොටසක් පමණ වේ. ප්‍රදේශයේ නිවාස වලින් වැඩි කොටසක් තනි කාමරයකින් යුක්ත ඒවා වේ. විදුලි බල පහසුකම් ලබා ඇත්තේ නිවෙස් වලින් 3% ක පමණ ප්‍රමාණයකි. මේවා පිහිටා ඇත්තේ තලාව, එප්පාවල, කොච්චියාගම, තඹුත්තේගම ආදී ස්ථානයන්ට ආසන්නවය.

## 3.3 වගුව

නිවාස වල ස්වභාවය

| නිවාස වල ස්වභාවය සහ ලබා ඇති පහසුකම් | ප්‍රදේශ අංක 5 සංඛ්‍යාව | % | 6 සංඛ්‍යාව | % | 7 සංඛ්‍යාව | % | 8 සංඛ්‍යාව | % | සියළු ප්‍රදේශ සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථිර බිත්ති සහිත නිවාස | 35 | 19 | 26 | 21 | 26 | 25 | 19 | 18 | 106 | 21 |
| ස්ථිර වහල සහිත නිවාස | 37 | 21 | 22 | 18 | 27 | 26 | 17 | 16 | 103 | 20 |
| වෙනම මුළුතැන් ගෙයක් නැති නිවාස | 138 | 77 | 96 | 77 | 76 | 74 | 69 | 66 | 379 | 74 |
| ළඟටම අයිති ළිඳක් ඇති නිවාස | 59 | 33 | 40 | 32 | 25 | 24 | 37 | 36 | 161 | 31 |
| වැසිකිලි පහසුකම් ඇති නිවාස | 58 | 32 | 49 | 39 | 27 | 26 | 17 | 16 | 151 | 29 |
| විදුලි බල පහසුකම් ඇති නිවාස | 4 | 2 | 2 | 2 | 2 | 2 | 7 | 7 | 15 | 3 |
| මෝටර් රථ හෝ කරත්ත පාරකින් ලගා විය හැකි නිවාස | 147 | 82 | 99 | 79 | 83 | 81 | 86 | 83 | 415 | 81 |

සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් අතින්ද දුර්වල තත්වයක් දක්නට ලැබේ. පළාතේ ගෘහයන්ගෙන් වැසිකිලි පහසුකම් ඇත්තේ 30% කට පමණය. ප්‍රදේශ අංක 8 මෙම අංශයෙන් ඉතාමත්ම දුර්වල වන අතර, වැසිකිලි පහසුකම් ඇතැයි වාර්තා කර තිබුනේ 16% පමණි. බීමට ගන්නා ජලය ළිං මගින් සපයා ගන්නා බව වාර්තා කළ 95% කගෙන් තමන්ගේම ළිඳක් ඇත්තේ තුනෙන් එක් කොටසකට පමණි. නෑම සඳහා බොහෝ විට දැනට යොදා ගැනෙනුයේ වැව්ය.

3.3 සේවා මධ්‍යස්ථාන හා ඒවායේ සමීපතාවය

පළාතේ ඇති සේවා මධ්‍යස්ථාන හා ගොවීන්ගේ සම්බන්ධතාවන්ට බල පෑ හැකි වැදගත් සාධකයක් වශයෙන් නිවාස හා ඒවා අතර ඇති දුර ප්‍රමාණය වැදගත් වේ. උප ග්‍රන්ථය අංක 3 මගින් දැක්වෙන පරිදි නිවෙස් වලින් 81% ක් පමණ වාහන යාහැකි පාරවල් වලින් යුක්තය. පළාතේ නිවෙස් වලින් 84% ක් බස් රථ මාර්ගයකට සැතපුම් එකකට අඩු දුරකින් පිහිටා ඇත. සියළුම නිවෙස් බස් රථ මාර්ගයකට සැතපුම් 5 කට අඩු දුර ප්‍රමාණයකින් පිහිටා ඇත. අධ්‍යයන ප්‍රදේශය තුල අලුවව හා පඹුරැහේගම යන දුම්රිය ස්ථාන දෙකක් පිහිටා ඇත. දුම්රිය ස්ථානයකට වඩාත්ම දුරින් පිහිටා ඇත්තේ සංවර්ධන ප්‍රදේශ අංක 5 වන අතර මෙහි නිවෙස්වලින් හතරෙන් තුනක්ම දුම්රිය ස්ථානයකට සැතපුම් 5 කට වඩා දුරකින් පිහිටා ඇත.

3.4 වගුව. මූලික සේවා පහසුකම් සපයන ස්ථානයන්ට ඇති දුර ප්‍රමාණය අනුව නිවෙස් වල ප්‍රතිශතක ව්‍යාප්තිය

| සේවා මධ්‍යස්ථාන | ගෘහයන්ගේ ප්‍රතිශතය සැතපුම් 1 ඇතුලත පිහිටි (%) | සැතපුම් 5 ක් ඇතුලත පිහිටි (%) |
|---|---|---|
| පාසැල | 78 | 100 |
| රෝහල/ඩිස්පෙන්සරිය | 36 | 98 |
| තැපැල් කාර්යාලය | 37 | 96 |
| සමුපකාරය | 63 | 100 |
| වෙළඳ මධ්‍යස්ථානය | 44 | 92 |
| බස් රථ මාර්ගය | 84 | 100 |

ඉහතින් දැක්වෙන දත්තයන්ට අනුව අධ්‍යයන ප්‍රදේශයේ නිවැසියනට මූලික සේවා මධ්‍යස්ථාන වලට ලඟා වීමට ඇති හැකියාව සියළුම සංවර්ධන ප්‍රදේශයන්හි සතුටුදායක තත්වයක පවතින බව පෙනේ. එසේ වුවද බැංකු පහසුකම්, පොලිස් ස්ථාන සහ ග්‍රාමීය පොළ වැනි ස්ථාන සම්බන්ධයෙන් ප්‍රාදේශීය වෙනස්කම් දක්නට ලැබේ. අධ්‍යයන ප්‍රදේශයේ නිවාස වලින් හතරෙන් එකක් බැංකුවකට සැතපුම් 5 ක් ඇතුලත පිහිටා ඇති නමුත් ප්‍රදේශ අංක 6 සහ 7 හි නිවෙස් වලින් තුනෙන් එක්කොටසකට බැංකුවක් කරා යාමට සැතපුම් 10 ක් පමණ ගමන් කළ යුතුවේ. අධ්‍යයන ප්‍රදේශයේ අංක 6 සහ 8 ප්‍රදේශ තුල පොලිස් ස්ථාන දෙකක් දක්නට ලැබේ.

3.4 ගෘහ භාණ්ඩ අයිතිය

ගුවන් විදුලි යන්ත්‍ර, මහන මැෂින්, බයිසිකල් වල අයිතිය යම් අවස්ථා

වලදී කුටුම්භයේ ආර්ථිකය මට්ටම නිදහාලන මාධ්‍යයක් වශයෙන් යොදාගත හැකිවේ. පහත දැක්වෙන වගුවෙන් මෙවැනි භාණ්ඩයන් අයිතියේ ස්වභාවය වටහා ගත හැක. මෙවැනි ඒකකයන් පෙන්වන පරිදි සංවර්ධන ප්‍රදේශ අංක 6 සහ 7 වල නිවෙසියන් ප්‍රදේශ අංක 8 සිටින්නවුන්ට වඩා දියුණු ආර්ථික මට්ටමක ඇති බව පෙනේ.

3.5 වගුව . සංවර්ධන ප්‍රදේශ අනුව ගෘහ භාණ්ඩ යනාදිය අයිතියේ ව්‍යාප්තිය

| භාණ්ඩ | නිවාස 100 කට සඳහා ඇති භාණ්ඩ සංවර්ධන ප්‍රදේශ | | | | |
|---|---|---|---|---|---|
| | 5 | 6 | 7 | 8 | සියලු ප්‍රදේශ |
| බිත්ති ඔරලෝසු | 21 | 22 | 23 | 15 | 20 |
| පැට්රෝම් මැක්ස් ලාම්පු | 27 | 38 | 39 | 23 | 31 |
| රේඩියෝ | 43 | 51 | 50 | 34 | 45 |
| මහන මැෂින් | 23 | 27 | 23 | 22 | 24 |
| භූමි තෙල් උදුන් | 4 | 4 | 8 | 3 | 5 |
| අල්මාරි | 23 | 23 | 29 | 18 | 23 |
| විසිත්ත කාමර කට්ටල (කෑබැලි 3 ට වැඩි) | 31 | 38 | 34 | 25 | 32 |
| බයිසිකල් | 52 | 52 | 43 | 40 | 48 |
| කරත්ත | 9 | 18 | 12 | 5 | 11 |
| මෝටර් බයිසිකල් | 1 | 2 | -- | -- | 2 |
| ලොරි | 1 | 1 | 2 | -- | 1 |
| කාර් | 2 | 2 | 1 | -- | 1 |

* ඉරි මඟ දැක්වෙන සංඛ්‍යා ප්‍රදේශ අතුරින් වැඩිම අගය දක්වයි.

3.5 ගොවි උපකරණ වල අයිතිය

3.6 ලබාගත් දත්තයන්ට අනුව ගොවීන්ට හිමි ගොවි උපකරණ ප්‍රමාණය ඉතා අල්ප බව පෙනීයන අතර බොහෝ විට ඒවා අයිතිය සීමා වී තිබුණේ උදලු වලට හා නගුල් වලට පමණි. කෘමිනාශක දියර ඉසින යන්ත්‍ර හිමිව තිබුණේ නිවෙස් 25 කට පමණක් වන අතර ට්‍රැක්ටර් හිමිව ඇත්තේ ගෘහයන්ගෙන් 1% කටය.

3.6 වගුව: ගොවි උපකරණ අයිතියේ ප්‍රතිශතක ව්‍යාප්තිය

| ගොවිපල උපකරණ | සංවර්ධන ප්‍රදේශ 5 | 6 | 7 | 8 | සියළු ප්‍රදේශ |
|---|---|---|---|---|---|
| | (කුටුම්භයන් 100 කට ප්‍රමාණය) | | | | |
| උදලු | 213 | 244 | 215 | 234 | 225 |
| නගුල් | 66 | 29 | 51 | 42 | 49 |
| ස්ප්‍රේයර්/ඩස්ටර් | 5 | 2 | 6 | 2 | 4 |
| ට්‍රැක්ටර් (රෝද 4) | 2 | — | 2 | 1 | 1 |
| ට්‍රැක්ටර් (රෝද 2) | 2 | 1 | — | — | 1 |
| වතුර පොම්ප | 4 | 1 | 2 | — | 2 |

3.6 සත්ව පාලන කටයුතු

සත්ව පාලන කටයුතු ප්‍රධාන ගොවිතැන් කටයුතු සඳහා ඇති කරන මී හරකුන්ට පමණක් සීමා වී ඇත. වාණිජමය මට්ටමින් කෙරෙන සත්ව පාලන කටයුතු මෙම ප්‍රදේශයේ දක්නට නොලැබේ. (වගුව 3.7) කුකුලන් ඇති කිරීම, කිරි සඳහා හරකුන් ඇති කිරීම හා ඌරන් ඇති කිරීම වැනි කටයුතු විරලය. කෘෂිකාර්මික කටයුතු වලින් ලබන ආදායම වැඩි දියුණු කිරීමේ එක් මාධ්‍යයක් වශයෙන් සත්ව නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම ඉතා වැදගත් කොට සැලකිය යුතු වේ. මෙහිදී එයට අදාල අලෙවි පහසුකම් ආදියේ ඇති අඩු පාඩු ඉවත් කොට කාර්යක්ෂම ව්‍යාප්ති සේවාවක් සැලසීම වැදගත් ක්‍රියා මාර්ගයක් වනු ඇත.

3.7 වගුව: පශු සම්පත් අයිතියේ ව්‍යාප්තිය

| | සංවර්ධන ප්‍රදේශ 5 | 6 | 7 | 8 | සියළු ප්‍රදේශ |
|---|---|---|---|---|---|
| | (නිවාස 100 ට අයිති ප්‍රමාණය) | | | | |
| ගොනුන් | 23 | 2 | 11 | 18 | 20 |
| එළදෙනුන් | 15 | 19 | 90 | 29 | 34 |
| මී හරක් | 63 | 64 | 78 | 32 | 60 |
| එලුවන් | 6 | 3 | 6 | – | 4 |
| ඌරන් | 3 | – | – | – | 1 |
| කුකුලන් | 43 | 120 | 26 | 14 | 53 |

## 4. ශ්‍රම බලකාය, ක්‍රියා නියුක්තිය, සහ ආදායම

අධ්‍යයන ප්‍රදේශයේ ගෘහයන් අතර ශ්‍රම බලකායේ හෝ රැකියා මෙන්ම ක්‍රියා නියුක්තියේ විශේෂතා සහ ආදායම් තත්වය පරීක්ෂා කිරීම පිණිස මෙම පරිච්ඡේදය මූලික වශයෙන් අවධානය යොමු කර ඇත.

### 4.1 වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහණ සංයුතිය

අධ්‍යයන ප්‍රදේශයේ මුළු ජනගහණය 3033 ක් වූ අතර ඉන් හරි අඩක්ම පිරිමින් වූහ. (උප ග්‍රන්ථය අංක 2) මුලින් දක්වා තිබූ පරිදි ජනගහණයෙන් 58% ක පමණ ප්‍රමාණයක් අවුරුදු 14–65 අතර වයස් කාණ්ඩයෙන් සමන්විත වූහ. මෙම තත්වය යටතේ ප්‍රදේශයේ ජන ගහණය රටේ අනෙක් ප්‍රදේශවල මෙන් විශාල වශයෙන් ලාබාල පිරිසකගෙන් යුක්ත වන බව පැහැදිලි වේ. ප්‍රදේශයට අයත් ජනගහණයේ මේ අන්දමින් වයසින් අඩු ජන කොටස්වල අධික බව හේතුවෙන් සංවර්ධන කාර්යයේදී යම් යම් වෙනස් කිරීම් ඇති කර වීමට හේතු වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. මේ පිළිබඳව නිදසුනක් වශයෙන් ප්‍රදේශයේ ශ්‍රම ඉල්ලුම් සැපයුම් තත්වයන් හා මෙම තරුණ ජන කොට්ඨාශය අතර ඇතිසම්බන්ධතාවය දැක්විය හැක. කෘෂිකාර්මික කටයුතු සඳහා සේවය ලබා ගත හැකි වැඩිහිටියන්ගේ සංඛ්‍යාව ප්‍රදේශයේ මුළු ජනගහණයෙන් භාගයක් පමණ වේ. එමෙන්ම අධ්‍යාපන, සෞඛ්‍ය පෝෂණ ආදි සුභ සාධක සේවාවන් සඳහා සැලසුම් පිළියෙල කිරීමේදී පළාතේ මෙම ලාබාල ජනගහණය පිළිබඳව සැලකිලිමත් වීමද වැදගත් කරුණක් වේ.

### 4.2 අධ්‍යාපනික තත්වය.

ප්‍රදේශයේ පදිංචි කරුවන්ගෙන් 70% කටත් වැඩි පිරිසකට කියවීමට මෙන්ම ලිවීමට හැකියාවක් ඇත. විශේෂයෙන්ම තරුණ පෙළ අතර කියවීමේ ලිවීමේ හැකියාව මෙයටත් වඩා උසස් මට්ටමක පවතින බැව් පෙනී යයි. වයස අවුරුදු පහ(5)ට වඩා වැඩි පුද්ගලයින්ගෙන් 86% ක් පමණ දැනට පාසැල් යමින් හෝ පාසැල් යාම අවසන් කොට ඇති බව අධ්‍යයනයේදී ලැබුණු තොරතුරු වලින් හෙළි වේ. පාසැල් අධ්‍යාපනයක් කවරදාකවත් නොලැබූ අයගෙන් අඩක් පමණ ප්‍රමාණයක් අවුරුදු 30 හෝ ඊට වැඩි වයස් කාණ්ඩයේ අය වූ අතර ඉන් තුනෙන් දෙකක්ම ගැහැණු අය වූහ. පළාතේ ජනගහණයෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඊට වඩා ඉහළ විභාගයකින් සමත් වී තිබුනේ 8% කටත් අඩු ප්‍රමාණයකි.

4.1 වගුව ජනගහණයේ අධ්‍යාපනික මට්ටම්වල ව්‍යාප්තිය

| අධ්‍යාපන මට්ටම | ප්‍රදේශ අංක 5 | 6 | 7 | 8 | සියළු ප්‍රදේශ |
|---|---|---|---|---|---|
| පාසැල් නොගිය (%) | 15.5 | 14.8 | 12.6 | 13.1 | 14.3 |
| 5 ශ්‍රේණියට පහළ (%) | 63.0 | 64.4 | 54.6 | 62.9 | 61.8 |
| 6 වැනි ශ්‍රේණියේ සිට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා (%) | 12.8 | 13.7 | 22.4 | 17.0 | 15.6 |
| අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත් සහ ඉන් ඉහල (%) | 8.7 | 7.1 | 10.4 | 7.0 | 8.3 |

4.3 වයස් කාණ්ඩ අනුව පාසැල් යාමේ අනුපාතිකය

මුළු ජනගහනයට සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකක් පමණ දැනට පාසැල් අධ්‍යාපනය ලබති. වයස අවුරුදු 14-30 අතර වයස් කාණ්ඩයේ අයගෙන් 92% ක් පමණ විධිමත් අධ්‍යාපනයක් ලබා තිබූ බව අධ්‍යාපනයේ දත්ත මගින් හෙළි වේ. දැනට පාසැල් යායුතු වයසේ සිටින පුද්ගලයින් සලකා බැලූ විට ඔවුන්ගේ වයස් මට්ටම ක්‍රමයෙන් වැඩි වන විට පාසැල් යමින් සිටින අයගේ සංඛ්‍යාව පහළ බසින බව පැහැදිලිව පෙනේ. උදාහරණයක් වශයෙන් අධ්‍යයන ප්‍රදේශය තුල වයස් අවුරුදු 12-14 ළමුන්ගේ 32% ක්ම දැනට පාසැල් නොයති. ඊළඟ වයස් කාණ්ඩය වූ අවුරුදු 15-17 දී මෙම අනුපාතය 56% තරම් ඉහළ ජනගහණයෙට් වැඩි පිරිසක්ම තම පාසැල් අධ්‍යාපනය ලැබීමේ කාලසීමාව ඉතා ඉක්මනින් අවසන් කිරීමට හේතු සාධක වන කරුණු අතර, පවුලේ ඇති දිළිඳු ආර්ථික තත්වය සමග ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික පහසුකම් ප්‍රමාණවත් නොවීමද වැදගත් තැනක් ගනී. ගොවිපල වල බිම් සැකසීම, වැපිරීම හා අස්වනු නෙලීම වැනි කෘෂිකාර්මික වගා කටයුතු වැඩි වශයෙන්ම සිදුවන කාල සීමාව තුලදීද සිසුන් පාසැලට පැමිණීම හාවකාලිකව අඩු වීමක් පෙන්නුම් කරයි. මෙම කාලාන්තරය තුලදී ගොවිපවුල් වල ළමා සාමාජිකයන් කෘෂිකාර්මික කටයුතු සඳහා තම දෙමාපියන්ට සහාය වේ. එමෙන්ම පාසැල් යාම සම්බන්ධයෙන් ස්ත්‍රී-පුරුෂ වශයෙන් එතරම් වෙනස් කමක් නොපෙනේ.

---

1. සංවර්ධිත කලාප අනුව අධ්‍යාපන ව්‍යුහයේ ව්‍යාප්තිය, උපග්‍රන්ථය අංක 4 අදාල වගු 4 මගින් දක්වා ඇත.

4.2 වගුව පාසැල් යන්නන්ගේ සංඛ්‍යාව වයස් කාණ්ඩවලට හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව බෙදී යාම

| වයස් කාණ්ඩය | පිරිමි | | ගැහැණු | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | මුළු ප්‍රමාණය | පාසැල් යන අයගේ ප්‍රතිශතය% | ප්‍රමාණය | පාසැල් යන අයගේ ප්‍රතිශතය% | මුළු ගණන | පාසැල් යන අයගේ ප්‍රතිශතය% |
| අවු: 6 ට අඩු | 235 | 10 | 236 | 9 | 471 | 9 |
| 6 – 8 | 133 | 88 | 150 | 73 | 283 | 88 |
| 9 – 11 | 115 | 87 | 11 | 84 | 231 | 85 |
| 12 – 14 | 136 | 70 | 142 | 65 | 278 | 68 |
| 15 – 17 | 98 | 47 | 113 | 42 | 211 | 44 |
| 18 – 20 | 150 | 19 | 137 | 13 | 287 | 16 |
| 21 – 23 | 85 | 4 | 79 | 6 | 164 | 5 |
| සියළු වයස් කාණ්ඩ | 1516 | 27 | 1517 | 27 | 3033 | 27 |

4.4 ශ්‍රම බලකාය

පාසැල් සිසුන්, රෝගීන්, අංග විකල හා එවැනි අය හැර වයස අවුරුදු 14 – 65 අතර සියලුම දෙනා ඇතුලත් වන ශ්‍රම බලකාය පිළිබඳව කළ විග්‍රහයක් පහත දැක්වේ. එහි මගින් හෙළිවන පරිදි සාමාන්‍ය වශයෙන් ගෘහස්ථ සාමාජිකයින්ගෙන් 58% ක් ශ්‍රම හමුදාව නියෝජනය කරයි.

| | | පුද්ගලයින් සංඛ්‍යාව | % ගණන |
|---|---|---|---|
| පවුලක සාමාජික සංඛ්‍යාවේ සාමාන්‍යය | | 5.9 | 100 |
| ශ්‍රම බලකායට අයත් ප්‍රමාණය | | 3.4 | 58 |
| ශ්‍රම බලකායට අයත් | පිරිමි | 1.7 | 29 |
| | ගැහැණු | 1.7 | 29 |

ශ්‍රම බලකාය පිළිබඳව තව දුරටත් විමසා බැලීමේදී වයස් සංයුතිය අනුව එහි ව්‍යාප්තිය පහත දැක්වෙන පරිදි වේ. (4.3 වගුව)

4.3 වගුව වයස් කාණ්ඩ අනුව ශ්‍රම බලකායේ ව්‍යාප්තිය

| වයස් කාණ්ඩය (අවුරුදු) | පිරිමි | | ගැහැණු | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 14 – 19 | 240 | 27 | 239 | 28 | 479 | 28 |
| 20 – 25 | 173 | 20 | 183 | 21 | 356 | 20 |
| 26 – 35 | 168 | 19 | 188 | 22 | 356 | 20 |
| 36 – 45 | 139 | 16 | 138 | 16 | 277 | 16 |
| 46 – 55 | 105 | 12 | 73 | 8 | 178 | 10 |
| 56 – 65 | 57 | 6 | 45 | 5 | 102 | 6 |
| එකතුව | 882 | 100 | 866 | 100 | 1748 | 100 |

ශ්‍රම බලකායේ කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස තරුණ ශ්‍රම ප්‍රමාණය සැලකිය යුතු පරිදි ඉහළ මට්ටමක පැවතීම දත්ත ආශ්‍රයෙන් දැක්විය හැක. අධ්‍යයන ප්‍රදේශය තුළ මුළු මිනිස් බල ප්‍රමාණයෙන් අඩක් පමණ වයස 14–65 අතර පුද්ගලයින්ගෙන් යුක්ත වන අතර මෙයින් 28% ක් පමණ වයස අවුරුදු 14–19 වයස් කාණ්ඩයට අයත් වේ. වයස් කාණ්ඩ අනුව සලකා බැලීමේදී අවුරුදු 35 ට ඉහළ වයස් කාණ්ඩයට අයත් වන ශ්‍රම ප්‍රමාණය, ප්‍රදේශයේ මුළු ශ්‍රම ප්‍රමාණයෙන් තුනෙන් එකක් පමණ වේ. මෙවැනි තරුණ වයස් කාණ්ඩ වලින් බොහෝ වශයෙන් සමන්විත සමාජයක් විසින් සාමාන්‍යයෙන් නවීන සමාජ රටාවන් කෙරෙහි දක්වන නැඹුරුතාවය අනුව, ඔවුන් තුළ පාරම්පරික සමාජයක ඇති අදහස් හා අපේක්ෂාවන්ට වඩා වෙනස් ආකාරයේ අරමුණු හා අපේක්ෂාවන් ඇති බව නොරහසකි. එම නිසා මෙම ජනගහණයට අවශ්‍ය රැකියා පහසුකම් ලබා දීම සඳහා සැලසුම් පිළියෙල කිරීමේදී මෙම තත්වය ගැනද සැලකිලිමත් වීම වැදගත් වේ.

ශ්‍රම බලකාය පිළිබඳව තව දුරටත් විග්‍රහ කිරීමේදී ආර්ථික වශයෙන් ක්‍රියාකරී හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන යනුවෙන් තවත් උප ප්‍රභේද 2 ක් යටතේ අධ්‍යයනය කරන ලදී. ප්‍රදේශය තුළ නිෂ්පාදන කටයුතු හා සේවාවන් සඳහා යොදවා ගත හැකි අවුරුදු 14–65 අතර ගැහැණු පිරිමි දෙකොටසම පළමු උප ප්‍රභේදයට අයත් වේ. දෙවන උප ප්‍රභේදයට අයත් වන්නේ ආර්ථිකමය නොවන සේවාවන්හි නියුක්ත ගෘහනියන් පාසැල් සිසුන්, භික්ෂූන් සහ අංග විකල ආදී රෝගී අයයි.

මෙම විශ්ලේෂණයේදී රැකියා නැති පුද්ගලයින්ද ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරී කොටසට ඇතුලත් කළ අතර, එසේ ඇතුළත් කරන ලද්දේ සමීක්ෂණ කාල සීමාවේදී රැකියා විරහිතව සිටි පිරිසත් මුල් රැකියාව අහිමි වූ හෝ ඒ වන විට රැකියාවක් අපේක්ෂාවෙන් සිටි අයයි.

4.4 වගුව

අධ්‍යයන ප්‍රදේශයේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන ජනගහණය

| වර්ගය | පිරිමි සංඛ්‍යාව | % | ගැහැණු සංඛ්‍යාව | % | මුළු එකතුව සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|
| **ආර්ථිකමය ක්‍රියාකාරී:** | | | | | | |
| ආදායම් උපයන්නන් | 498 | 33 | 50 | 3 | 548 | 18 |
| ආදායම් උපයන්නන් නොවන | 180 | 12 | 12 | 5 | 256 | 4 |
| රැකියා විරහිත | 75 | 5 | 121 | 8 | 196 | 7 |
| ආර්ථිකමය ක්‍රියාකාරී නොවන | | | | | | |
| ගෘහනියන් සහ ගෘහ සහායකයින් | ---- | -- | 502 | 33 | 502 | 16 |
| පාසැල් සිසුන් | 414 | 27 | 412 | 27 | 826 | 26 |
| වෙනත් (රෝගීන්, මහලු අය ආදීන්) | 349 | 23 | 356 | 24 | 705 | 23 |
| මුළු සංඛ්‍යාව | 1516 | 100 | 1517 | 100 | 3033 | 100 |

ජනගහණයේ ආර්ථිකමය ක්‍රියාකාරී අංශයෙහි ඇති ප්‍රධාන වැදගත් ලක්ෂණයක් ලෙස එය ශ්‍රම සැපයුම් අංශය සමග විශේෂ සම්බන්ධතාවයක් දැක්විය හැකි අතර එමගින් නිෂ්පාදන හා සේවා කටයුතු සඳහා ලබාගත හැකි පුද්ගලයින්ගේ ශ්‍රමය ගැන අවබෝධයක් ලබා ගත හැක. අත්ත මගින් දැක්වෙන **පරිදි** පිරිමිජනගහණයෙන් 50% කට ආසන්න සංඛ්‍යාවක් ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරී කොටසට අයත් වන අතර මෙම කොටසට අයත් වන ස්ත්‍රීන් ගේ සංඛ්‍යාව 16% තරම් පහළ අගයක් ගනී. ස්ත්‍රී ජනගහණයෙහි දක්නට ඇති මෙම ආර්ථිකමය වශයෙන් ඇති පහත් අනුපාතය සැලකිල්ලට භාජනය **කිරීම** වැදගත් වේ. ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශයක තත්වය විදහා දක්වමින් මෙම ගෘහයන්හි ස්ත්‍රීන් ප්‍රධාන වශයෙන් ගෘහනියන් සහ ගෘහ සහායිකාවන් ලෙස සේවා නියුක්ත වී සිටිති. නමුත් ශ්‍රමය සඳහා ඉහළම ඉල්ලුමක් පවතින ගොවිතැන් කාළ සීමාවන් තුලදී ඔව්හු කුලී ශ්‍රමිකයන් ලෙසද සේවයයේ යෙදෙති. අධ්‍යයන ප්‍රදේශයේ ජනගහණයෙන් ආදායම් උපයන්නන්ගේ ප්‍රමාණය පහෙන් එකක්වන නිසා ඉතිරි පෝෂිතයන්ගේ ප්‍රමාණය එම ආදායම් උපයන සුළු පිරිසගෙන් පෝෂණය විය යුතු වේ. (4.4 වගුව) තව දුරටත් සලකා බැලීමේදී ප්‍රදේශය තුල ආදායම් උපයන පිරිස අතරින් වැඩි කොටසක්ම පිරිමි අය වූහ. ස්ත්‍රීන් අතරින් ආදායම් උපයන්නන් ලෙස වාර්තා කර තිබුනේ 3% ක තරම් අඩු ප්‍රමාණයකි.

අධ්‍යයන ප්‍රදේශය තුළ සම්පූර්ණ රැකියා විරහිත ප්‍රමාණය 7% ක් විය. ස්ත්‍රී පුරුෂ වශයෙන් බලන විට එය පිළිවෙලින් 8% හා 5% වේ. ඊ අනුව පිරිමි අය අතර ඇති රැකියා වියුක්තිය ස්ත්‍රී අය අතර ඇති රැකියා වියුක්තියට වඩා පහළ අගයක් ගනී. කෙසේ වුවත් ප්‍රදේශයේ දැනට පවතින කෘෂි කාර්මික සමාජයේ දක්නට ඇති කාලීන රැකියා වියුක්තිය මෙයට ඇතුලත් වී නැති බැවින් මෙම තක්සේරුව රැකියා වියුක්ත ජනගහනය සම්පූර්ණයෙන් පිළිබිඹු කිරීමක් නො වනු ඇත.

දත්ත මගින් දැක්වෙන තොරතුරු අනුව මුළු ගෘහස්ථ සාමාජිකයන්ගෙන් 73% කටත් වඩා යැපෙන්නේ කෘෂි කර්මයෙනි. එමෙන්ම ප්‍රදේශයේ ඇති ශ්‍රම බලකායෙන් වැඩි පිරිසක්ම සේවා නියුක්ත වී ඇත්තේ කෘෂි කර්මය ආශ්‍රිතවයි. කෘෂි කර්මයේ යෙදී සිටින ගෘහස්ථ සාමාජිකයන්ගෙන්ද 54% ක්ම මූලික වශයෙන් වී වගා වේ නිරත වී සිටිති. ප්‍රදේශයේ ශ්‍රම බලකාය පිළිබඳව එක් එක් රැකියා කාණ්ඩ අනුව කරන විග්‍රහයකදී ද කෘෂිකර්මය ප්‍රධාන රැකියා නියුක්ති මාර්ගය ලෙස පිළිබිඹු වේ. (4.5 වගුව) මුළු ශ්‍රම බලකායෙන් 81% පමණ කෘෂිකර්මයේ නිරත වී සිටිති.

4.5 වගුව රැකියා කාණ්ඩ අනුව ශ්‍රම බලකායේ වර්ගීකරණය

| රැකියා කාණ්ඩය | % |
|---|---|
| කෘෂි කර්මය | 81 |
| රජයේ රැකියා | 6 |
| වෙළදාම හා වාණිජ අංශය | 5 |
| කාර්මික නිෂ්පාදන අංශය | 1 |
| ජලය හා විදුලිය ආශ්‍රිත | 2 |
| ගමනාගමන හා සන්නිවේදන අංශය | 3 |
| වෙනත් | 2 |
| | 100 |

ප්‍රදේශයේ මුළු රැකියා නියුක්ති සංඛ්‍යාවෙන් 6% ක් පමණ රාජ්‍ය අංශයේ රැකියාවන්හි නියුක්ත වූ අය වන අතර අනෙක් අංශයෙන් රට වඩා අඩු දියුණුවක් පෙන්වයි. මෙම ප්‍රදේශයේ ඇතිවන සංවර්ධනයත් සමගම ශ්‍රම බලකායද රැකියා කාණ්ඩ අනුව අනාගතයේදී වෙනසකට භාජනය වනු ඇත. කෘෂි කාර්මික නොවූ අංශයේ රැකියා නියුක්තිය වර්තමානයේ ඉතා දුර්වල තත්වයක පවතින බව දත්ත මගින් පැහැදිලි වේ. මෙයට බලපාන ප්‍රධාන හේතුව වශයෙන් දෙවන පරිච්ඡේදයේදී දක්වා තිබූ පරිදි කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික නොවන අමු ද්‍රව්‍ය යොදා නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන විශාල කාර්මික ව්‍යාපාරයන් ප්‍රදේශයේ පිහිටා නොතිබීම දැක්විය හැක. මෙවැනි මෙම ප්‍රදේශයේ කෘෂි කාර්මික නොවන අංශයේ රැකියාවන් මූලික වශයෙන්ම පාරම්පරික අංශයට පමණක් සීමා වී ඇත.

මෙහෙත් දක්වා ඇති කරුණු අනුව සාර්ථක සේවා නියුක්තියක් සැපයීමේ දී පළාතේ කෘෂි කාර්මික නොවන අංශය සැලකිය යුතු සේවා අංශයක් ලෙස ගත නොහැකි තරම් වේ. වී මෝල්, බයිසිකල් අළුත් වැඩියා කරන ස්ථාන, ආපන ශාලා, බේකරි ඇදි ඉතා සුළු ප්‍රමාණයක සේවා ස්ථානයන් හැරුණු විට අධ්‍යාපනික ප්‍රදේශය තුල ඇති වෙනත් කාර්මික හෝ කෘෂි කාර්මික නො වන අංශයක් දැකිය නොහැක. කෘෂිකාර්මික නොවන අංශයේ දක්නට ලැබුණ එකම වැදගත් රැකියා කාණ්ඩය නම් ගුරු වෘත්තිය තැපැල් සේවය වැනි රාජ්‍ය අංශයේ රැකියා කාණ්ඩයයි.

4.6 වගුව

කෘෂිකාර්මික නො වන රැකියා කාණ්ඩයන්හි ව්‍යාපෘතිය පුද්ගලයින් සංඛ්‍යාව

| | |
|---|---|
| රාජ්‍ය අංශයේ රැකියා | 20 |
| වෙළඳුන් සහ තේ කඩ හිමියන් | 14 |
| රියදුරන් | 11 |
| සමූපකාර සේවකයන් | 6 |
| මුර කරුවන් | 7 |
| කාර්මිකයන් | 6 |
| වඩු කාර්මිකයන් | 6 |
| කාර්යාල කාර්ය සහායක හා එවැනි ශ්‍රේණියේ අය | 3 |
| බේකරි සේවකයන් | 3 |
| බාබර්වරුන් | 1 |
| ලී ඉරුම් කරුවන් | 2 |
| එකතුව | 79 |

4.4.1 ශ්‍රම බලකායේ ස්වභාවය

ශ්‍රම බලකායේ ස්වභාවය, වැඩ කිරීමේදී ඇති ගුණාත්මක වටිනාකම, ආදායම් හා සංවිධාන මට්ටම යනාදිය ගැන සලකා බැලීමේදී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ඉතා වැදගත් වේ.

වයස් සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රම බලකායේ ව්‍යාප්තිය උප ග්‍රන්ථයේ අංක 5 වගුව මගින් දක්වා ඇති ශ්‍රම බලකායට ඇතුලත් අවුරුදු 60 – 65 අතර වැඩිහිටි පුද්ගලයින්ගෙන් අධිකම විධිමත් පාසැල් අධ්‍යාපනයක් ලබා නො මැති බව එමගින් පෙන්වයි. අවුරුදු 14–19 වයස් කාණ්ඩයේ එම ප්‍රමාණය 13% ක් පමණ වේ. අධ්‍යයන ප්‍රදේශය තුල ශ්‍රම බලකායට අයත් අයගෙන් 90% ක්ම ලබා තිබුනේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) ට අඩු අධ්‍යාපන සුදුසුකම් වූ අතර අ.පො.ස (උසස් පෙළ) සමත් අයගේ ප්‍රමාණය 1% කටත් අඩු විය. ඉහල මට්ටමක අධ්‍යාපනික පහසුකම් ප්‍රදේශය තුලින් ලබා ගැනීමට ඇති දුෂ්කරතාවය නිසා බොහෝ දෙනා තම අධ්‍යාපනික සුදුසුකම් වැඩි දියුණුකර ගැනීමට පිට ප්‍රදේශවලට පදිංචියට යාම මෙන්ම

පළාතේ උසස් අධ්‍යාපනයක් ලැබූ අය පිට ප්‍රදේශයක රැකියාවක් ලබා යාමද දක්නට ලැබේ. පවුල්වල ඇති දුර්වල ආර්ථික වාතාවරණය ද ඉහළ මට්ටමක අධ්‍යාපනය ලැබූ අය අඩුවීමට බලපාන තවත් හේතුවක් විය හැක. අධ්‍යයනයේ දත්ත මගින් හෙළිවන පරිදි සාමාන්‍ය පාසැල් අධ්‍යාපනයෙන් බාහිරව විශේෂ පුහුණුවක් හෝ නිපුණතාවයක් ලැබූ අය ශ්‍රම බලකායෙන් 1% කටත් වඩා අඩු ප්‍රතිශතයකි.

ශ්‍රම බලකායට අයත් පුද්ගලයින් ගෙන් තමා කැමැති රැකියාවේ ස්වභාවය ගැන විමසීමේදී වැඩි දෙනෙක්ම රජයේ රැකියාවන් කෙරෙහි විශේෂ ලැදියාවක් දක්වන බව පැහැදිලිව ප්‍රකාශ කෙරුනි. තරුණ සාමාජිකයන් රැකියාවන් සඳහා දැක්වූ අදහස් අනුපිළිවෙලට තැබීමේදී කෘෂිකර්මයට හිමි වන්නේ අවසන් ස්ථානයයි. මෙතත්වයට හේතු වශයෙන් ඔවුන් ඉදිරිපත් කළේ රාජ්‍ය අංශයේ රැකියාවලින් ස්ථිර හා ආරක්ෂිත ආදායම් මාර්ගයක් සලසා ගත හැකි වීමත්, ගොවිතැන් කිරීමේදී ඇති දුෂ්කරභාවය හා ඉන් ආදායම් ලබා ගැනීමේදී ඇතිවන අවිනිශ්චිතතාවයත්ය. කෙසේ වෙතත් අනාගතයේදී මෙම ප්‍රදේශයේ රැකියා සැපයුම සඳහා ඇති ප්‍රධාන මාර්ගය කෘෂිකර්මය බවද පැහැදිලි කරුණකි. ප්‍රදේශය තුල ඇති තරුණ ශ්‍රමය සේවා නියුක්ත කළ හැකි වෙනත් විකල්ප මාර්ගයන් මෙම ප්‍රදේශය තුල නොමැති කමින් මෙම තත්වය උදා වී ඇත.

## 4.5 ආදායම

### 4.5.1 ප්‍රදේශයේ පවතිනා ආදායම් මාර්ග

අධ්‍යයන ප්‍රදේශයේ ගෘහ සාමාජිකයින්ගේ ආදායම් මාර්ග අනුව කළ ගෘහයන්ගේ වර්ගීකරණයක් අංක 4,7 වගුව මගින් දක්වා ඇත. ඒ අනුව සෑම ගෘහස්ථ සාමාජිකයින් 10 දෙනෙකුගෙන් 7 දෙනෙක්ම තම ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස කෘෂිකර්මය මත රැඳී සිටින බව හෙළිවේ. එම ප්‍රමාණයෙන්ද 3/4 ක්ම වී ගොවිතැන මත රඳා සිටිති. මෙම තත්වය පිළිබඳව සංවර්ධන ප්‍රදේශ අනුව කරන වර්ගීකරණයකදී ප්‍රදේශ අංක 5 දී මෙම ප්‍රමාණය 68% ක අගයක් ගත්තද එය ප්‍රදේශ අංක 8 තුල 83% තරම් ඉහළ අගයක් ගන්නා බව පැහැදිලිවේ. ස්ථිර රැකියා මාර්ගයන්හි නිරත වී සිටින අයගෙන්ද දහයෙන් කොටසක් පමණ එයට අමතරව වී හෝ වෙනත් අතිරේක භෝග වගා කිරීමෙන් අතිරේක ආදායමක් ද ලබා ගනිති. අධ්‍යයනයට භාජනය වූ ගෘහයන්ගෙන් 5% ක පමණ ප්‍රධාන ආදායම් මාර්ගය වී ඇත්තේ කුලියට ශ්‍රමය සැපයීමයි. මෙම කොටසට ගැනෙන අය ඉඩම් නොමැති අය හෝ වගා කටයුතු සඳහා සුළු ඉඩම් ප්‍රමාණයක් හිමි අයයි. මේ අය අධ්‍යයන කාල සීමාව තුලදී මහවැලි ව්‍යාපාරයට අයත් ඇල මාර්ග කැපීම් හෝ කොන්ත්‍රාත් වැඩ වලට සම්බන්ධ වී සිටියහ. ගෘහයන්ගෙන් තවත් 11% ක් කෘෂිකාර්මික නොවන ආදායම් මාර්ග ලබති.

4.7 වගුව

ආදායම් මාර්ග අනුව ගෘහයන්ගේ ව්‍යාප්තිය

| ප්‍රධාන ආදායම් මාර්ගය | | පදනම 5 | 6 | 7 | 8 | සියළුම ප්‍රදේශ |
|---|---|---|---|---|---|---|
| 1. කෘෂිකර්මය. | වී වගාව | 54 | 44 | 54 | 67 | 54 |
| | වී වගාව නොවන | 14 | 26 | 21 | 16 | 14 |
| 2. ස්ථිර ආදායම් ලබන්නන්. | ස්ථිර ආදායම් මාර්ගයට අමතරව වී වගාව කරන | 4 | 2 | 5 | 5 | 4 |
| | ස්ථිර ආදායම් මාර්ගයට අමතරව වී වගාව නොකරන | 2 | 12 | 3 | 2 | 4 |
| 3. කුලියට ශ්‍රමය සැපයීම. | අමතර ආදායම් මාර්ගයක් ලෙස; වී වගා කරන | 4 | — | — | 1 | 2 |
| | වී වගා නොකරන | 2 | 3 | 1 | 4 | 3 |
| 4. කෘෂිකාර්මික නොවන අනෙකුත් ආදායම් මාර්ග. | අමතර ආදායම් මාර්ගයක් ලෙස; ගොවිතැන් වගාවේ යෙදෙන, | 6 | 5 | 4 | 1 | 4 |
| | ගොවිතැන් වගාවේ නොයෙදෙන, | 12 | 7 | 6 | 4 | 11 |
| එකතුව | | 100 | 100 | 100 | 100 | 100 |

4.5.2 ආදායම් මට්ටම්

අධ්‍යයන කාල සීමාව තුලදී ගොවිපලක සාමාන්‍ය දළ ආදායම් රුපියල් 5200/- පමණ වූ අතර එක් පුද්ගලයෙකුගේ වාර්ෂික ආදායම රු:880/= ක් විය. (1977 වර්ෂය තුලදී ජාතික මට්ටමින් ඒක පුද්ගල ආදායම රු:860/- ක් විය) අධ්‍යයනය ප්‍රදේශය තුල ගොවිපලක වාර්ෂික දළ ආදායම් සංයුතිය පහත දැක්වේ.

4.8 වගුව

### ගොවිපළක වාර්ෂික දළ ආදායමේ සංයුතිය

| වර්ගය | ගොවිපලකට ප්‍රමාණය (රුපියල්) | % |
|---|---|---|
| කෘෂිකර්මයෙන් | 3439 | 66 |
| කෘෂිකාර්මික කටයුතු සඳහා කුලියට ශ්‍රමය සැපයීමෙන් | 143 | 3 |
| කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා කුලියට ශ්‍රමය සැපයීමෙන් | 519 | 10 |
| රජයේ රැකියා මගින් | 565 | 11 |
| ස්වයං රැකියා මාර්ග මගින් | 288 | 5 |
| වෙනත් | 266 | 5 |
| | 5220 | 100 |

ප්‍රදේශය තුල ආදායමෙන් 65% ක් පමණ දැනට ලබා ගන්නේ ගෘහස්ථ නිෂ්පාදන මගිනි. කුලියට ශ්‍රමය සැපයීමෙන් ලබන ආදායම් තත්වයද ඉහල මට්ටමක (13%) පවතී. අධ්‍යයන කාල සීමාව තුලදී මෙම ප්‍රදේශයේ කැලෑ එළිකිරීම්, ගොඩනැගිලි තැනීම් කටයුතු සහ ඇලවේලි ඉදිකිරීම් වැනි මහවැලි ව්‍යාපාරයට සම්බන්ධ වැඩ කටයුතු යම් ගරමකින් ආරම්භ කර තිබූ නිසා ප්‍රදේශයේ ශ්‍රම බලකායට එමගින් කෘෂිකාර්මික නොවන අංශයේ අළුත් රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ ඉඩකඩ සැලසී තිබිණ. ආදායම පිළිබඳව ප්‍රකාශ කර ඇති තොරතුරු අනුව ස්වයං රැකියා මාර්ග වලින් ලැබෙන වාර්ෂික ආදායම රු: 288/- තරම් පහත් අගයක් ගනී.

අධ්‍යයන ප්‍රදේශය තුල ගෘහයන්ගෙන් වැඩි කොටසකගේම ප්‍රධාන ආදායම් මාර්ගය කෘෂිකර්මය නිසා, ආදායම් උපයු මාර්ගය අනුව හා වගා කන්නය අනුව කරන ලද ආදායම් වර්ගී කරණයක් 4.10 වගුවේ දැක්වේ.

4. 9 වගුව

### කන්න අනුව කෘෂිකර්මයෙන් ලද සාමාන්‍ය වාර්ෂික දළ ආදායමේ සංයුතිය

| ආදායම් මාර්ග | යල 1977 | | මහ 1977/78 | | වාර්ෂික | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| වී වගාව | 765 | 63 | 1509 | 68 | 2274 | 66 |
| ගොඩ ඉඩම් | 67 | 5 | 112 | 5 | 179 | 5 |
| හේන් ගොවිතැන | 374 | 31 | 591 | 27 | 965 | 28 |
| සත්ව පාලනය | 11 | 1 | 10 | -- | 21 | 1 |
| | 1217 | 100 | 2222 | 100 | 3439 | 100 |

මෙම දත්ත මගින් පෙනෙන පරිදි කෘෂි කාර්මික ආදායම්හි වැඩි කොටසක්ම, යල, මහ කන්න දෙක තුලදීම වී වගාව මගින් ලබා ගෙන ඇත. ගොවිපලක දළ ආදායමින් තුනෙන් දෙකක පමණ ප්‍රමාණයක් ලබා ගෙන ඇත්තේ වී වගාවෙනි. එමෙන්ම යල කන්නයේදී වී වලින් ලැබූ ආදායම මහ කන්නයේ ලද ආදායමින් භාගයකි. කෘෂි කාර්මික ආදායම් මාර්ග අතර හේන් වගාව දෙවන ස්ථානය ගනී. ගොවිපලක හේන් වලින් ලද වාර්ෂික ආදායම සාමාන්‍ය යෙන් රු: 1000/= ක් පමණ වීය. කිරි, බිත්තර වැනි සත්ව නිෂ්පාදන අලෙවියෙන් ලද ආදායමත්, එම නිෂ්පාදනයන්හි වටිනාකමත් ගෘහස්ථ වාර්ෂික දළ නිෂ්පාදනයෙන් 1% ක තරම් ඉතා සුළු ප්‍රමාණයක් වේ.

ගොඩ ඉඩමේ අතිරේක භෝග වගා කිරීමෙන් ලද ආදායම මුළු වාර්ෂික ගොවිපල ආදායමින් 5% ක් පමණ වේ. මෙයට බල පෑ ප්‍රධාන හේතුව ගොඩ ඉඩම් වල අතිරේක භෝග වගා කිරීමට තිබූ දුෂ්කරතාවයන්ය.

නිෂ්පාදන විකිණීමෙන් ලද මුදල් ආදායම් පදනම් කරගෙන කෘෂිකර්මයෙන් ලද ආදායම නැවත සලකා බලන ලදී. (4.10 වගුව)

4.10 වගුව

කෘෂිකර්මයෙන් ලද මුදල් ආදායම් සංයුතිය

| | ගොවිපලක සාමාන්‍ය මුදල් ආදායම | | මුදල් ආදායම දළ ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් | |
|---|---|---|---|---|
| | යල- 1977 (රුපියල්) | මහ- 1977/78 (රුපියල්) | යල- 1977 (%) | මහ- 1977/78 (%) |
| වී වගාව | 393 | 232 | 52 | 36 |
| ගොඩ ඉඩම් | 44 | 71 | 66 | 64 |
| හේන් ගොවිතැන | 343 | 390 | 92 | 66 |
| සත්ව පාලනය | 6 | 5 | 55 | 50 |
| එකතුව | 786 | 998 | 65 | 45 |

වී වගාවෙන් සහ හේන් වලින් ලද මුදල් ආදායම ගොවිපලේ මුදල් ආදායම් මාර්ග අතුරින් ඉතා වැදගත් ස්ථානයක් ගන්නා බව පෙනේ. යල කන්නයේදී හේන් වගාවෙන් හා වී වගාවෙන් ලද මුදල් ආදායම වූ රු: 343/- හා රු: 393/- සලකා බලන විට හේන් වගාවෙන් ලැබූ ආදායම වී වගාවෙන් ලද ආදායමට වඩා අඩු වන්නේ ඉතා සුළු ප්‍රමාණයකිනි. කෙසේ වෙතත් මහ කන්නයේදී හේන් වලින් ලද මුදල් ආදායම වී වගාවෙන් ලද මුදල් ආදා යමට වඩා ඉහළ අගයක් ගනී. මෙම දත්ත අනුව පැහැදිලිවම පෙනී යන්නේ ගොවීහු තම මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේදී හේන් වගාව කෙරෙහිද විශේෂත්වයක් දක්වන බවයි. හේන් වගාවේදී මෙන් නොව

වී වගාවෙන් ලැබෙන අස්වැන්නෙන් වැඩි කොටසක්ම ගෘහස්ථ පාරිභෝජනයට වෙන් වන බැවින් මෙහිදී අලෙවිය සඳහා වෙන් කරන ප්‍රමාණය අඩු වන අතර එය ගොවිපලේ මුදල් ආදායම අඩු වීමට හේතු වේ. භෝග වගාවෙන් හා සත්ව පාලන කටයුතු වලින් ලැබෙන මුදල් ආදායම යල හා මහ කන්න දෙක තුලදීම ඉතා පහත් අගයක් ගනී.

4.11 වගුව

සංවර්ධන ප්‍රදේශ අනුව ගෘහයන්හි වාර්ෂික දළ ආදායමේ ව්‍යාප්තිය

කලාප අංක

| වාර්ෂික ආදායම (රුපියල්) | 5 ගෘහයන් සංඛ්‍යාව | % | 6 ගෘහයන් සංඛ්‍යාව | % | 7 ගෘහයන් සංඛ්‍යාව | % | 8 ගෘහයන් සංඛ්‍යාව | % | එකතුව ගෘහයන් සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රුඃ 1000 ට අඩු | 32 | 18 | 16 | 13 | 21 | 20 | 15 | 14 | 84 | 16 |
| 1000–2000 | 34 | 19 | 28 | 22 | 9 | 9 | 16 | 15 | 87 | 17 |
| 2000–3000 | 20 | 11 | 15 | 12 | 12 | 12 | 11 | 11 | 58 | 11 |
| 3000–4000 | 24 | 13 | 22 | 18 | 20 | 18 | 20 | 19 | 86 | 17 |
| 4000–6000 | 22 | 12 | 16 | 13 | 17 | 17 | 21 | 20 | 76 | 15 |
| 6000–8000 | 14 | 8 | 10 | 8 | 5 | 5 | 11 | 11 | 40 | 8 |
| 8000–10,000 | 7 | 4 | 8 | 6 | 2 | 2 | 6 | 6 | 23 | 5 |
| 10000–12,000 | 5 | 3 | 0 | 0 | 9 | 9 | 3 | 3 | 17 | 3 |
| 12,000 ට වැඩි | 22 | 12 | 10 | 8 | 8 | 8 | 1 | 1 | 41 | 8 |
| මුළු ගණන | 180 | 100 | 125 | 100 | 103 | 100 | 104 | 100 | 512 | 100 |

ගොවීන්ගෙන් වැඩි කොටසක්ම අඩු මට්ටම්වල ආදායම් ලබන්නන් බව දත්ත ආශ්‍රයෙන් පැහැදිලි වේ. වාර්ෂික දළ ආදායම වශයෙන් රුඃ 3000/– කට (මසකට රුඃ 250/– කට) අඩු ආදායම් ලබන පවුල් ගණන මුළු අධ්‍යයන ප්‍රදේශයේ පවුල් වලින් භාගයක් පමණ වේ. අධ්‍යයන ප්‍රදේශයේ ජනගහණයෙන් 80% ක් පමණ වාර්ෂිකව රුඃ 6000/– ට අඩු (මාසිකව රුඃ 500/– ට අඩු) ආදායම් ලබති. ප්‍රදේශයේ ගොවීන් අතර වාර්ෂික දළ ආදායමේ ව්‍යාප්තිය එක් එක් ප්‍රදේශයන් වෙන්වෙන්ව සලකා බැලීමේදී පැහැදිලි වෙනසක් දැකිය නොහැක.

## 5. ඉඩම් පරිහරණය සහ භුක්ති ක්‍රම

වගා කටයුතු සඳහා භූමි සම්පත් බෙදා ගන්නා ආකාරය හා ඉඩම් භුක්ති ක්‍රම පිළිබඳව කළ අධ්‍යයනයක් මෙමගින් ඉදිරිපත් කෙරේ. දැනට වගා කටයුතු සඳහා සුදානම් කළ/යෝජිත ඉඩම් බෙදා දීමේ කාර්යය මගින් මෙම ප්‍රදේශය තුළ ඇති විය හැකි ඇතැම් වෙනස්කම් හා එහි ප්‍රතිඵලයන් මෙම පරිච්ඡේදයේ අවසාන කොටසින් සාකච්ඡා කර ඇත.

### 5.1 ඉඩම් පරිහරණ රටාව

අධ්‍යයන ප්‍රදේශය තුළ පවතින පාරම්පරික ඉඩම් පරිහරණ රටාවේ ආවේණික ලක්ෂණ තුනක් සඳහන් කළ හැක.

(I) පහත් බිම් වල කෙරෙන වී වගාව
(II) ගොඩ ඉඩම් වල සිදුවන ගෙවතු වගාව
(III) කැලෑ ප්‍රදේශවල සිදුවන හේන් වගාව

නියැදියට ඇතුලත් වූ ප්‍රමාණයට අනුව තක්සේරු කරන ලද ප්‍රධාන වගා ක්‍රමයන් යටතේ පවතින ඉඩම් ප්‍රමාණය පහත දැක්වේ.

5.1 වගුව ඉඩම් පරිහරණ රටාවේ විවිධ ක්‍රම අනුව ශුද්ධ හා දළ අක්කර ගණන

| ඉඩම් පරිහරණ ක්‍රම | නියැදි ප්‍රතිශතය | ඇස්තමේන්තු දළ අක්කර ගණන | ඇස්තමේන්තු ශුද්ධ අක්කර ගණන |
|---|---|---|---|
| කුඹුරු ඉඩම් | 39 | 15,717 | 14,157 |
| වාරිමාර්ග රහිත ගොඩඉඩම් (හේන) | 30 | 12,090 | 10,890 |
| ගම්බද ගෙවතු (ගොඩ ඉඩම්) | 24 | 9,672 | 8,712 |
| හේන් නොවූ වාරිමාර්ග රහිත වෙනත් ගොඩ ඉඩම් | 7 | 2,821 | 2,541 |
| | 100 | 40,300 | 36,300 |

---

1. මහවැලි ගඟ (II) වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය - අයි.ඩී.ඒ (1976)

වගා කටයුතු සඳහා යොදවා ගත හැකි මුළු බිම් ප්‍රමාණයෙන් 40% ක් එනම් ආසන්න වශයෙන් අක්කර 14,000 ක් දැනට වී වගාව යටතේ පවතී. අධ්‍යයනයට භාජනය කළ පවුල් අතරින් ට වගාව උසස් මට්ටමක පවත්වා ගෙන යන තුනෙන් දෙකොටසක්, එනම් 60% ක් පමණ වේ. වැව් වලින් සැපයෙන වාරිමාර්ග යටතේ වී වගාව ප්‍රධාන වශයෙන් සිදු වන අතර අධ්‍යයන ප්‍රදේශය තුළ ග්‍රාමීය වැව් 150 ක් පමණ පිහිටා ඇත. ග්‍රාමීය වැව් වලින් ජලය සපයා ගත හැකි මිටියාවත් වල, අක්කර එකක් හෝ ඊට අඩු බිම් කැබලිවල වී වගාව සිදු වේ.

මාස් කන්නය තුළදී කුඹුරු ඉඩම් වලින් වැඩි කොටසක්ම වාරි ජල සැපයුම මත රඳා නොපවතී. එහෙත් යල කන්නය තුළදී කෙරෙන වී ගොවිතැන යෝධ ඇළ මඟින් ජලය සැපයෙන ග්‍රාමීය වැව් යටතේ ඇති ඉඩම් වලට පමණක් සීමාවී ඇත. මාස 4 සිට 4 1/2 දක්වා කාල සීමාවක් අයත් වන මහ කන්නය තුළදී විවිධ වී වර්ග වගා කළත් යල කන්නයේ තුන් මාසයක් පමනවූ වගා කාල සීමාව තුළදී වගා කර ඇත්තේ කෙටි කාලීන වී වර්ගයන්ය. බිම් ප්‍රමාණය වගා කිරීමට ප්‍රමාණවත් ලෙස ජලය සපයා ගත නොහැකි නියං කාල් වලදී ඉන් කොටසක් පමණක් වගා කෙරෙන අතර එය 'බෙත්ම වගා ක්‍රමය' නමින් හඳුන්වනු ලැබේ. මෙම ක්‍රමය යටතේ සෑම ගොවියෙක්ම වැව් ආසන්නයේ පිහිටි කුඹුරු කැබැල්ලක් වගා කිරීමට එකඟ වන අතර ලැබෙන ජලය අපතේ යා නොදී රැකගෙන වගා කටයුතු සඳහා යොදවා ගැනීමට සිදුවේ.

ගංගොඩ නමින් හඳුන්වනු ලබන ගෙවතු වගා වන් පිහිටි ප්‍රදේශය වැව් බැම්ම ආසන්නයේ හෝ ඊට පහතින් පිහිටා ඇති අතර වැඩි වශයෙන්ම මේවා වාරිමාර්ග පහසුකම් සහිත කුඹුරු ඉඩම් හා සම්බන්ධ වූ උස් බිම් ලෙස පවතී. පදිංචි නිවාස පිහිටා ඇත්තේ වැව දෙපස පිහිටා ඇති ගොඩ ඉඩම් වලය. මෑත අවුරුදු වලදී ග්‍රාමීය ජන ගහණයේ වැඩිවීමක් සමඟ ප්‍රදේශය තුළ පිහිටි මංමාවත් දෙපස නව නිවාසයන්හි වර්ධනයක් සිදුවී ඇත. ගම් පුළුල් කිරීම යටතේ ඇතිවූ නව ඉඩම් අයිතිය මෙම ග්‍රාමීය ප්‍රදේශ පුළුල් වීමට හේතු වී ඇත. වැව් ආසන්නයේ පිහිටි පැරණි ගෙවතු වගා ප්‍රදේශ කුඩා වුත්, ඉතා සීමිත ඉඩ පහසුකම් වලින් යුත් වුත් ඒවාය. ගංගොඩ ප්‍රදේශවල ක්‍රමානුකූල අතිරේක භෝග වගාවක් සිදු නොවේ. විවිධ පළතුරු හා අනෙකුත් ස්ථිර භෝග වගාවන් මෙහි දක්නට ලැබේ. මෙම ප්‍රදේශය ආශ්‍රිතව දැකිය හැකි ප්‍රධාන ස්ථිර භෝග අතර පොල්, කොස්, දෙල්, අඹ, දෙහි, හා කෙසෙල් වැදගත් වේ.

හේන් මාරු වගා ක්‍රමයක් වූ හේන් වගාව, වාරිමාර්ග, පහසුකම් නොලැබෙන උස් බිම් වලත්, ගංගොඩ ආසන්නයේ ළඳු කැලෑ වලත් විශාල වශයෙන් සිදු වේ. අධ්‍යයන කාල සීමාව තුළදී, මහ කන්නයේ වගා කරනු ලැබූ අක්කර ප්‍රමාණයෙන් තුනෙන් කොටසක් හේන් වගාවට යටත් ව තිබූ අතර අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගෙන් තුනෙන් දෙකක් පමණ ප්‍රමාණයක් (64%ක්) හේන් ගොවිතැනට සම්බන්ධ වී සිටියහ. අධ්‍යයනයට භාජනය වූ

වගා කන්න දෙක තුළදී උපයන ලද මුළු මුදල් ආදායමින් 40% ක්ම හේන් ගොවිතැන මගින් ලැබී ඇත. මේ අනුව හේන් ගොවිතැන කෘෂි ආර්ථිකයේ ඉතා වැදගත් මූලයක් බව හෙළි වේ. ජූනි ජූලි මාස ඇතුලත් වන වියලි කාලය තුළදී හේන් වගාව සඳහා කැලෑ කපා අගෝස්තු මාසය තුළදී ඒවා ගිනි තබන අතර සැප්තැම්බර් මැදදී ඇතිවන මෝසම් වැස්සත් සමග වැපිරීම හෝ බීජ සිටුවීම කරනු ලැබේ. මහ කන්නය තුළදී ඇතිවන වර්ෂා පතනයෙන් පොළව තෙත් වීමත් සමගම වාරිමාර්ග පහසුකම් රහිත පහත් බෑවුම් වලදී බිම්වල කෙරෙන වී (වී හේන) වගාව සිදු වේ. මෙම ප්‍රදේශයේ ඇති උස් බෑවුම් වල විවිධ වියළි භෝග වර්ග මහ කන්නය තුළදී වගා කෙරේ. මෙහි සුලභව වගා කෙරෙන භෝග වර්ග අතර මිශ්‍ර ධාන්‍ය වර්ග, මෙනේරි, තලබඩු වර්ග හා එළවළු වැදගත් වේ. සැප්තැම්බර්, ඔක්තෝබර්, මාස වලදී ලැබෙන වැස්ස අනුව මහ කන්නය ඇරඹීමට පෙර මෙම භෝග වර්ග වැපිරීම කරනු ලැබේ. යල කන්නයේදී, අළුතින් සකස් කළ හේන් වල හෝ සාමාන්‍ය වල් මර්ධනයක් කිරීමෙන් පසු මහ හේන තුළම තල වගා කරනු ලැබේ.

## 5.2 වගා ක්‍රම

වර්තමානයේ මෙම ප්‍රදේශයේ පැතිර පවතින වගා විධි අංක 5.2 වගුව මගින් සංක්ෂිප්තයෙන් දක්වා ඇත.

5.2 වගුව   වගා කන්න අනුව, ගොවිපලේ සාමාන්‍ය ප්‍රමාණය හා වාර්තා කළ ගොවීන්ගේ ප්‍රතිශතය අනුව ගොවිපල වර්ගීකරණය

| ගොවිපලේ ස්වභාවය | යල 1977 | | මහ 1977/78 | |
|---|---|---|---|---|
| | වාර්තා කළ ගොවීන් % | වාර්තා කළ ගොවිපලකට සාමාන්‍ය ප්‍රමාණය (අක්කර) | වාර්තා කළ ගොවීන් % | වාර්තා කළ ගොවිපලකට සාමාන්‍ය ප්‍රමාණය (අක්කර) |
| කුඹුර පමණක් | 13 | 1.59 | 8 | 2.05 |
| ගොඩ ඉඩම පමණක් | 33 | 1.24 | 19 | 1.35 |
| හේන පමණක් | 19 | 1.54 | 11 | 1.34 |
| කුඹුර හා ගොඩ ඉඩම | 12 | 3.72 | 23 | 3.56 |
| කුඹුර හා හේන | 10 | 2.92 | 20 | 3.07 |
| හේන හා ගොඩ ඉඩම | 8 | 2.37 | 6 | 2.78 |
| කුඹුර, ගොඩ ඉඩම හා හේන | 5 | 3.78 | 13 | 5.94 |
| සියළු ගොවිපලවල් | 100 | 2.04 | 100 | 2.94 |

අධ්‍යයන ප්‍රදේශය තුල කෘෂිකාර්මික කටයුතු වල විවිධත්වයක් පැහැදිලිව දක්නට ඇත. මෙම ප්‍රදේශයේ ගොවිපලවලින් 60% ක්ම මාස් කන්නයේදී වගා විධි කීපයක් යටතේ භෝග වගා කර ඇත. මේ අතරින් බහුලවම දක්නට ඇත්තේ කුඹුරු වගාව සමග සිදුවන හේන් ගොවිතැනයි. ඒ ගොවිතැන පමණක්ම කළ ගොවීන් ප්‍රමාණය 10% ක් තරම් අඩු සංඛ්‍යාවක් වූයේ එවකට වී ගොවිතැනින්ලද ආදායමේ අවිනිශ්චිත බව නිසා විය හැක.

වගා විධි පිළිබඳව තව දුරටත් විශ්ලේෂණ කිරීමේදී වගා කටයුතු පිළිබඳව කන්න දෙක (යල, මහ) අතර දක්නට ලැබුන වෙනස සඳහා වාරි ජල සැපයුමේ ස්වභාවය මූලික වශයෙන් බල පෑ සාධකයක් විය. වර්ෂාව ලැබෙන (මහ) කන්නය තුලදී අධ්‍යයනයට භාජනය වූ ගො විපලවලි අතුරින් තුනෙන් දෙකකම ආදායම ප්‍රධාන වශයෙන් වී ගොවිතැන සමග සම්බන්ධ වී පැවතින. වියළි කාලය වූ යල කන්නය තුලදී වී වගාව පිළිබඳව වාර්තා වී ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. අධ්‍යයන ප්‍රදේශයේ ගො වීන්ගෙන් 60% ක් ම යල කන්නය තුලදී වී වගා කර නැත. එයට හේතුව ජලය සපයා ගැනීමේ අපහසුතාවයයි. මෙම තත්වය අනුව යල කන්නයේදී ගොවිපල නිෂ්පාදන කටයුතු ප්‍රධාන වශයෙන්ම ගොඩ ඉඩම් මත රඳා පැවතින. මහ කන්නය තුලදී එක් ගොවිපල ඒකකයක් කුඹුර, හේන, ගොඩ ඉඩම යන වගා ඒකක තුනම භාවිතා කළ බිම් ප්‍රමාණය අක්කර 3 කට වැඩි වූ අතර වී ගොවිතැනේ නොයෙදුන එක් ගොවිපල ඒකකයක මුළු බිම් ප්‍රමාණය අක්කර 2.0 කට අඩු විය.

අධ්‍යයන ප්‍රදේශයේ වගා කරුවන්ගෙන් තුනෙන් එකක්ම මහ කන්නයේදී වී වගාවට සම්බන්ධ වී නැති බව වැදගත් ලක්ෂණයකි. මූලික වශයෙන්ම කුඹුරු ඉඩම් අයිති නැති බව හේතුවෙන් මෙසේ වී වගාවට සම්බන්ධ වූ අයගේ ප්‍රමාණය අඩු වී ඇත. මෙම අයගෙන් වැඩි දෙනෙක්ම ඉඩම් ඔප්පු නොරොක්කුවෙන් බැහැරදී පදිංචියට පැමිණි අයවන අතර බොහොවුන් වැඩි වශයෙන් අල්ලා ගෙන ඇත්තේ කුඹුරු වලට සුදුසු ඉඩම් නොව රජයේ කැලෑ වැනි වෙනත් ගොඩ ඉඩම්ය.

## 5.3 ඉඩම් භුක්තිය

රජයේ හා වෙනත් පෞද්ගලික ඉඩම් වලට අමතරව ප්‍රදේශය තුල පැතිර ගිය පුරාණ ගම් 160 කින් අධ්‍යයන සීමාව සමන්විත වේ. එක් පුරාණ ගමක් ගල් විට, වැව, එට පහළින් පිහිටි කුඹුරු යාය, ඊ අසල පිහිටි ජනාවාස භූමිය, සත්ව පාලනයට අවශ්‍යවන තණ බිම් හා හේන් වගා කටයුතු සඳහා යොදවා ගනු ලබන අවට පිහිටි වනාන්තර ප්‍රදේශය යන අංග වලින් යුක්ත වේ. සාමාන්‍යයෙන් වියළි කලාපයේ පුරාණ ගම් එහි සමාජ ආර්ථික කටයුතු පිළිබඳ ප්‍රධාන සේවා මධ්‍යස්ථාන වේ, මෙම ගම්වල පවතින ඥාති සම්බන්ධතා හා අනෙකුත් සමාජ බැඳීම්, ඉඩම් භුක්තිය සමග සමීප සම්බන්ධතාවයක් දක්වයි. එක් සම්මුතියකට එළඹ, ඥාති සම්බන්ධතා ඇති පවුල් එකම ගමක වාසය කරනු දක්නට ලැබේ. කෙසේ වුවද පසුගිය වකවානුව තුළදී මෙම පාරම්පරික ගම්තුළ පැවැති

පුද්ගලික ඉඩම් අයිතියේ වෙනස්වීමක් දැක ගත හැක.

ඉඩම් අයිතිය අනුව ඉඩම් භාවිතා කරන්නන්ගේ ව්‍යාප්තිය අංක 5.3 හා 5.4 වගු මගින් දක්වා ඇත.

5.3 වගුව ඉඩම් අයිතියේ ස්වභාවය අනුව මෙහෙයුම් හිමියන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය

| අයිතියේ ස්වභාවය | අක්කර ප්‍රමාණය |
|---|---|
| තනි අයිතිය(පුරාණ ඉඩම්) | 29 |
| හවුල් අයිතිය(පුරාණ ඉඩම්) | 3 |
| කුලියට/බද්දට ගත් | 10 |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඇති ඉඩම් කට්ටි | 14 |
| අනවසර ඉඩම් | 40 |
| වෙනත් | 4 |
| | 100 |

දැනට පවත්නාතත්වය අනුව වගාකරන මුළු ඉඩම් ප්‍රමාණයෙන් වැඩි කොටසක්ම එනම් 40% ක් පමණ අනවසරයෙන් වගා කරන ඉඩම්ය. මෙවැනි ඉඩම් අතරින් වැඩි කොටසක්ම හේන් වගාවන් වශයෙන් පවතී. කුඹුරු ඉඩම් ආශ්‍රිතව අනවසර ඉඩම් දක්නට නොලැබේ. වගා කර ඇති මුළු අක්කර ගණනින් තමාටම අයිති ඉඩම් ඇත්තේ තුනෙන් එකක් පමණි. මෙයින්ද වැඩි කොටස පුරාණ ගම්වල කුඹුරු ඉඩම් [illegible] හා ගොඩ ඉඩම් වශයෙන් පවතී. පුරාණ ගම්වල බහුලව පවතින ඉඩම් බද්දට දීම ප්‍රමාණාත්මකව බලන විට ප්‍රදේශයේ මුළු කෘෂිකාර්මික බිම්වලින් දහයෙන් එකක් පමණ බදු ක්‍රමය යටතේ පවතී. කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් හතරෙන් කොටසක් පමණ කුමන හෝ බදු ක්‍රමයක් යටතේ පවතී.

5.4 වගුව

බදු ක්‍රමය හා ඉඩමේ ස්වභාවය අනුව ඉඩම් ව්‍යාප්තිය

| බදු ක්‍රමයේ ස්වභාවය | අත්තර ප්‍රමාණය කුඹුර % | හේන % | ගොඩ ඉඩම % | ගෙවතු % |
|---|---|---|---|---|
| තනි අයිතිය | 51 | -- | 47 | 22 |
| හවුල් අයිතිය | 6 | -- | 3 | 2 |
| කුලී අඳයට/බද්දට ගත් | 26 | 2 | -- | 1 |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඇති ඉඩම් කට්ටි | 7 | 3 | 23 | 36 |
| අනවසර | 5 | 95 | 21 | 34 |
| වෙනත් | 5 | -- | 6 | 5 |
| | 100 | 100 | 100 | 100 |

බදු ක්‍රමය පිළිබඳව තව දුරටත් විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ මෙය බොහෝ දුරටම දක්නට ලැබෙන්නේ කුඹුරු ඉඩම් ආශ්‍රයෙන් පමණක් බවයි. මෙසේ කුඹුරු ඉඩම් වල පමණක්ම මෙතරම් බහුල ලෙස බදු ක්‍රමය පැතිර යාමට බලපාන හේතු අතර කුඹුරු සඳහා මෙම ප්‍රදේශයේ පවත්නා අධික ඉල්ලුමත් ඇතැම් කුඹුරු ඉඩම් හිමියනට ඒවා වගා කිරීමේදී මුහුණ පාන්නට සිදුවන දුෂ්කරතාත් යනාදී සාධක වැදගත් වේ. අධ්‍යයන ප්‍රදේශයේ දක්නට ලැබුණ පරිදි 'පුරාණ වෙල' (පරණ කුඹුරු) සහ 'අත්තර ඉඩම්' වශයෙන් කුඹුරු ඉඩම් වර්ග දෙකක් දක්නට ලැබේ. තනි අයිතිය හා හවුල් අයිතිය යටතේ පවත්නා කුඹුරු ඉඩම් වැඩි වශයෙන් දක්නට ඇත්තේ 'පුරාණ වෙලේ' කොටසෙහිය.

පුරාණ ගමක සිටින පැරණි පවුල් සියල්ලටම මෙම 'පුරාණ වෙල' ඉඩමෙන් කොටසක් අයිතිව ඇත. මෙම ඉඩම් සාමාන්‍යයෙන් පිහිටා ඇත්තේ වැවට පහළින් ගංගොඩ ආසන්නයේය. මෙම ප්‍රදේශවාසීන්ගේ අදහස් වලට අනුව 'පුරාණ වෙලේ' ඉඩමෙන් කොටසක් අයිතිව සිටීම එක්තරා අභිමානයක නම්බුවක් වේ. එමෙන්ම 'පුරාණ වෙල' වැව හා ගංගොඩ ආසන්නයේ පිහිටා ඇති නිසා ඒවාට ඇති විශාල ඉල්ලුම හේතුවෙන් මෙහි කුඩා බිම් කැබලි රාශියක් බිහිවී ඇති අතර ඒවා ද පිහිටා ඇත්තේ එකම තැනක නොව තැනින් තැනය. කුඹුරු ඉඩම් බදු දීමේ ඉහළ අනුපාතයක් පවතී. (26%) 5.4 වගුව. එයට හේතුව කෙත් කලාපයේ දක්නට ලැබෙන පරිදි ඉඩම් හිඟ බවම නොව ඉහත කී පුරාණ ඉඩම් හිමියන් මගින් සිදුවන කුඩා කුඩා බිම් කැබලි ඇති වීම වැනි සාධකයන්ගේ බලපෑම නිසාය. මෙවැනි කුඩා කුඹුරු කට්ටි වගා කිරීමේදී මතුවන විවිධාකාර ප්‍රශ්න නිසා ඒවා අඳයට/බද්දට දීමට හිමි කරුවන් පෙලඹෙති. බොහෝ වගා කරුවන් තමා පදිංචි ස්ථානයට දුරින් පිහිටි කුඩා ඉඩම් බදු දෙන අතර ආසන්නයේ ඇති කුඩා කුඹුරු කට්ටි බද්දට ගනිති. අධ්‍යයන ප්‍රදේශයේ දක්නට ලැබෙන පරිදි අත්තර 7 ක කුඹුරු ඉඩමක් වෙනුවෙන් බිම් කැබලි 11 ක් එකම පුද්ගලයෙකුට අයත්ව පැවතිනි. පොදු වශයෙන් බලන විට එක් වගා කරුවෙකු මෙවැනි බිම් කට්ටි 4 සිට 6 දක්වා ප්‍රමාණයක් කුඹුරු වගාවේදී යොදවා ගනිති.

අනිකර ඉඩම් පිහිටා ඇත්තේ පුරාණ වෙලට පිටස්තර පරිධියේය. ඒවා වැවට වඩා දුරින්ද පිහිටා ඇත. පුරාණ ඉඩම් වලට වඩා පසුව මේවා අස්වද්දා ඇත. මෙම ඉඩම් වල කැබලි වී යාමේ ක්‍රියා වලිය සිදුවන්නේ අඩු වශයෙනි. මෙම ඉඩම් එම ගම් වාසීන්ට මෙන්ම පිටස්තර පුද්ගලයින්ටද අයිතිව පවතී. පුරාණ වෙල හා සසඳා බලන විට මෙම ඉඩම් වලට ජලය සපයා ගැනීමේ හැකියාව අඩු මට්ටමක පවතී.

5.5 වගුව

ඉඩම් අයිතියේ ස්වභාවය සහ සංවර්ධන ප්‍රදේශ අනුව කුඹුරු ඉඩම්වල ප්‍රතිශතක ව්‍යාප්තිය

(අක්කර ප්‍රමාණය අනුව ප්‍රතිශතක ව්‍යාප්තිය)

| අයිතියේ ස්වභාවය | ප්‍රදේශ අංක 5 % | 6 % | 7 % | 8 % |
|---|---|---|---|---|
| තනි අයිතිය | 56 | 50 | 60 | 34 |
| හවුල් අයිතිය | 5 | 7 | 2 | 9 |
| බද්දට/ඇඳයට ගත් | 24 | 23 | 23 | 36 |
| ඉ.සං. ආඥාපනත යටතේ ඇති ඉඩම් කට්ටි | 5 | 9 | 7 | 10 |
| අනවසර ඉඩම් | 6 | 5 | - | 8 |
| වෙනත් | 4 | 6 | 8 | 3 |
| | 100 | 100 | 100 | 100 |

කුඹුරු ඉඩම් බදු දීම සම්බන්ධයෙන් ප්‍රදේශ අංක 8 විශේෂයෙන් කැපී පෙනේ. ඒ අනුව එහි ඉඩම් වලින් 1/3 ක්ම සමන්විත වී ඇත්තේ මෙවැනි ඉඩම් වලිනී. අනෙක් ප්‍රදේශවල මෙම ප්‍රමාණය හතරෙන් එකක් පමණ වේ. කලාප අංක 8 තුල ඇති අයිතිකරු විසින්ම වගා කටයුතු මෙහෙයවනු ලබන ඉඩම් ප්‍රමාණය ඉතා අඩුය. ඉඩම් හිමිකරු විසින්ම වගාකටයුතු මෙහෙයවනු ලබන සාමාන්‍ය අක්කර ගණන වෙනත් ප්‍රදේශවල අක්කර 2 ක් වුවත් මෙම ප්‍රදේශයේ එය 1.7 ක් පමණ වේ. මේ නිසා මෙවැනි කුඩා කුඹුරු කට්ටි තම ඥාතියෙකුට බද්දට දීමට එම ඉඩම් හිමියන් පෙළඹෙති. සාමාන්‍යයෙන් තමා පදිංචි ස්ථානයට වඩා දුරින් පිහිටි කුඹුරු ඉඩම් මෙසේ ඇඳයට/බද්දට දීම සිදුවේ.

මෙම ප්‍රදේශයේ බහුල වශයෙන්ම දක්නට ලැබෙන බදු ක්‍රමය 'අඳ ක්‍රමය' නමින් හඳුන්වනු. මෙසේ අඳයට දීමෙන් අයිතිකරුට ලැබෙන කොටස පහත 5.6 වගුව මගින් දක්වා ඇත.

5.6 වගුව බද්ද වෙනුවෙන් ගෙවනු ලබන අස්වනු කොටස

| සංවර්ධන ප්‍රදේශය | බදු හිමියා විසින් ගෙවනු ලබන අස්වනු කොටස (පංගුව) | | | | |
|---|---|---|---|---|---|
| | 1/4 | 1/2 | 3/4 | වෙනත් | සියළු |
| | % | % | % | % | % |
| 5 | 2 | 91 | 2 | 5 | 100 |
| 6 | 5 | 85 | 5 | 5 | 100 |
| 7 | - | 95 | - | 5 | 100 |
| 8 | 6 | 88 | - | 6 | 100 |

බදු ඉඩම් සඳහා ගෙවනු ලබන අස්වනු කොටස තීරණය වන්නේ එම ඉඩමට වාරිමාර්ග මගින් හොඳින් ජලවහනයක් අත්කර ගැනීමට ඇති ඉඩකඩ මතය. දත්තයන්ට අනුව අධ්‍යයන ප්‍රදේශය තුළ ගෘහස්ත කුටුම්භයන්ගෙන් අඩකට කිට්ටු ප්‍රමාණයකටම තමන්ගේ යයි කිව හැකි කුඹුරක් නැත. වැව අසල ඇති කුඹුරු ඉඩම් සඳහා වැඩි වැඩියෙන් ඉල්ලුමක් ඇත. දැනට බද්දට යටත්ව පවතින ඉඩම් වලින් වැඩි කොටසකටම (82%) වාරිජල පහසුකම් සපයනු ලබන්නේ ග්‍රාමීය වැව් මගින් වන අතර බදු කරුවන්ගෙන් 90% ක් පමණ අස්වැන්නෙන් 1/2 ක් බදු කුලිය වශයෙන් ගෙවති. මෙතරම් ඉහළ මට්ටමක අස්වනු කොටසක් බදු කුලිය වශයෙන් ගෙවනු ලබන්නේ ඉඩම අයිතිකරුවා විසින් බදු කරුවාට ඉඩමට ලබාදීමට අමතරව තවත් සේවා රාශියක් සැපයීමේ හේතුවෙනි. උදාහරණ වශයෙන් බීජ්හර වී සැපයීම පොහොර හා රසායනික ද්‍රව්‍ය ලබාදීම, ට්‍රැක්ටර් පහසුකම් ආදිය සැපයීම ආදී සේවාවන් මේ අතර වේ.

මෙයට අමතරව අයිතිකරු යටතේ පවතින හා බදු ක්‍රමය යටතේ පවතින ඉඩම් ප්‍රමාණයෙන් 14% ක්ම ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බෙදා දුන් ඉඩම් කට්ටි වලින් සමන්විත වේ. මෙවැනි ඉඩමක ප්‍රමාණය සාමාන්‍යයෙන් අක්කර 2 ක් පමණ වේ. මෙම ඉඩම් වල වගා කෙරෙන්නේ වාරික භෝගයන්ට වඩා පොල්, කොස්, අඹ වැනි ස්ථිර භෝග වර්ගයන්ය.

### 5.3.1 ඉඩම් නොමැතිකම

අධ්‍යයන ප්‍රදේශය තුළ ඉඩම් නොමැති අයගේ සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතී.[1] අධ්‍යයන ප්‍රදේශයේ ගෘහමූලිකයන්ගෙන් අඩකටත් වඩා නීත්‍යානුකූලව තමන්ගේ යයි කිව හැකි ආකාරයේ ඉඩමක් නො මැති අයයි. බොහෝ දෙනා මෙසේ ශ්‍රමිකයන් ලෙස මෙම ප්‍රදේශයේ පදිංචිව සිටින්නේ අනාගතයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් වාරිමාර්ග පහසුකම් ලැබීමෙන් පසු දැනට වගා නොකොට ඇති රජයේ ඉඩම් ලබා ගැනීමේ අදහසින් විය හැක.

5.7 වගුව

කෘෂිකාර්මික ඉඩම් නො මැති හෝ සුළු ප්‍රමාණයක් අයිති ගෘහමූලිකයන්ගේ ප්‍රතිශතය – 1978

| සංවර්ධන ප්‍රදේශ | ගෘහමූලිකයන් % |
|---|---|
| 5 | 49 |
| 6 | 66 |
| 7 | 46 |
| 8 | 60 |

ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම් අයිතිය අනුව බලන විට කුඹුරු ඉඩම් නො මැති අයගේ ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී.

5.8 වගුව

කුඹුරු ඉඩම් නොමැති හෝ සුළු ප්‍රමාණයක් අයිති ගෘහමූලිකයින්ගේ ප්‍රතිශතය– 1978

| සංවර්ධන ප්‍රදේශ | ගෘහමූලිකයන් % |
|---|---|
| 5 | 50 |
| 6 | 63 |
| 7 | 48 |
| 8 | 59 |

---

1. මෙම අධ්‍යයනයේදී 'ඉඩම් නොමැතිකම' යනුවෙන් අදහස් කරන්නේ නීත්‍යානුකූල ඉඩම් අයිතියක් නැති තත්වයටයි. අනවසර පදිංචි කරුවන් හා කෙටිකාලීන බද්දකට ඉඩම් වගා කරන අයද මේ ගණයට ඇතුලත් වේ.

5.4 ගොවිපලේ ප්‍රමාණය

මුලින්ද පෙන්වා දී ඇති පරිදි ගොවිපලක මූලික කොටස් වශයෙන් කුඹුර, හේන, හා ගෙවත්ත ඇතුලත් වේ. මෙහිදී කුඹුරු ඉඩම් සහිත ගොවිපලවල සාමාන්‍ය ප්‍රමාණය අක්කර 3 ක්ද කුඹුරු රහිත ගොවිපලවල සාමාන්‍ය ප්‍රමාණය අක්කර 2 ක් ද වේ. කුඹුර, හේන හා ගෙවත්ත යන අංග තුනම ඇතුලත්ව බලන විට ගොවිපලක සාමාන්‍ය ප්‍රමාණය අක්කර 3.5 ක් වේ. (5.2 වගුව)

5.9 වගුව

මෙහෙයුම් හිමියන්ගේ සංයුතිය (එක් ගොවිපලකට) 1978

| භූමි පරිභෝග ක්‍රමය | ගොවීන් ගණන | වගාකටයුතු සිදුකරන ගොවි පලක සාමාන්‍ය ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| කුඹුර | 314 | 2.2 |
| හේන | 326 | 1.6 |
| වෙනත් ගොඩ ඉඩම් | 62 | 1.9 |
| ගෙවතු | 445 | 0.9 |

මහවැලි සංවර්ධන ව්‍යාපාරයට අනුව එක් අයෙකුට අක්කර 2.5 ක ප්‍රමාණයක් වගා කටයුතු සඳහා ලැබී ඇත. මෙම ඉඩම් දීමේ පිළිවෙත අනුව දැනට ඇති ඉඩම් අයිතිය කෙතෙක් දුරට සම්බන්ධ වේදැයි විමසීමක්ද කාලෝචිත බැව් පෙනේ.

අධ්‍යයනයෙන් පෙන්වන පරිදි ගෘහමූලිකයන්ගෙන් 38% ක්ම කුඹුර, හේන සහ ගොඩ ඉඩම් ඇතුළත්ව අක්කර 2.5 ක් වගා කරති. මෙවැනි අයගේ ඉඩම් ප්‍රමාණය ප්‍රදේශයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 75% ක් පමණ වේ. මෙසේ අක්කර 2.5 කට වැඩි අයතු වගා කරන සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය අක්කර 5 ක් පමණ වේ. ප්‍රදේශයේ ගොවි පවුල් වලින් 12% ක්ම කුඹුර, හේන, ගොඩ ඉඩම ඇතුළුව අක්කර 5 කට වඩා කරන අයයි. මෙම අය මුළු ප්‍රදේශයේ ඉඩම් ප්‍රමාණයෙන් භාගයකට වැඩි භූමි ප්‍රමාණයක වගා කටයුතු මෙහෙයවති. අක්කර 5 කට වැඩි අයගේ ප්‍රමාණය 12% ක් වුවද මුළු ඉඩම් ප්‍රමාණයෙන් 1/3 ක් පමණ ඒ අයට අයත් වේ. මේ අයගේ ඉඩම් අයිතිය සාමාන්‍යයෙන් අක්කර 8 ක් පමණ වේ. මහවැලි ව්‍යාපාරයේ ආරම්භයත් සමඟ ඉඩම් අයිතිය සෑහෙන ප්‍රමාණයකින් අඩු වී ඇත.

නීත්‍යානුකූල ඉඩම් අයිතියක් ඇති ප්‍රමාණය ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාවෙන් 45%ක් පමණ වේ. මොවුන්ගෙන් හතරෙන් කොටසක් පමණ හේන, කුඹුර ගොඩ ඉඩම් ඇතුළුව අක්කර 3 කට වැඩි ප්‍රමාණයක් අයිතිව ඇත. මෙසේ අක්කර 3 ට වැඩි ඉඩම් හිමියන්ට මුළු ඉඩම් ප්‍රමාණයෙන් 60%ක් ඉඩම් පමණ අයත් වන. අතර ඔවුන්ගේ ඉඩම් අයිතියේ සාමාන්‍යය අක්කර 6.1 ක් වේ. බෙදා දීමේ ව්‍යාපාරය යටතේ එක් අයෙකුට අක්කර 3 බැගින් දීමේදී මුළු ගෘහ මූලිකයන්ගෙන් 4% කට පමණ තම ඉඩම් ප්‍රමාණයෙන් හරි අඩක් පමණ අහිමි වේ.

ගෙවත්ත පිහිටි ගොඩ ඉඩම් ප්‍රමාණය සලකා බැලීමේදී නියැදියේ ගොවි පවුල් වලින් අඩකට පමණ අක්කර භාගයකට වැඩි බිම් ප්‍රමාණයක් ඇත. එමෙන්ම නියැදියේ ගොවිපවුල් වලින් 18% කට වැඩි කොටසකට අක්කර 1 කට වැඩි ගෙවත්තක් අයිති වේ. යෝජිත මහවැලි ව්‍යාපාරයට අනුව එසේ අක්කර 1 කට වැඩි ගොඩ ඉඩම් ප්‍රමාණයක් අයිතිව සිටින අයට තම ඉඩමෙන් භාගයක් පමණ අහිමි වේ. මෙහිදී එක් ගොවිපවුලක් වෙනුවෙන් අක්කර භාගයක් ගොඩ ඉඩමක් සෑහේද යන ප්‍රශ්නයක්ද මතු විය හැකි අතර හොඳ ජල සැපයුමක් හා නිර්දේශිත භෝග වර්ග සුදුසු අන්දමින් වගා කළ හොත් මෙම ඉඩම් ප්‍රමාණයෙන් වුවද නියමාකාර ප්‍රතිඵල ලබා ගත හැකි බව මෙහිදී දැක්විය හැක. මෙවැනි අවස්ථාවන්වලදී ගොඩ ඉඩම් සම්බන්ධයෙන් වැදගත් වන්නේ ඉඩමේ ප්‍රමාණයට වඩා එය වගා කිරීමේ තීව්‍රතාවයයි.

කුඹුරු හිමියන්ගෙන් අක්කර 2.5 කට වඩා වැඩි බිම් ප්‍රමාණයක් වගා කරන්නේ 10% ක ප්‍රමාණයකි. යෝජිත මහවැලි ව්‍යාපාරයට අනුව වගා කන්න දෙකම තුළදී ස්ථිර වාරිජල සැපයුම් තත්වයක් යටතේ දැනට ලැබෙන අස්වනු ප්‍රමාණය දෙගුණ කර ගැනීමට ගොවීහු බලාපොරොත්තු වෙති. දැනට ප්‍රදේශයේ හේන් වගාව දියුණු තත්වයක පැවතුනද මහවැලි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසුව එවැනි අවකාශයන් අහිමි වී යා හැක. 1977/78 වර්ෂයේ මුළු මුදල් ආදායමින් 38%ක්ම ලැබුනේ හේන් වගාවන්ගෙන් ලත් ආදායමිනි. මේ අනුව හේන් වගා අහිමිවීම මෙම ප්‍රදේශයේ ජනතාවගේ අනාගත සමාජ ආර්ථික ජීවිතයටද බලපෑම් ඇතිකරවන සුළු සිද්ධියක් වනුඇත. මෙම කරුණු සලකා බලන විට මෙය ඉඩම් අයිතිය පිළිබඳව ඇතිවන ක්‍රියාවලියක් සේද සැලකිය හැක.

එකිනෙකට වෙනස් බිම් ප්‍රමාණයන් අනුව කුඹුරු, හේන හා ගොඩ ඉඩමෙන් ලද වාර්ෂික ආදායමේ (1977 යල 1978 මහ) ව්‍යාප්තිය පහත 5.10 වගුව මගින් පෙන්නුම් කරයි.

5.10 වගුව

වාර්ෂික කෘෂිකාර්මික ආදායමේ සාමාන්‍ය ව්‍යාප්තිය
(1977 යල හා 1978 මහ)

| ඉඩමේ ප්‍රමාණය | මාධ්‍ය වාර්ෂික ආදායම | | |
|---|---|---|---|
| | කුඹුර | හේන | ගොඩ ඉඩම |
| 0.01 - 0.50 | 664.98 | 374.57 | 155.49 |
| 0.51 - 1.00 | 1126.44 | 660.85 | 229.79 |
| 1.01 - 1.50 | 1801.06 | 788.27 | 324.56 |
| 1.51 - 2.00 | 1669.11 | 993.74 | 200.80 |
| 2.01 - 2.50 | 2094.71 | 1239.68 | 483.47 |
| 2.51 - 3.00 | 2947.77 | 1387.64 | 909.44 |
| 3.01 - 3.50 | 2078.90 | 985.50 | 418.33 |
| 3.51 - 4.00 | 6346.33 | 2088.31 | 806.67 |

(අක්කර 4 කට වැඩි බිම් ප්‍රමාණයන් නියැදියට ඇතුලත් වී ඇත්තේ සුළු ප්‍රමාණයකි)


ඉහත දත්ත වලින් දැක්වෙන පරිදි කුඹුරු වලින් ලැබෙන ආදායම සෑම ආකාරයකම හේන් හා ගොඩ ඉඩම් වලින් ලැබෙන ආදායමට වඩා වැඩිය. අක්කර 3.5 බිම් ප්‍රමාණය දක්වා ඇති සෑම බිම් කාණ්ඩයකදීම හේන් වගාවෙන් ලැබෙන ආදායම මෙන් දෙගුණයක් කුඹුරෙන් ලැබී ඇත. අක්කර 3.5 හා 4.0 අතර දී හේන් වලින් ලැබූ ආදායම මෙන් තුන් ගුණයක් වී වගාවෙන් ලැබී ඇත.

වගා කටයුතු මෙහෙයවන හා ඉඩම් අයිතිව සිටින අයගේ ව්‍යාප්තිය අංක 4 ප්‍රස්ථාර සටහන මගින් දක්වා ඇත. ඒ අනුව මුළු ඉඩම් ප්‍රමාණයෙන් 33% ක් පමණ වගාකටයුතු මෙහෙයවන්නේ කුටුම්භයන්ගෙන් 13% කි. මුළු ඉඩම් ප්‍රමාණයෙන් 25% ක පමණ ඉඩම් අයිතිය ඇත්තේ කුටුම්භයන්ගෙන් 5% ක් වැනි සුළු කොටසකටය.

Fig. 4



මෙහෙයුම් කරන ලද ඉඩම් හා අයිති ඉඩම් දක්වන
ලොරෙන්ස් වක්‍රය.



## 6. ගොවිතැන් ක්‍රම

### (අ) කුඹුරු ගොවිතැන

අධ්‍යයන ප්‍රදේශය තුළ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රියාවලිය වී වගාව වන හෙයින් මෙම පරිච්ඡේදය මූලික වශයෙන් අවධානය යොමුකර ඇත්තේ එම ප්‍රදේශයේ දැනට පවතින ගොවිතැන් ක්‍රම කෙරෙහිය. යෝජනා ක්‍රමය යටතේ සාර්ථක ඉඩම් භාවිතාක්‍රමයක් ඇති කිරීමට නම් ප්‍රමාණවත් ගොවිපල බලයක් යෙදවීම අවශ්‍ය සාධකයක් වන බැවින් මෙම කරුණ වඩාත් විස්තරාත්මකව සලකාබලන ලදී. ශ්‍රමය යොදාගැනීම මෙන්ම මෙහෙයුම් කටයුතු සඳහා වූ මුදල් වියදම් පිළිබඳවද තව දුරටත් මෙහිදී සාකච්ඡා කර ඇත. අවසාන කොටසින් සාකච්ඡා කර ඇත්තේ වාරිමාර්ග රහිත ගොඩ ඉඩම්වල පවතින ගොවිතැන් රටාවන් පිළිබඳවයි.

### 6.1 වාරිමාර්ග මූලයන් සහ එහි මට්ටම

මෙම අධ්‍යයනයට අදාල ප්‍රදේශය තුළ අක්කර 14,000 ක ඉඩම් ප්‍රමාණයක් වාරිමාර්ගක්‍රම යටතේ සංවර්ධනය වන අතර දැනට එහි ජල සැපයුම් බෙහෙවින්ම රඳා පවත්නේ ප්‍රදේශය පුරා විහිදී ඇති ග්‍රාමීය වැව් මතය. නවීන වගා ක්‍රම කෙරෙහි ගොවීන් දක්වන අඩු සහභාගිත්වය, අස්ථිර ජල සැපයුමක් මගින් මූලික වශයෙන්ම ඇති වන්නක් බවද මෙහි පසුව එන තොරතුරු අනුව පැහැදිලි වේ.

කුඹුරු වගා කිරීමේදී ගොවිතැන් ක්‍රමයන්හි ඇති වෙනස් තත්වයන් හඳුනා ගැනීමට සංවර්ධන ප්‍රදේශ අනුව කරන වාරිමාර්ග මූලයන් පිළිබඳ 6.1 වගුවෙන් පැහැදිලි වේ. අඛණ්ඩ ජල සැපයුමක් නොමැති ගම්බද වැව් වලින් අතිරේක වාරිමාර්ග පහසුකම් ලබන ප්‍රමාණය සංවර්ධන ප්‍රදේශයන් තුළ පිහිටි කුඹුරු අක්කර ප්‍රමාණයෙන් 75% ක් පමණ වේ. මුලින්ද සඳහන් කළ පරිදි අංක 5 සංවර්ධන ප්‍රදේශයේ ඇති කුඩා ග්‍රාමීය වැව් ගණනාවක් ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාරයකින් පෝෂණය වේ. 7 හා 8 සංවර්ධන ප්‍රදේශයන්හි පිහිටි වැව් වර්ෂා ජලයෙන් පෝෂණය ලබයි.

6.1 වගුව සංවර්ධන ප්‍රදේශ හා ජල සැපයුම් මාර්ගය අනුව වී වගා කල අක්කර ගණනේ ප්‍රතිශත ව්‍යාප්තිය

| සංවර්ධන ප්‍රදේශ | අහස් දියෙන් % | ග්‍රාමීය වැව් % | ප්‍රධාන වාරිමාර්ග යටතේ % | |
|---|---|---|---|---|
| 5 | 1 | 78 | 21 | 100 |
| 6 | 7 | 77 | 16 | 100 |
| 7 | 14 | 73 | 13 | 100 |
| 8 | 8 | 87 | 5 | 100 |

වර්තමානයේ දී වී වගාව සඳහා ප්‍රදේශ අංක 5 තුල සාපේක්ෂ වශයෙන් ඉතා හොඳ ජල සැපයුම් තත්වයක් ඇතත් 7 සහ 8 ප්‍රදේශ තුල ඇත්තේ දුර්වල ජල සැපයුම් තත්වයකි.

## 6.2 වාරිමාර්ග ක්‍රමය හා වගා සුක්ෂමතාවය

වගා සුක්ෂමතාවයේ සංයුතිය ප්‍රදේශ අනුව සකස් වී ඇති අයුරු 6.2 වගුව මගින් පැහැදිලි වේ.

6.2 වගුව සංවර්ධන ප්‍රදේශ අනුව වී වගාවේ සුක්ෂමතාවය

| ප්‍රදේශ | වගා සුක්ෂමතාවය | | |
|---|---|---|---|
| | 1977 යල | 1977/78 මහ | වාර්ෂික |
| 5 | 58 | 84 | 142 |
| 6 | 37 | 59 | 96 |
| 7 | 27 | 89 | 116 |
| 8 | 16 | 88 | 103 |
| සියළු ප්‍රදේශ | 39 | 81 | 120 |

ආරම්භක කාල සීමාවේදී මෙම ප්‍රදේශය සඳහා ලෝක බැංකුව විසින් තක්සේරු කරන ලද ප්‍රමාණය වන 150% ට වඩා වුව ප්‍රදේශයේ වගා සුක්ෂමතාවය

වූ 120% (6.2 වගුව) පහත් බව පෙනී යයි. ප්‍රදේශ අංක 5 හැර සෙසු ප්‍රදේශවල යල කන්නයේ වගා සූක්ෂමතාවය ඉතා අඩු බව පෙනේ. වර්ෂා ජලය හිඟකම නිසා සංවර්ධන ප්‍රදේශ 5 තුල කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් භාවිතය සෑහෙන ප්‍රමාණයකින් සීමා වී තිබේ. බොහෝ අවුරුදු වලදී වියලි කාලය මෙන්ම වර්ෂා කාලයේදීත් වී වගාව සඳහා අවශ්‍ය වාරි පහසුකම් යෝධ ඇල මගින් පෝෂණය වන කුඩා වැව් රාශියක් මගින් ලබා ගනිති. අවුරුද්දකට කන්න දෙකක්වගාව මෙම ප්‍රදේශයේ (අංක 5) කුඹුරු ඉඩම් වල වැඩි වශයෙන් දක්නට ලැබේ. අනෙක් ප්‍රදේශ තුන තුළ දක්නට ඇති කුඩා වැව් වර්ෂා දියෙන් පෝෂිත. ඒවා බැවින් බොහෝ අවුරුදු වලදී වගා කටයුතු සඳහා ජලය ලබා ගත හැක්කේ මහ කන්නයේදී පමණි. යල කන්නයේදී ඇතිපහත් වගා සූක්ෂමතාවයේ ප්‍රතිඵලයක් ලෙස වගා කරන අක්කර ප්‍රමාණය හතරෙන් තුනකින් පමණ අඩු වී ඇත. වර්තමානයේදී වාරි පහසුකම් ලබන මඩ ඉඩම්වල වුවද සම්පූර්ණ කෘෂිකාර්මික දියුණුවක් දක්නට නොලැබෙන්නේ සංවර්ධිත තත්වයේ පවතින කුඹුරු වලින් වැඩි කොටසත්ම මාස 6 ට ආසන්න කාලයක් තිස්සේම පුරන්ව පවතින බැවිනි. මෙම නිසා ගොවිතැන් කටයුතු වලින් ලැබෙන ආදායමද පහත් මට්ටමක පවතී.

දැනට ඇති අඩුවෙන් වාරි මාර්ග පහසුකම් ලබන මඩ ඉඩම් ප්‍රමාණය විධිමත් වී වගාවක් සඳහා අවශ්‍ය ස්ථාවර පදනමක් නොපෙන්වයි.

6.3 වගුව

1973 සිට 1978 දක්වා සම්පූර්ණ කුඹුරු ඉඩම් ප්‍රමාණය වගා නොකළ කන්න ගණන අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

| | මහකන්නය | | | යලකන්නය | | |
|---|---|---|---|---|---|---|
| සම්පූර්ණ ප්‍රමාණය | 1–2 | 3–4 | 5–6 | 1–2 | 3–4 | 5–6 |
| වගා නොකළ ගොවීන්ගේ ප්‍රතිශතය | 22 | 34 | 18 | 20 | 44 | 34 |

ඉහත දත්තයන්ට අනුව මාස් කන්නයේදීද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයම වගා කිරීමට ඇති අවස්ථාව සීමා සහිත වී ඇත. මෙයට හේතු දැක්වූ අයගෙන් 87% ක්ම ඒ සඳහා ජල හිඟය ප්‍රධාන හේතුව වශයෙන් දැක්වූහ. මෙම තත්වය සඳහා

1971–76 කාල සීමාව අඩු වර්ෂාපතන සහිත කාලසීමාවක් වීමත් 1975 හා 1976 තුලදී පැවත වඩාත් නරක අන්දමින්ම පැවතීමත් හේතු වී ඇත.

6.3 සී සෑම

පළමු සී සෑම සඳහා යොදා ගනු ලබන උපකරණ අතර ප්‍රධාන වන්නේ මී හරකුන් හා යොදා ගත් ලී නගුල සහ දැති පෝරුවයි. මෙහිදී යකඩ නගුල ප්‍රයෝජන යට නොගනී. ට්‍රැක්ටර් භාවිතාවේදී රෝද 4 ට්‍රැක්ටරය සමග 'ටයින්ටිලරයක්', රෝද 2 ට්‍රැක්ටරය සමග 'රොටවේටරයක්' භාවිතා කරයි. පළමුවන සී සෑමෙන්දින 10–14 කට පසු මී හරක් හෝ ට්‍රැක්ටර් මගින් දෙවන සී සෑම කරනු ලැබේ.

6.3.1

අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගෙන් 50% ක පමණ ගේ අදහස් අනුව බිම් සකස් කිරීම සාමාන්‍යයෙන් ආරම්භ කරනු ලබන්නේ වැව් ජලය පළමුවරට නිකුත් කිරීමෙන් පසුවය. මෙවැනි බිම් සකස් කිරීමේ ක්‍රියාවලි යන් නිසා මාස් කන්නයේ මුල් කාලයේදී ලැබෙන වර්ෂා ජලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නොහැකි වේ. කලින් බිම් සකස් කිරීම ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ ප්‍රදේශ අංක 7 ට හා 8 ට ඇතුලත් වන ප්‍රදේශ වලය. වර්ෂා පෝෂිත ප්‍රදේශවල ගොවීන්ගෙන් පහෙන් දෙකොටසක්ම පළමු වැස්ස ලැබීමත් සමග බිම් සකස් කිරීම කටයුතු ආරම්භ කර තිබුනි. දැනට පවත්නා තත්වය අනුව කලින් බිම් සකස් කිරීම නිසා ඇති විය හැකි වල විපාකයන් ගණනාවක් විද්‍යාමාන වේ. වැසි ආරම්භයත් සමගම බිම් සකස් කිරීමෙන් ගොවීන්ට වැදගත් ආරක්ෂිත තත්වයක් ඇති වේ. මේ පිළිබඳව ගොවීන් දැක්වූ අදහස් වැදගත්කම අනුව පහත දක්වා ඇත.

(අ) ස්ථිර වාරි පහසුකම් ලබා ගැනීමට ඇති බාධක නිසා කලින් වගා කිරීමට ඇතිවන අවදානම

(ආ) බිම් සකස් කිරීමේදී පසේ ඇති තද හා වියලි බව නිසා ඇතිවන අපහසුතාවය

(ඇ) කලට වේලාවට ට්‍රැක්ටර් මීහරක් ආදීන් ලබා ගැනීමේ අපහසුතාවය

(ඈ) මහ කන්නයේ මුල් කාල සීමාවේදී පවුලේ ශ්‍රමය හේන් වගා කටයුතු හා සම්බන්ධව සිටීම

### 6.3.2 ගොවිපල බලය

මූලික ගොවිපල බල ඒකකයන් අතර ට්‍රැක්ටර් හා මීහරක් වැදගත් වේ. පළමු හා දෙවන සී සෑමේ අවස්ථාවලදී මෙම දෙවර්ගයම එක සමාන වැදගත් කමක් උසුලයි. කෙසේ වෙතත් තවාන් සකස් කිරීමේදී, අවසාන බිම් සකස් කිරීමේ අවස්ථාවේ දී සත්ව බලය වැඩි වශයෙන් යොදා ගනු ලබති. 1977/78 මහ කන්නයේදී හා 1977 යල කන්නයේදී සී සෑම සඳහා යොදා ගත් මූලික ගොවිපල බල ඒකකයන් පහත දැක්වේ.

6.4 වගුව

යොදා ගනු ලැබූ ගොවිපල බලය 1977/78 මහ

| | යොදා ගත් ගොවිපල බලය | | | |
|---|---|---|---|---|
| | මීහරක් (%) | රෝද 2 ට්‍රැක්ටර් (%) | රෝද 4 ට්‍රැක්ටර් (%) | සියළු වර්ග (%) |
| පළමු හීය | 50 | 22 | 28 | 100 |
| දෙවන හීය | 56 | 21 | 23 | 100 |
| පෝරු ගෑම/මට්ටම් කිරීම | 88 | 3 | 9 | 100 |

6.5 වගුව

යොදා ගනු ලැබූ ගොවිපල බලය- 1977 යල

| | යොදාගත් ගොවිපල බලය | | | |
|---|---|---|---|---|
| | මීහරක් (%) | රෝද 2 ට්‍රැක්ටර් (%) | රෝද 4 ට්‍රැක්ටර් (%) | සියළු වර්ග (%) |
| පළමු හීය | 60 | 24 | 16 | 100 |
| දෙවන හීය | 63 | 24 | 13 | 100 |
| පෝරු ගෑම/මට්ටම් කිරීම | 94 | 2 | 4 | 100 |

නුදුරු අනාගතයේදී අක්කර 40,000 කට ආසන්න බිම් ප්‍රමාණයක් සංවර්ධනය වීම නිසා වගා කටයුතු සඳහා ගොවීනට ලබා ගත හැකි බිම් ප්‍රමාණය

සැලකිය යුතු අන්දමින් ඉහළ යනු ඇත. මේ අනුව ගොවිපල බලය සඳහා ඇති ඉල්ලුමද කෙටි කාලයක් තුලදී වැඩි වනු ඇත. වගා අවශ්‍යතා හඳුනා ගැනීමේදී මෙම ගොවිපල බල මාධ්‍යයන් පිළිබඳව ගොවීන් දැක්වූ නැමැත්ත පහත සඳහන් පරිදි වේ.

| බල මාධ්‍යය | නැමැත්ත අනුව ගොවීන් තේරීම |
|---|---|
| වී හරක් | 49 |
| ට්‍රැක්ටර් | |
| (අ) රෝද 4 | 30 |
| (ආ) රෝද 2 | 21 |

මේ අනුව වර්තමානයේදී ගොවිපල බල මාධ්‍යයක් වශයෙන් ට්‍රැක්ටර් හා වීහරක් යන දෙවර්ගයම එක සමාන වැදගත් කමක් උසුලන බව පෙනී යයි.

සී සෑමේදී මෙන්ම අස්වනු පෑගීමේ අවස්ථාවේදීද ගොවිතැනට අවශ්‍ය බල අවශ්‍යතා බොහෝ විට සපයාගනු ලබන්නේ කුලියටය. (6.6 වගුව)

6.6 වගුව වී වගාව සඳහා යොදා ගනු ලැබූ ගොවිපල බල අයිතියේ ස්වභාවය

| වර්ගය | 1977/78 මහ | | | 1977 යල | | |
|---|---|---|---|---|---|---|
| | තමාට අයිති | කුලියට ගත් | එකතුව | තමාට අයිති | කුලියට ගත් | එකතුව |
| | % | % | % | % | % | % |
| වී හරක් | 15 | 85 | 100 | 14 | 86 | 100 |
| ට්‍රැක්ටර් | 4 | 96 | 100 | 6 | 94 | 100 |

1977/78 වගා වර්ෂය තුලදී ගොවීන්ගෙන් භාගයක්ම (54%) ඔවුන්ගේ අතිරේක බල අවශ්‍යතා නියමිත කාල සීමාව තුලදී සපුරා ගැනීමට

අපහසු වී ඇත. තවද වගා කටයුතු සඳහා යොදා ගැනීමට සුදුසු බිම් ප්‍රමාණයද විශාල වශයෙන් පුළුල් වීම නිසා අධ්‍යයන ප්‍රදේශය සඳහා ප්‍රමාණවත් ගොවිපල බලයක් වගා සැපයීමේ අවශ්‍යතාවය මතු වී ඇත.

හී දෙකම සඳහා සාමාන්‍ය ට්‍රැක්ටර් කුලිය රුපියල් 160/= ක් පමණ වේ. ට්‍රැක්ටර් මගින් ගොයම් පෑගීමේදී අක්කරයක ප්‍රමාණය සඳහා රු 70/= ක කුලියක් අය කෙරේ. සී සෑම සඳහා මී හරකුන් යොදවා ගැනීමේදී මී හරක් බානක් සඳහා දිනකට කුලිය රුපියල් විස්සක් විය. එක් සී සෑමක් එක් දිනකදී අවසන් කිරීමට මී හරක් බාන් 3 ක් අවශ්‍යවේ. ඒ අනුව අක්කරයක් සඳහා පළමුවන දෙවන හී සඳහා වැය වන ඇස්තමේන්තු කුලිය රුපියල් 120/= පමණ වේ. සී සෑමේ කාර්ය්‍ය සඳහා කුලී ක්‍රමයද ගොවිපල බල ඒකකයන් සමග යොදා ගන්නේ නම් වැය වන මුදල ට්‍රැක්ටර් හා මී හරක් යන බල මාධ්‍ය දෙක සඳහා එක සමාන අගයක් ගනී.

අනාගතයේදී බෙදා දීමට යෝජිත පරිදි වාරිපල පහසුකම් සහිත අක්කර 2.5 ක් ද ගොඩ ඉඩම සඳහා අක්කර භාගයක්ද වන බැවින් පළාතේ ට්‍රැක්ටර් හිමි ගොවීන් ප්‍රමාණයද අඩු වීමට ඉඩ ඇත. අනාගතයේදී මෙම වගා ප්‍රදේශය තුළ නොකඩවාම කන්න දෙකේ වගා කිරීමට ඉඩකඩ සැලසෙන බැවින් නිසි ප්‍රමාණවලින් ගොවිපල බල මාධ්‍යයන් සැපයීම වැදගත් වනුඇත.

එමෙන්ම බොහෝ කෘෂිකාර්මික මෙහෙයුම් එක්තරා කෙටි කාලසීමාවක් තුළදී නිම කිරීමද වැදගත් වේ. වඩා කුඩා පරිමාණයේ බල ඒකකයක් යොදා ගැනීම නිෂ්පාදනයේ අඩු වීමට හේතුවක් ලෙස බල පෑ හැකි අතර වඩා විශාල පරිමාණයේ බල ඒකකයක් පාවිච්චි කිරීමෙන් අධික වියදමක් දරන්නට සිදුවිය හැක. ලබා ගත හැකි ශක්ති ප්‍රමාණයන් උසස් මට්ටමකින් ප්‍රයෝජනයට ගැනීම නිෂ්පාදන වියදම අඩුකර ගැනීමේ පියවරක් වේ. විවිධාකාර බල මාධ්‍යයන් කෙරෙහි දක්වන ඉල්ලුමත්, ට්‍රැක්ටර් හා මී හරක් වැඩි වශයෙන් වගා කටයුතු සඳහා යොදවා ගැනීමට කැමැත්ත දැක්වීමත් අනාගතයේදී ඒ සඳහා අදාල මිළ තීරණය වීමට බලපානු ඇත. ට්‍රැක්ටර් සඳහාත් ඉන්ධන සඳහාත් දැරිය යුතු වියදම පසුගිය පස් වසරක වකවානුව තුළ ක්‍රම ක්‍රමයෙන් වැඩි වූ අතර අනාගතයේදී එය මීටත් වඩා වැඩියෙන් වැඩිවීමේ නමශතාවයක් දක්නට ඇත. අනික් අතට මී හරකුන් නඩත්තු කිරීමද අනාගතයේදී ප්‍රශ්නයක් වන්නේ ඔවුනට අවශ්‍ය තණ බිම් ගොවිපලවල් ආසන්නයෙන්

ලබා ගැනීමට ඇති අපහසුතාවයයි. මේ නිසා අඩ හෝ සංවර්ධනය වෙමින් පවතින ඉඩම් වලින් උසස් ප්‍රයෝජන ලැබීම සඳහා කුඩා ගොවිපලවල්හි ගොවිපලබලය දියුණු කිරීම වැදගත් පියවරක් වේ.

## 6.4 වගා කාල සීමාව

මහ කන්නයේ වී වැපිරීමේ කාල සීමාව ඔක්තෝම්බරයෙන් ආරම්භ වී දෙසැම්බරයේ වී වැපිරීම සිදු වෙමින් ජනවාරි අවසානය දක්වා විහිද යයි. නොවැම්බර් මැද සිට දෙසැම්බර් අවසානය දක්වා කාල සීමාව මී වගා කටයුතු උපරිම ආකාරයකින් සිදුවන කාලසීමාවයි. (6.7 වගුව) කෙසේ වෙතත් කලාප අංක5 තුල ඇති වගා ප්‍රදේශයන්හි වැපිරීමේ කටයුතු පටන් ගැනුනේ ඔක්තෝම්බර් අවසානයේදී ඇරඹුනු කාලසීමාවේදීය.

6.7 වගුව

වැපිරීමේ කාල සීමාව අනුව ගොවීන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය–1977/78මහ

| මාසය | වී වගා කළ ගොවීන්ගේ ප්‍රතිශතය | | |
|---|---|---|---|
| | පළමු දෙසතිය % | දෙවන දෙසතිය % | එකතුව % |
| ඔක්තෝම්බර් | 2 | 4 | 6 |
| නොවැම්බර් | 14 | 22 | 36 |
| දෙසැම්බර් | 20 | 21 | 41 |
| ජනවාරි | 11 | 6 | 17 |
| | | | 100 |

යල කන්නයේදී වගා කටයුතු කිරීමේ කාලය කෙටි කාලයකට සීමා වන අතර ගොවීන්ගෙන් හතරෙන් තුනක්ම මැයි ජූනි මාසවලදී තම වැපිරීම් කටයුතු අවසන් කර තිබුනි. මැයි මාසය වැපිරීම කාලසීමාවේ උච්චතම අවධියයි.

6.5 බීජ වර්ග භාවිතය

වැඩි අස්වනු ලබා දෙන අලුත් වී වර්ග ප්‍රදේශය තුල විශාල පරිමාණයකින් පැතිර ඇති බැවින් දැන් ඒවා ප්‍රදේශය තුල ස්ථාවර වී ඇත. අධ්‍යයනයට භාජනය වූ වගා කන්න දෙක තුලදී ගොවීන්ගෙන් 90% ක් පමණ එමම නව වී වර්ග භාවිතා කර ඇති අතර බොහෝ ජනප්‍රිය වූ ඒවා අතර බී.ජී.11-11, බී.ජී 90-2, බී.ජී.34-6 යන වී වර්ග ප්‍රධාන වේ.

6.8 වගුව

වගා කළ බීජ වර්ගය හා ජල සැපයුම් මාර්ගය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - 1977/78 මහ

| වගා කළ වී වර්ගය | ජල සැපයුම් මාර්ගය අනුව ගොවීන්ගේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|
| | අහස් දියෙන් | ග්‍රාමීය වැව් | ප්‍රධාන වාරි මාර්ග යටතේ | සියළුම |
| නව වැඩි දියුණු කළ වී වර්ග | 77 | 94 | 96 | 93 |
| පැරණි වැඩි දියුණු කළ වී වර්ග | 8 | 5 | -- | 5 |
| පාරම්පරික වී වර්ග | 15 | 1 | 4 | 2 |
| | 100 | 100 | 100 | 100 |

6.9 වගුව

වගා කළ බීජ වර්ගය හා ජල සැපයුම් මාර්ගය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය- 1977 යල

| වගා කළ වී වර්ගය | ජල සැපයුම් මාර්ගය අනුව ගොවීන්ගේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|
| | අහස් දියෙන් | ග්‍රාමීය වැව් | ප්‍රධාන වාරි මාර්ග යටතේ | සියළුම |
| නව වැඩි දියුණු කළ වී වර්ග | 90 | 91 | 100 | 91 |
| පැරණි වැඩි දියුණු කළ වී වර්ග | -- | 3 | --- | 2 |
| පාරම්පරික වී වර්ග | 10 | 6 | --- | 7 |
| | 100 | 100 | 100 | 100 |

මේ තත්වය අනුව ගොවීන් නව වැඩි දියුණු කළ වී වර්ග පාවිච්චි කිරීමට කැමැත්තක් දක්වන බව පෙනී යයි. මුලින් දැක්වූ ජල සැපයුම් තත්වයේ වෙනස් කම් අනුව ප්‍රදේශයෙන් ප්‍රදේශයට ඇති වෙනස් වෙනස් ආකාරයේ බීජ වර්ග වගා කිරීමේ තත්වයක් දක්නට නොලැබේ. කෙසේ වෙතත් හොඳ වාරිමාර්ග පද්ධතියක් වර්තමානයේදී දක්නට නොලැබෙන නිසා කලාප අංක 5 හැර සෙසු කලාපයන්හි නව බීජ වර්ග භාවිතය පිළිබඳව සම්පූර්ණ දියුණුවක් ඇතිවී යයි කිව නොහැක. පැරණි වී වර්ග භාවිතය වඩාත් දක්නට ලැබුණේ කලාප අංක 7 හා 8 වලය. එහි ජල සැපයුම් තත්වයද එතරම් දුර්වල වූ අතර මෙම වී වර්ග [illegible] කුඹුරේ වගා කළ මුළු බිම් ප්‍රමාණයෙන් 15% තරම් කුඩා ප්‍රමාණයකය.

6.10 වගුව

සංවර්ධන ප්‍රදේශ අනුව විවිධ වී වර්ග වගා කළ ප්‍රමාණයේ ව්‍යාප්ති ප්‍රතිශතය, මහ 1977/78

| සංවර්ධන ප්‍රදේශ | වගා කළ නව බීජ වර්ග: නව දියුණු කළ වී වර්ග % | පැරණි දියුණු කළ වී වර්ග % | පාරම්පරික වී වර්ග % | සියලු % |
|---|---|---|---|---|
| 5 | 98 | 2 | – | 100 |
| 6 | 91 | 4 | 5 | 100 |
| 7 | 84 | 9 | 7 | 100 |
| 8 | 85 | 12 | 3 | 100 |

මේ පිළිබඳව තව දුරටත් විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ පැරණි දියුණු කළ වී වර්ග භාවිතය පිළිබඳ උසස් අනුපාතයක් දක්නට ලැබෙන්නේ කුඩා ප්‍රමාණයේ බිම් කැබලි අතර බවයි. අධ්‍යයනයට භාජනය වූ වගා කන්න දෙක තුළදීම අක්කර 2 ක් හෝ ඊට වඩා වැඩි බිම් ප්‍රමාණයක් වගා කළ කිසිම ගොවියෙකු පාරම්පරික බීජ වර්ග හෝ පැරණි දියුණු කළ බීජ වර්ග භාවිතා කර නොතිබුණි. තාක්ෂණික පහසුකම් හා ආර්ථික තත්වය පිළිබඳව අවිනිශ්චිත තත්වයක් පවතිද්දී එම සහනාධාර ලැබීමේ මට්ටමේම සිටින විශාල පරිමාණයේ කුඹුරු හිමි බොහෝ ගොවීන් නව ක්‍රමවලට වැඩි කැමැත්ත දැක්වීම බලාපොරොත්තු විය හැකි තත්වයකි. අනෙක් අතට අඩු සහනාධාර මට්ටමක ජීවත්වන, කුඩා ප්‍රමාණයේ ගොවිපලවල් හිමි ගොවීන්ද අළුත් යාන්ත්‍රික ක්‍රම කෙරෙහි නැඹුරුතාවයක් දක්වන බව පෙනේ.

6.6 වගා ක්‍රම

කලින් පැල කර ගන්නා ලද බීජ (බිත්තර වී) අතින් ඉසීම මෙම ප්‍රදේශයේ මුල් බැසගෙන ඇති ජනප්‍රියම ක්‍රමය වේ.

6.11 වගුව

වගා ක්‍රම අනුව ගොවීන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය

| වගා ක්‍රමය | 1977/78 මහ | 1977 යල |
|---|---|---|
| අතින් වී ඉසීම | 87 | 95 |
| පැල සිටුවීම | 11 | 5 |
| පේලියට ඇට දැමීම | 1 | -- |
| කැකුලන් ක්‍රමයට | 1 | -- |
| | 100 | 100 |

කැකුලන් ක්‍රමයට වැපිරීම මෙම ප්‍රදේශයේ දක්නට ලැබුණේ මඳ වශයෙනි. පැල සිටුවීමේ ක්‍රමය මෙම ප්‍රදේශයේ එතරම් ජනප්‍රිය නැත. මෙම ක්‍රමය භාවිතා කර ඇත්තේ මහ කන්නයේදී ගොවීන්ගෙන් 13% ක පමණ ප්‍රමාණයක්ද යල කන්නයේදී 11% ක පමණ ප්‍රමාණයක්ද පමණි. සංවර්ධන කලාපයන්ගේ විවිධත්වය අනුව පැල සිටුවීම භාවිතා කළ ප්‍රමාණයේද වෙනස්කම් දක්නට තිබුනි. මෙම භාවිතා ක්‍රම හා ජලය සපයා ගැනීමේ හැකියාව අතරද සම්බන්ධතාවයක් පවතින බව දත්ත මගින් පෙන්නුම් කරයි. ප්‍රදේශ අංක 5 තුල වර්තමානයේ හොඳම ජල සැපයුම් තත්වය දක්නට ඇත. වගා කළ මුළු ප්‍රමාණයෙන් හතරෙන් එකක්ම පැල සිටුවීමේ ක්‍රමය භාවිතා කර තිබුනි.

6.12 වගුව

සංවර්ධන කලාපයන්හි පැල සිටුවීම 1977/78 මහ

| සංවර්ධන ප්‍රදේශය | පැල සිටවූ ප්‍රමාණයේ ප්‍රතිශතය (%) |
|---|---|
| 5 | 26 |
| 6 | 9 |
| 7 | 5 |
| 8 | 2 |
| සියළු ප්‍රදේශ | 13 |

මේ අනුව වර්ෂා දියෙන් වගා කෙරෙන ප්‍රදේශ 2 ක් වූ 7 හා 8 හි පැහැදිලිව පෙනෙන වෙනසක් ඇති බව පෙනේ. යල කන්නය තුල දිද පැලසිටුවීමේ ක්‍රමය භාවිතා කිරීම සම්බන්ධයෙන් එක සමාන වෙනස්කමක් දක්නට ලැබේ.

## 6.7 පොහොර භාවිතය

පොහොර භාවිතා කිරීම මගින් වී අස්වැන්න වැඩි කරගත හැකි බව ගොවීන්ගේ විශ්වාසයයි. මහ කන්නය තුළදී අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගෙන් 56% ක් පමණ පොහොර සුළු ප්‍රමාණයක් හෝ භාවිතා කර තිබුනි. සංවර්ධන ප්‍රදේශ 4 තුල පොහොර භාවිතා කළ ප්‍රමාණයේ වෙනස්කම් දක්නට තිබුනි(6.13 වගුව)

6.13 වගුව **සංවර්ධන ප්‍රදේශයන්හි පොහොර භාවිතා කළ ප්‍රමාණයේ ව්‍යාප්ති ප්‍රතිශතය**

පොහොර යෙදූ ප්‍රමාණය වගා කළ ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස

| ප්‍රදේශය | 1977/78 මහ % | 1977 යල % |
|---|---|---|
| 5 | 82 | 81 |
| 6 | 70 | 66 |
| 7 | 50 | 61 |
| 8 | 23 | 17 |
| **සියලු ප්‍රදේශ** | 62 | 69 |

පොහොර භාවිතය පිළිබඳව මෙම සංවර්ධන කලාපයන්තුළ ඇති වෙනසට හේතුව වශයෙන් දැක්විය හැක්කේ ජලය සපයා ගැනීමේ ඇති අපහසුතාවයන්ය.

ජල සැපයුම සාමාන්‍යයෙන් සතුටුදායක වන අංක 5 තුල කන්න දෙකතුළදීම විශාල ලෙස පැතිරුණු පොහොර භාවිතයක් බොහෝ අවස්ථාවන් වලදී දැකිය හැක. අනෙක් අතට විශේෂයෙන් ප්‍රදේශ අංක 8 වැනිවර්ෂා දියෙන්වගා කටයුතු කරන ප්‍රදේශයන්හි අඩු ජල සැපයුම් තත්වයේ බලපෑම නිසා ගොවීන්ගෙන් වැඩි දෙනෙක්ම පොහොර භාවිතයෙන් තොර වූහ.

බහුලව භාවිතා කෙරෙන පොහොර වර්ග අතර යූරියා වැනි නයිට්‍රජනීය පොහොර වර්ග හා මතුපිට පොහොර වශයෙන් භාවිතා කරන ටී.ඩී.එම්.ද වී 1 නැමැති මධ පොහොර මිශ්‍රණය ද වැදගත් වේ. අධ්‍යයනය කළ වගා කන්න දෙක තුළ පොහොර යොදනු ලැබූ මුළු අක්කර ප්‍රමාණයෙන් 60% කම යොදා තිබුණේ යූරියා පමණි. තනි පොහොර වර්ගයක් පමණක් වැඩි වශයෙන් භාවිතා කළ බව දක්නට තිබූ ප්‍රදේශ අංක 8 තුළ පොහොර යෙදූ මුළු අක්කර ප්‍රමාණයෙන් 80% කම යොදා තිබුණේ යූරියා පමණි. සම්පූර්ණ වශයෙන් පොහොර භාවිතය නිසියාකාරව සිදුවන්නේ හොඳ ජල සැපයුමක් ඇති ප්‍රදේශවල බව පැහැදිලි වේ. ප්‍රදේශ අංක 5 තුළ පොහොර භාවිතා කළ මුළු බිම් ප්‍රමාණයෙන් භාගයක යූරියා වලට අමතරව වී 1 පොහොර මිශ්‍රණය භාවිතා කර තිබුණි. මතුපිට පොහොර(ටී.ඩී.එම්) ද මහ කන්නයේදී මෙම ප්‍රදේශය තුළ සෑහෙන ප්‍රමාණයක් (පොහොර යෙදූ මුළු ප්‍රමාණයෙන් 70%) භාවිතා කර තිබුණි. නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මතුපිට යොදන පොහොර වර්ගයක් වශයෙන් අනුමත කර තිබුණේ යූරියා පමණි. කෙසේ වෙතත් යල කන්නයේදී මතුපිට පොහොර භාවිතය අඩු බව කිව හැක.

ප්‍රදේශ 4 තුළම පොහොර භාවිතා කර ඇති ප්‍රමාණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති ප්‍රමාණයට[1] වඩා අඩු මට්ටමක පවතී. පොහොර භාවිතය ඉහළ මට්ටමකින් සිදුවූයේ ප්‍රදේශ අංක 5 තුළය. එහි අක්කරයක් සඳහා හොන්ඩර 1.5 ක ප්‍රමාණයක් භාවිතා කර තිබුණි. අක්කර 1 ක් සඳහා හොන්ඩර 1.1 ක් භාවිතා කළ ප්‍රදේශ අංක 6 අඩුම පොහොර ප්‍රමාණයක් භාවිතා කළ ප්‍රදේශය වශයෙන් පවතී. මුළු අධ්‍යයන ප්‍රදේශයම සමස්තයක් වශයෙන් ගත් විට අක්කර 1 කට යෙදූ පොහොර ප්‍රමාණය හොන්ඩර 1.3 ක් වේ.

පොහොර යෙදූ කාලසීමාව ගැන සැලකීමේදී මධ පොහොර (වී 1) යෙදූ ගොවීන්ගෙන් 80% ක්ම ඒ සඳහා අදාල කාල සීමාව වූ වී වැපිරීමට කලින් එය යොදා ඇති බව පෙනේ. මතුපිට පොහොර(ටී.ඩී.එම්) යොදා ඇති කාලසීමාවන් විවිධාකාරය. වැපිරීමෙන් සති 3 කට පසුව, සති 6 කට පසුව හා සති 8 කට පසුව වශයෙන් ප්‍රධාන කාලසීමාවන් තුනක් තිබුණි. යූරියා භාවිතය වැඩි වශයෙන්ම දක්නට ලැබුණේ (75%) වී වැපිරීමෙන් සති 3 කට හෝ 4 කට පසුවය.

---

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අක්කරයක් සඳහා යෙදිය යුතු පොහොර ප්‍රමාණය වශයෙන් අනුමත කර ඇත්තේ හොන්ඩර 2 1/4 සිට 3 1/4 ප්‍රමාණයකි.

අධ්‍යයන ප්‍රදේශය තුල මේ අයුරින් අඩු මට්ටමක පොහොර භාවිතයක් සිදුවීමට හේතු වූ සාධක කිපයක්ම දැක්විය හැක. ජලය සපයා ගැනීම ආදිය කෙරෙහි ගොවීන් වැඩි වශයෙන්ම භෞතික තරුණු කෙරෙහි විශ්වාසය තැබීමත්, අවශ්‍ය වේලාවට පොහොර සපයා ගැනීමේ අපහසුවත් මෙහිදී ප්‍රධාන වශයෙන්ම කැපී පෙනුනි. කෙසේ වෙතත් ජල සැපයුමත් සමඟ වැඩි වැඩියෙන් පොහොර යෙදීම අස්වනු ප්‍රමාණය වැඩිකර ගැනීමට හේතුවක් විය හැක. (7.1.1 බලන්න)

6.8 වල් මර්ධනය

අධ්‍යයන කාල සීමාවට ඇතුලත් වූ වගා කන්න දෙක තුලදීම වී වගා කළ අක්කර ප්‍රමාණයෙන් 80% කට ආසන්න ප්‍රමාණයක වල් මර්ධන කටයුතු සිදු වූ බව කිව හැක.

6.14 වගුව

වල් මර්ධනය කළ බිම් ප්‍රමාණය හා මර්ධන ක්‍රමය

| | වල්මර්ධනය කළ බිම් ප්‍රමාණය වගාකළ මුළුබිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස % | අතින්වල් මර්ධනය කළ බිම් ප්‍රමාණය % | රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් කළ ප්‍රමාණය % | මුළු ප්‍රමාණය % |
|---|---|---|---|---|
| 1977/78 මහ | 87 | 5 | 95 | 100 |
| 1977 යල | 83 | 4 | 96 | 100 |

රසායනික ද්‍රව්‍ය භාවිතය මගින් මල් මර්ධනය කිරීම මෙම ප්‍රදේශයේ බහුල වශයෙන්ම දක්නට ලැබෙන ක්‍රමයකි. පලල් පත්‍ර සහිත වල් පැලෑටි හා පන් වර්ග මර්ධනය සඳහා 24 – ඩී වර්ගයේ රසායන ද්‍රව්‍ය වැඩි වශයෙන් භාවිතා කෙරේ. අතින් වල් මර්ධන කටයුතු කිරීමට වඩා මෙම ප්‍රදේශයේ රසායන ද්‍රව්‍ය වැඩි වශයෙන් භාවිතා කිරීමට හේතුව පේලි ක්‍රමයකින් තොරව වී වැපිරීම නිසාත්, ජලය රඳවා තැබීමෙන් මර්ධනයට තරම් ජල සැපයුමක් නොවන නිසාය.

### 6.9 කෘමිරෝග හා වසංගත මර්දනය

අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන්ගෙන් තුනෙන් එකක්ම කුමක හෝ කෘමි රෝගයකට එම කාලසීමාව තුළ දී මුහුණ පා ඇත. පොදු වශයෙන් වැඩිපුර දක්නට ලැබුණු කෘමි උවදුර වූයේ කොළකන දළඹුවා හා ගොයම් මැස්සාය. කෘමි උවදුරකට මුහුණ දුන් ගොවීන්ගෙන් 90% ක්ම කෘමිනාශක වශයෙන් රසායන ද්‍රව්‍ය ඉසීම කර තිබුණි.

### 6.10 ශ්‍රම භාවිතය

ශ්‍රම භාවිතයේ අඩු මට්ටමක් පැවතීම පළාතේ වී වගාව අංශයෙන් හැපී පෙනෙන ලක්ෂණයකි. කරන ලද කාර්යය අනුව ශ්‍රම භාවිතයේ ව්‍යාප්තිය සලකා බැලීමේදී බිම් සකස් කිරීම සඳහාත් පෑගීම ඇතුළුව අස්වනු නෙළීම සඳහාත් වැඩිපුර කොටසක් වැය වී ඇත. අධ්‍යයන කාල සීමාවට යටත් වූ වගා කන්න දෙකම සැලකිල්ලට ගත් විට අක්කර 1 කට මිනිස් දින 50 ක එක් කන්නයක් සඳහා වැය වී ඇති අතර පොළොන්නරුව වැනි කන්න දෙක තුළදීම මහා ජල සැපයුමකින් යුක්ත කෘෂි කාර්මික ප්‍රදේශයක් හා සසඳා බලන විට මෙම ප්‍රමාණය ඉතාම පහත් අගයකි.[1] මෙසේ ශ්‍රම භාවිතය අඩු මට්ටමකින් වාර්තා වීමට හේතුව වර්තමානයේ වී වගා කටයුතු වඩා පුළුල් ආකාරයකින් නවීන වගා ක්‍රම යටතේ සිදුවන නිසා විය හැක.

### 6.15 වගුව

කාර්යය අනුව වී වගාව සඳහා ශ්‍රම භාවිතය
(අක්කරයකට මිනිස් දින)

| කාර්යය | 1977/78 මහ මිනිස් දින | % | 1977 යල මිනිස් දින | % |
|---|---|---|---|---|
| බිම් සකස් කිරීම | 16 | 30 | 14 | 29 |
| වැපිරීම/පැලසිටුවීම | 6 | 12 | 6 | 12 |
| රැක බලා ගැනීම | 15 | 29 | 13 | 28 |
| වල් මර්දනය | 2 | 4 | 2 | 3 |
| අස්වනු නෙළීම | 9 | 18 | 10 | 20 |
| පෑගීම | 4 | 7 | 4 | 8 |
| එකතුව | 52 | 100 | 49 | 100 |

1. 1976/77 මහ කන්නය තුළදී පොළොන්නරුව ප්‍රදේශයේ වී අක්කර 1 ක් වගා කිරීම සඳහා මිනිස් දින 92 ක් වැය වී ඇත. "වී ගොවිතැනහි ලාභදායිතාවය හා සම්පත් භාවිතය" (ඒ. එස්. රණතුංග හා ඩබ්ලිව්. ඒ. ටී. අබේසේකර) ගො. ප. පු. ආ. පර්යේෂණ මාලා අංක 23. 1977

අධ්‍යයනය ප්‍රදේශය තුළ ශ්‍රම භාවිතය තීරණය කරන ප්‍රධාන සාධක අතර පවතින ජල සැපයුම් තත්වය හා ගොවීන්ගේ ඉඩම් හිමිකම පිළිබඳ කරුණු ප්‍රධාන වශයෙන් බලපායි. ප්‍රමාණවත් ජල සැපයුමක් ඇති හිඟකමකින් ප්‍රදේශ අංක 5 හැර සෙසු ප්‍රදේශවල ශ්‍රම භාවිතය උසස් මට්ටමක පවත්වා ගෙන යාමට ඇති ඉඩ ප්‍රස්ථාවන් ඉතා අඩුය. ඉඩම් අයිතිය පිළිබඳව ඉතා කුඩා බිම් කොටස් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම මෙම තත්වයට තවත් හේතුවක් විය හැක. මෙම ප්‍රදේශයේ ගෘහ කුටුම්භයන්ගෙන් භාගයකටට තමන්ගේම කුඹුරු ඉඩම් නොමැති අතර [illegible] කුඹුරු වගා කිරීමයි. (5.8 වගුව බලන්න) [illegible] අස්වැන්නෙන් භාගයක කොටසක් බදු කුලිය වශයෙන් ඉඩම් හිමියාට ගෙවිය යුතුය(5.6 වගුව)

මෙවැනි භුක්ති ක්‍රමයක් වර්ෂා ජලයෙන් ගොවිතැන් කටයුතු කරන ප්‍රදේශ සඳහා යොදා ගැනීමෙන් එම ප්‍රදේශවල ගොවිපල කටයුතු සඳහා වැඩිපුර ශ්‍රම ප්‍රමාණයක් යොදා ගනු ඇතැයි කීම අපහසුය.

භාවිතා කළ ශ්‍රමයේ වර්ගය අනුව භාවිතා කළ මුළු ශ්‍රම ප්‍රමාණයෙන් තුනෙන් දෙකක්ම පවුල් ශ්‍රමය වීම නිසා මෙම ප්‍රදේශයේ ගොවිපල කටයුතු සඳහා පවුල් ශ්‍රමය ප්‍රධාන නිෂ්පාදන යෙදවුමක් ලෙස සැලකිය හැක.

6.16 වගුව

වී වගාව සඳහා භාවිතා කළ ශ්‍රම වර්ගය

| ශ්‍රමයේ ස්වභාවය | අක්කර 1 කට මිනිස් දින | | | |
|---|---|---|---|---|
| | 1977/78 මහ | % | 1977 යල | % |
| පවුල් ශ්‍රමය | 34 | 65 | 29 | 60 |
| කුලී ශ්‍රමය | 14 | 28 | 17 | 34 |
| අත්තම් ශ්‍රමය | 4 | 07 | 3 | 06 |
| එකතුව | 52 | 100 | 49 | 100 |

භාවිතා කර ඇති කුලී ශ්‍රමයෙන් හතරෙන් තුනකට ආසන්න ප්‍රමාණයක් බිම් සකස් කිරීමත්, අස්වනු නෙලීම හා පෑගීම සඳහාත් යන කෙටි කාලීන කාර්යයන් දෙක සඳහා වැය වී ඇත. මෙම ප්‍රදේශයේ සිදුවන්නේ යැපුම් මට්ටමේ කෘෂිකර්මයක් යයි

සඳහන් කළ හැක. අවිනිශ්චිත නිෂ්පාදන පරිසරයන් නිසා සිදුවන මෙවැනි තත්වයන් මහාපාදරාව ජනපදය ආශ්‍රිතවද දැකගත හැක.

කෙසේ වෙතත් වර්තමානයේදී සංවර්ධනය සඳහා යෝජිත අක්කර 40,000 තුල අනාගතය ජල සැපයුම සහ භූමිය පිළිබඳ මතුවන ගැටළු එතරම් වැදගත් විය හැකි යයි සිතිය නොහැක. මෙවැනි තත්වයන් යටතේ උසස් ඉඩම් භාවිතයන් හා ඉහළ මට්ටමක ශ්‍රම භාවිතයන් සිදුවන බව සඳහන් කළ හැක. ඉදිරිකාලයේදී ශ්‍රමය සඳහා ඉහළ මට්ටමක ඉල්ලුමක් පවතිනු ඇත. ශ්‍රමය භාවිතා කරන කායකියන් අළුතින් ඇති වීම නිසා මෙම තත්වය ඇතිවනු ඇත. මෙහිදී අවශ්‍ය ශ්‍රම ප්‍රමාණය මෙම ප්‍රදේශය තුළින්ම සපයා ගැනීම අසීරු විය හැකි බැවින් පිටස්තර ප්‍රදේශවල ශ්‍රමයද ලබා ගන්ට සිදුවේ. එමෙන්ම පිටස්තර ප්‍රදේශවලින් පැමිණෙන මෙම ශ්‍රමිකයන්ට අවශ්‍ය පහසුකම් සැලස්වීමද මහවැලි ව්‍යාපාරයේදී අවධානය යොමුකළ යුතු අංගයක් වේ.

6.11 මෙහෙයුම් කටයුතු සඳහා වූ මුදල් වියදම්

මධ ඉඩම් වල සිදුවන ගොවිපල කටයුතු අනුව ඉඩම් ඒකකයක් සඳහා වැය වන මුදල් වියදම අඩු අගයක් ගෙන ඇත. 1977/78 මහ කන්නයේදී වී වගාව සඳහා අක්කරයකට වැය වූ වියදම රුපියල් 450 ක් පමණ වූ අතර මෙම ප්‍රමාණය පොළොන්නරුව වැනි උසස් නිෂ්පාදන ප්‍රදේශයක් හා සසඳා බලන විට අඩු අගයකි.[1] ඉඩම් ඒකකයක් සඳහා අඩු මට්ටමක මුදල් පිරිවැයක් දක්නට ලැබෙන්නේ වැඩි වශයෙන්ම ඉතාමට අඩු වශයෙන් මුදල් වියදම් භාවිතා කළ පාරම්පරික ගොවිතැන් ක්‍රම ආශ්‍රයෙනි.

---

1. 1976/77 මහ කන්නයේදී පොළොන්නරුව ප්‍රදේශයේ අක්කර 1 ක් සඳහා නිෂ්පාදන වියදම රු; 1162 ක් විය. ගො.ප.පු.ආ. පර්යේෂණ අධ්‍යයන අංක 23, 1977
(පී.එස්.රත්නායක හා ඩබ්.ඒ.ටී.අබේසේකර)

6.17 වගුව

### භාවිතා කළ ප්‍රධාන යෙදවුම් අනුව වී වගාව සඳහා අක්කරයකට වැයවූ මුදල්මය මෙහෙයුම් පිරිවැය
### 1977/78 මහ

| මුදල්මය යෙදවුම් | % |
|---|---|
| කුලී ශ්‍රමය | 34 |
| ට්‍රැක්ටර් ගාස්තු | 27 |
| මී හරක් ගාස්තු | 09 |
| බීජ්හර වී සඳහා | 11 |
| පොහොර සඳහා | 12 |
| කෘෂි රසායන ද්‍රව්‍ය සඳහා | 05 |
| වෙනත් වියදම් | 02 |
| | 100 |

(රුපියල් 450)

මුදල් වියදමට ඇතුලත් වැදගත් ශීර්ෂයක් ලෙස කුලී ශ්‍රමය සඳහා ගෙවූ වැටුප් වියදම වැදගත් වේ. මුළු මුදල් වියදම සැලකූ විට මෙම වැටුප් ශ්‍රමය සඳහා වූ වියදම ඉන් තුනෙන් එකකි. දවල් ආහාරයත් සමඟ මෙම ප්‍රදේශයේ පිරිමි ශ්‍රමිකයෙකුට දිනයක වැටුප සඳහා ගෙවූ මුදල් රුපියල් 10.00 ක්ද ස්ත්‍රියක් සඳහා රුපියල් 6.00 ක්ද විය. ගොවිතැන් කටයුතු මෙහෙයුම් කිරීමේදී ඇතැම් කාර්යයන් නියමිත කෙටි කාලසීමාවක් තුලදී ඉක්මනින් අවසන් කළ යුතු බැවින් පවුල් ශ්‍රමය කෙරෙහි පමණක් බලාපොරොත්තු නොතබා කුලී ශ්‍රමය ආදී සඳහා යොදවා ගැනීමට සිදුවී [illegible] සඳහා පුද්ගල කුලී ශ්‍රමය වැඩි වශයෙන් භාවිතා වී තිබීමට හේතු වන්නේ මෙම තත්වයයි.

පොහොර රසායනික ද්‍රව්‍ය වැනි පිටතින් ලබා ගනු ලබන කෘෂි උපකරණ සඳහා වැය කළ මුදල් ප්‍රමාණය අඩු බවද තවත් මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන වැදගත් ලක්ෂණයකි. මෙම තත්වය මගින් පැහැදිලි වන්නේ වී වගාව සඳහා කළ යෙදවුම් ප්‍රමාණයේ අඩු බවයි. ජල සැපයුමේ ඇති අවිනිශ්චිත බව මෙසේ අනෙකුත් යෙදවුම් ප්‍රමාණය අඩු වීමට හේතු වී ඇත. කෘෂිකාර්මික කටයුතු වලදී අධ්‍යාපන ප්‍රදේශයේ ඇති සැලකිය යුතු අවදානම් තත්වයක් වශයෙන්ද ගොවිතැන් කටයුතු පිළිබඳව තීරණ ගැනීමට බලපාන වැදගත් පසුබිමක් ලෙසද මෙම අස්ථිර ජල සැපයුම් තත්වය සැලකිය හැක.

## (ආ) ගොඩ ඉඩම්

### 6.12 හේන

අධ්‍යයන ප්‍රදේශය තුල බහුල වශයෙන් ගොඩ ඉඩම් පාවිච්චි කෙරෙන්නේ හේන් වගාවටය. මේ අනුව මෙම ප්‍රදේශයේ ගොවීන් වාරිමාර්ග සම්පාදිත කුඹුරු මෙන්ම වර්ෂා ජලයෙන් පෝෂණය වන හේන් ද තම වගා කටයුතු සඳහා යොදා ගෙන ඇත.

### 6.18 වගුව

සංවර්ධන ප්‍රදේශ අනුව හේන් වගා කළ ගොවීන්ගේ
ව්‍යාප්ති ප්‍රතිශතය - 1977/78 මහ

| සංවර්ධන ප්‍රදේශ | හේන්වගා කළ ගොවීන් % | හේන්වගා කළ සාමාන්‍ය බිම් බිම් ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 5 | 50 | 1.46 |
| 6 | 64 | 1.64 |
| 7 | 67 | 1.87 |
| 8 | 83 | 1.62 |
| සියළු ප්‍රදේශ | 64 | 1.63 |

හේන් වගාව සඳහා යෝග්‍ය බිම් වැඩි වශයෙන් පවතින ප්‍රදේශ අංක 8 තුල බහුල වශයෙන් හේන් වගා කටයුතු සිදුවන බව පෙනේ. කුඹුරු ඉඩම් සඳහා පවතින අස්ථිර ජල සැපයුම් තත්වයත්,හේන් වගාවට උචිත ඉඩම් තිබීමත් නිසා හේන් වගා කටයුතු සඳහා ගොවීන් වැඩි වශයෙන් අනවසර ඉඩම් භාවිතා කර ඇත. මෙම ප්‍රදේශය වර්ෂාපතනය අඩු ප්‍රදේශයක්ද වන බැවින් වී ගොවිතැනින් ලැබෙන අඩු ආදායම් තත්වය පරිපූරක ස්වරූප ලබන්නේ හේන් වගා කටයුතු වලින් ලබනු ආදායම් මගිනි. ප්‍රදේශ අංක 5ගත්විට එම ප්‍රදේශයේ වාරි ජල සැපයුම් පහසුකම් ඇති නිසා හේන් වගා කටයුතු අඩු වශයෙන් සිදුවන අතර ඉදකන්නයේම වී වගා කිරීම බහුලව දක්නට ලැබේ.

6.19 වගුව

ශ්‍රේණී වගා කටයුතු මෙහෙය වූ කාලය අනුව ගොවීන්ගේ ව්‍යාප්තියේ ප්‍රතිශතය – 1977/78 මහ

| මාසය | වාර්තා කළ ගොවීන්ගේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|
| | එළිපෙහිරීම % | වැටබැඳීම % | වැපිරීම % | අස්වනු නෙලීම % |
| ජූලි | 22 | 1 | | |
| අගෝස්තු | 72 | 15 | | |
| සැප්තැම්බර් | 5 | 65 | 21 | |
| ඔක්තෝබර් | 1 | 15 | 66 | |
| නොවැම්බර් | | 4 | 12 | 1 |
| දෙසැම්බර් | | | 1 | 10 |
| ජනවාරි | | | | 60 |
| පෙබරවාරි | | | | 27 |
| මාර්තු | | | | 2 |
| | 100 | 100 | 100 | 100 |

6.20 වගුව

ශ්‍රේණී වගා කටයුතු මෙහෙයවූ කාලය අනුව ගොවීන්ගේ ව්‍යාප්ති ප්‍රතිශතය – 1977 යල

| මාසය | වාර්තා කළ ගොවීන්ගේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|
| | එළිපෙහිරීම % | වැට බැඳීම % | වැපිරීම % | අස්වනු නෙලීම % |
| පෙබරවාරි | 82 | | | |
| මාර්තු | 18 | 31 | 4 | |
| අප්‍රේල් | | 65 | 74 | |
| මැයි | | 4 | 22 | 8 |
| ජූනි | | | | 68 |
| ජූලි | | | | 24 |
| | 100 | 100 | 100 | 100 |

අධ්‍යයනයේ දත්ත මගින් පෙන්නුම් කරන පරිදි මහ කන්නයේ මුල් භාගයේදී එනම් විශේෂයෙන් අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා කාල සීමාව තුළදී ගොවීන් වැඩි වශයෙන් හේන් වගා කටයුතු වල නිරත වෙති. ඉහත (6.7 වගුව මගින්ද) දැක්වූ පරිදි කුඹුරු වගා කටයුතු පිළිබඳව උච්චතම ආකාරයෙන් මෙහෙයුම් කටයුතු සිදුවන්නේ නොවැම්බර් සිට දෙසැම්බර් අග දක්වා විහිදුනු කාල පරිච්ඡේදයකය. මෙයින් පැහැදිලි වන්නේ කුඹුරු වැඩ සඳහා ශ්‍රමිකයන් සම්බන්ධ වන්නේ හේන් වගා ආරම්භ කිරීමෙන් පසුව බවයි. වී වගාව සඳහා අස්ථිර ජල සැපයුමක් ඇති වියළි කලාපයේ අනෙකුත් ප්‍රදේශ ආශ්‍රයෙන් ද දැකිය හැක්කේ මෙවැනිම තත්වයකි.

හේන් වගා කටයුතු ආශ්‍රිතව තවමත් බල පවත්වන්නේ සාම්ප්‍රදායික වගා ක්‍රම බව අධ්‍යයන දත්තයන්ගෙන් නිරූපනය වේ. පොහොර භාවිතය, කෘමි රෝග හා පලිබෝධ රෝග මර්ධනය වැනි නවීන ක්‍රම මේ ආශ්‍රයෙන් දක්නට නොලැබේ.

වගා කන්න දෙක තුළදී හේන් වල වගා කළ භෝග වර්ග 6.21 වගුව මගින් දැක්වේ.

6.21 වගුව

හේන්වල භෝග වගා රටාව

| | වගාකළ ප්‍රමාණය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන් | |
|---|---|---|
| | 1977 යල % | 1977/78 මහ % |
| මිරිස් | 1 | 48 |
| කව්පි | 5 | 10 |
| එම්බටු | – | 10 |
| තල | 91 | – |
| කුරක්කන් | – | 11 |
| මුංඇට | 1 | 11 |
| බඩඉරිඟු | – | 11 |
| දුම්කොළ | – | 1 |
| වී | – | 2 |
| වෙනත් එළවළු වර්ග | 2 | 6 |
| | 100 | 100 |

හේන්වල වගා කෙරෙන භෝග වර්ග අනුව බලන විට එම භෝග රටාවේ වෙනසක් දැකිය හැක. බොහෝ අවස්ථාවල වැඩි දියුණු කළ නවීන වී වර්ගද හේන් වල වගා කෙරෙනු දැකිය හැක. හේන් වල වගා කෙරෙන භෝග අතුරින් මිරිස් වගාවට ප්‍රධාන ස්ථානය හිමිවේ. කව්පි මීළඟට වැදගත් වන භෝගය වන අතර කුරක්කන්, බඩඉරිඟු වැනි පාරම්පරික භෝගයන්ට දක්වා ඇත්තේ අඩු සැලකිල්ලකි. අංක 7 හා 8 යන සංවර්ධන ප්‍රදේශයන්හි විශාල පරිමාණයකින් වම්බටු වගාව සිදුවේ. යල කන්නයේදී වගා කෙරෙන එකම වැදගත් භෝගය තල පමණි.

6.13 අනෙකුත් ගොඩඉඩම්

අංක 5 හා 6 සංවර්ධන ප්‍රදේශ තුළ හේන් ඔබ්බා වන, ජලසම්පාදිත නොවූ ගොඩ ඉඩම් වැඩි වශයෙන් වගා කෙරෙනු දැකිය හැක. සතුටුදායක වාරිජල සැපයුම් තත්වයක් පවතිනා බැවින් ප්‍රදේශ අංක 5 තුළ කුඹුරු වගාව මෙන්ම ගොඩ ඉඩම් භාවිතයද සෑහෙන දියුණු මට්ටමක පවතී. මෙම ප්‍රදේශයේ කලින් හේන් වශයෙන් පැවති බොහෝ ඉඩම් දැන් සංවර්ධනය වීමෙන් පසු පොල්, කොස්, දෙල්, අඹ, දෙහි වැනි ස්ථිර වගාවන්ට යටත්ව පවතී. මෙහි දක්නට ලැබෙන ප්‍රධාන අතිරේක භෝග වගාවන් වන්නේ     මහ කන්නයේදී මිරිස්, කව්පි, බඩ ඉරිඟු හා එළවළු ද යල කන්නයේදී කව්පි හා තල වගාවයි. කෘමිරෝග මර්ධනය සඳහා කෘෂිරසායන ද්‍රව්‍ය යෙදීමක් දක්නට ඇත්තේ මිරිස්වගාව ආශ්‍රයෙන් පමණි.

## 7. අස්වනු මට්ටම් හා එහි පරිහරණ රටාව

වී වගාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් භෝග අස්වනු පිළිබඳ විග්‍රහයක් හා ඒවායේ පරිහරණය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මෙමගින් ඉදිරිපත් කෙරේ.

### 7.1 අස්වනු මට්ටම්

#### 7.1.1 වී

අධ්‍යයන කාල සීමාව තුලදී වී අස්වනු නෙළා අවසන් කර නොතිබුනි. අස්වනු පිළිබඳ දත්ත ලබා ගැනුනේ ඇස්තමේන්තු කළ අගයන් මතය. ප්‍රදේශය තුළ වාර්තා වූ අස්වනු ප්‍රමාණයේ සාමාන්‍යය පහත දැක්වේ.

| | අක්කර 1 කට ලැබූ අස්වැන්නේ සාමාන්‍යය (බුසල්) | සම්මත දෝෂය | 95% විශ්‍රම්භ ප්‍රාන්තරය |
|---|---|---|---|
| 1977/78 මහ | 53 | 1.7 | 50–57 |
| 1977 යල | 42 | 1.9 | 38–46 |

1977/78 මහ කන්නයේදී ලැබුණු අස්වැන්න සාමාන්‍යයෙන් සතුටුදායක ලෙස සැලකිය හැකි අතර එයට බල පෑ එක් හේතුවක් වූයේ එම කන්නය තුළදී ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබීම බව කිව හැක.

7.1 වගුව. සංවර්ධන ප්‍රදේශ තුළ අක්කර 1 කට ලැබුණ වී අස්වනු ප්‍රමාණය

| ප්‍රදේශය | කාල සීමාව මහ | කාල සීමාව යල |
|---|---|---|
| 5 | 58<br>(2.5) | 42<br>(2.9) |
| 6 | 58<br>(4.0) | 46<br>(3.7) |
| 7 | 47<br>(2.6) | 48<br>(4.0) |
| 8 | 50<br>(3.9) | 29<br>(4.6) |

(වරහන් තුළ ඇති සංඛ්‍යා සම්මත දෝෂය දක්වයි)

මෙම සංවර්ධන ප්‍රදේශ හතර තුළ කලින්ද සඳහන් කළ පරිදි වාරි ජල පහසුකම් අතින් සෑහෙන වෙනස් කමක් දක්නට ඇති නමුත්, මෙහි අස්වනු මට්ටම අතින් එතරම් වෙනස් කමක් දක්නට නොලැබේ. විශේෂයෙන්ම සංවර්ධන ප්‍රදේශ අංක 5 හා 8 අතර වාරිමාර්ග පහසුකම් එකිනෙකට හාත් පසින් වෙනස් වුවත් මහ කන්නයේ අස්වැන්න අතින් සමාන තත්වයක් දක්නට ලැබීම කැපී පෙනෙන කරුණකි. වාරිමාර්ග පහසුකම් නැති ප්‍රදේශවල වුවද ඉහළ අස්වනු මට්ටමක් දක්නට ලැබුණේ මහ කන්නයේදී ලැබුණ වර්ෂාව නිසා බව කිව හැක. කෙසේ වුවත් යල කන්නයේ දී වාරිමාර්ග පහසුකම් වල ඇති වෙනස්කම් හේතුවෙන් ප්‍රදේශ අනුව ඇති අස්වනු මට්ටම් වල වෙනස් කම් විශාල වශයෙන් දැකිය හැක. ඒ අනුව අංක 8 සංවර්ධන ප්‍රදේශයේ එම කන්නයේදී ලැබී ඇත්තේ අක්කරයකට බුසල් 29 ක තරම් අඩු අස්වනු ප්‍රමාණයකි. මේ අනුව නිෂ්පාදන මට්ටම් වෙනස්වීම සඳහා ජල සැපයුම් තත්වය සෑහෙන දුරට වැදගත් වන බව නිගමනය කළ හැක.

දත්ත සපයා ගැනීමේ අපහසුකම් නිසා ජල සැපයුම් තත්වයට අනුව වී වගාවෙන් ලැබෙන අස්වනු මට්ටම් වෙනස්වීම පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් කිරීම, මෙම අධ්‍යානය මගින් කළ නොහැකි විය. නියැදි ගොවීන්ගේ 80% ක් පමණ කොටසක්ම ග්‍රාමීය වැව් යටතේ කුඹුරු වගාකළ ගොවීන්ගෙන් යුක්ත වූහ.

| ජල සැපයුම් මාර්ගය | 1977/78 මහ | 1977 යල |
|---|---|---|
| ග්‍රාමීය වැව් මගින් | 53.0 | 38.8 |
| ප්‍රධාන වාරි මාර්ග මගින් | 59.1 | 54.5 |

ඉහතින් පෙනෙන පරිදි ප්‍රධාන වාරිමාර්ග යටතේ ඇති කුඹුරු වල අස්වැන්න මහ කන්නයේදී මෙන්ම යල කන්නයේදී ද ඉහල අගයක් පෙන්වයි. මෙවැනි තත්වයක් ප්‍රදේශයේ ග්‍රාමීය වැව් යටතේ ඇති කුඹුරුවල දක්නට නොලැබීම වැදගත් කරුණකි.

වී ගොවිතැනේදී අස්වනු මට්ටම් තීරණය කිරීමේ තවත් එක් සාධකයක් ලෙස, පොහොර භාවිතය වැදගත් වන බැවින් ඒ පිළිබඳ දත්ත තව දුරටත් අධ්‍යයනය කරන ලදී.

රසායනික පොහොර භාවිතය අනුව වී අස්වනු මට්ටම 1977/78 මහ

| | අක්කර 1 ක අස්වනු ප්‍රමාණයේ සාමාන්‍යය (බුසල්) | සම්මත දෝෂය | 95% විශ්‍රම්භ ප්‍රාන්තරය |
|---|---|---|---|
| පොහොර භාවිතා කළ | 59.6 | 2.4 | 55–64 |
| පොහොර භාවිතා නොකළ | 47.1 | 2.9 | 41–53 |

රසායනික පොහොර භාවිතා කළ හා භාවිතා නොකළ අයගේ අස්වනු මට්ටම් අතර සෑහෙන පරතරයක් පවතී. (බුසල් 12) පොහොර යෙදූ අයගෙන්ද වැඩි කොටසක්ම යොදා ඇත්තේ අක්කර 1 කට හොන්ඩර 1.3 කි. මෙය අක්කරයක් සඳහා නිර්දේශිත පොහොර ප්‍රමාණය **හොන්ඩර** 3 ට වඩා අඩු ප්‍රමාණයකි.

## 7.1.2 හේන

හේන් ගොවිතැනින් ලැබෙන අස්වැන්න අඩු මට්ටමක පවතින අතර එය බොහෝ දුරටම තීරණය වන්නේ **වර්**ෂාපතනය ආදී කාලගුණික තත්වයන්ගේ බලපෑම අනුවය. හේන් වගා වන් සාමාන්‍යයෙන් මිශ්‍ර භෝග වලින් යුක්ත වන නිසා දළ වශයෙන් පහත සඳහන් අස්වනු මට්ටම් ඒ සඳහා දැක්විය හැක.

| භෝගය | අක්කරයකට අස්වැන්න |
|---|---|
| කව්පි (බුසල්) | 7 |
| කුරක්කන් (බුසල්) | 11 |
| බඩ ඉරිඟු (බුසල්) | 10 |
| වී (බුසල්) | 32 |
| එම්බටු (රාත්තල්) | 6,000 |
| වියළි මිරිස් (රාත්තල්) | 144 |

## 7.2 වී පරිහරණ රටාව

මහ කන්නයේ මුළු වී නිෂ්පාදන ප්‍රමා**ණයෙන්** 31% ක් විකුණා ඇති අතර 34% ක් නිවසේ පාරිභෝජනය සඳහා තබා ගෙන ඇත. (7.2 වගුව)

7.2 වගුව වී පරිහරණ රටාව

| | 1977/78 මහ බුසල් ප්‍රමාණය | මුළු නිෂ්පාදන යේ ප්‍රතිශතයක් ලෙස % | 1977 යල බුසල් ප්‍රමාණය | මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|
| අලෙවි කළ ප්‍රමාණය | 4281 | 31 | 4332 | 44 |
| පාරිභෝජනය සඳහා තබාගත් ප්‍රමාණය | 4808 | 34 | 3545 | 36 |
| කුලී සඳහා ගෙවීම් | 2105 | 15 | 894 | 9 |
| ණය සඳහා පොළී | 686 | 5 | 153 | 2 |
| වෙනත් ද්‍රව්‍යමය ගෙවීම් | 637 | 5 | 384 | 4 |
| බීජතර වී සඳහා | 1095 | 8 | 564 | 6 |
| පසුව විකිණීමට තබාගත් ප්‍රමාණය | 393 | 3 | 72 | 1 |
| මුළු ප්‍රමාණය | 14005 | 100 | 9944 | 100 |

යල කන්නයේදී ලැබුණ අස්වැන්නෙන් 44% ක් අලෙවි කළ බවට වාර්තා වුවද එයඇත්ත වශයෙන් අස්වැන්න වැඩි වීමත්නිසා නොව, ගෙවූ ඉඩම් බදු, ණය පියවීම් හා වෙනත් වියදම් ඉතා අඩුවීම නිසාත් ඇති වූවකි. යල කන්නයේ වී වගා කළ ගොවීන්ගෙන් භාගයකටත් වඩා වැඩි ප්‍රමාණයක් අංක 5 ප්‍රදේශයේ දත්තට ලැබුණු අතර මොවුන් සියළු දෙනාම වාගේ ඉඩම් හිමියන් වූහ.

ගෘහස්ථ පාරිභෝජනය සඳහාතබාගත් ප්‍රමාණය කන්නයකට වී බුසල් 35 ක් පමණ විය. වාර්ෂික සහල් පාරිභෝජනය සලකා බලන විට එක් පුද්ගලයෙකුට වාර්ෂිකව කිලෝ ග්‍රෑම් 97 ක් වන පරිදි හය දෙනෙකු සිටින පවුලක් සඳහා වාර්ෂික සහල් අවශ්‍යතාවය බුසල් 41 ක් පමණ වේ. මේ අනුව ගම්බද ගො විපවුලක අවශ්‍යතා සලකා බලන විට ගෘහස්ථ පාරිභෝජනය සඳහා තබා ගන්නා වී ප්‍රමාණය ඒ සඳහා වැදගත් ආධාරකයක් බව පෙනී යයි.

මහ කන්නයේදී වෙළඳ පලට ඉදිරිපත් කරන ලද වී ප්‍රමාණයෙන් 90% ක්ම ලැබී ඇත්තේ අංක 5, 6, සහ 7 යන ප්‍රදේශ වලිනි. එහෙත් යල කන්නයේදී අංක 5 ප්‍රදේශයෙන්, වෙළඳපලට ඉදිරිපත් කරනු ලැබූ මුලු වී ප්‍රමාණයෙන් 40%ක් ඉදිරිපත් කෙරින.

විකුණන ලද මුළු වී ප්‍රමාණයෙන් වැඩි කොටසක්ම විකුණා ඇත්තේ අස්වනු නෙලූ විගසමය. පසුව විකිණීම සඳහා තබා ගෙන ඇත්තේ අස්වනු ප්‍රමාණයෙන් ඉතා සුළු කොටසකි. මෙයට බල පෑ හේතුව වශයෙන් සඳහන්කළ හැක්කේ වී සඳහා සහතික මිළ

ක්‍රමයක් පවතින බැවින් අනාගතයේදී මිල වැඩි වේ යැයි බලාපොරොත්තුවෙන් වී රැස්කර තබා ගැනීමේ අවශ්‍යතාවයක් මෙහි දී මතු නොවීමයි. අස්වනු නෙලූ විගසම එම නිෂ්පාදන වෙළඳ පලට ඉදිරිපත් කිරීමේදී මතුවන ප්‍රශ්නයක් නම් ප්‍රවාහණ හා ගබඩා පහසුකම් සැලසීමේදී දුෂ්කරතාවක් ඇතිවීමයි.

## 7.3 හේන් නිෂ්පාදන හා පරිහරණ රටාව

මහ කන්නයේදී ගොවීන් විසින් වගාකළ හේන් භෝග අතුරින් වම්බටු වගාව ප්‍රධාන වේ. මුදල් ආදායම් ලැබිය හැකි භෝග අතුරින් වැඩිම ආදායමක් ලබා දීමට සමත් වී ඇත්තේද මෙයයි. මිරිස් වගාව මී ළගට පුළුල් ලෙස පැතිරුණු හේන් භෝගයක් වශයෙන් සඳහන් කළ හැක. වැදගත්කම අතින් තෙවන ස්ථානය හිමිවන්නේ කව්පි වගාවටය. කුරක්කන් හා බඩ ඉරිගු වලට වර්තමාන හේන් වගාවේදී එතරම් වැදගත් ස්ථානයක් හිමි නොවන අතර සාමාන්‍යයෙන් නිවසේ පරිභෝජනය සඳහා පමණක් කුරක්කන් වගාව සිදුවේ.

## 7.3 වගුව

හේන් භෝග නිෂ්පාදනය හා අලෙවිය (1977/78 මහ සහ 1977 යල)

| භෝගය | වගාවේ යෙදුනු ගොවීන් සංඛ්‍යාව | අක්කරයක මුළු නිෂ්පාදනයේ වටිනාකම (රුපියල්) | අක්කරයක මුළු අලෙවියේ වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| මහ කන්නයේ භෝග වර්ග | | | |
| මිරිස් | 256 | 942 | 632 |
| වම්බටු | 47 | 2520 | 2394 |
| කව්පි | 68 | 677 | 234 |
| බඩ ඉරිඟු | 97 | 343 | 162 |
| කුරක්කන් | 89 | 165 | 24 |
| එළවළු | 39 | 362 | 361 |
| මුං ඇට | 11 | 1047 | 893 |
| දුම්කොළ | 4 | 1063 | 125* |
| යල කන්නයේ භෝග වර්ග | | | |
| තල | 190 | 659 | 596 |
| කව්පි | 26 | 771 | 548 |

(* අධ්‍යයන කාල සීමාව තුළදී අලෙවි කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී නොතිබුණි)

හේන් වගා වේ ඇති අඩු ඵලදායිතාවයත්, එම භෝග වර්ගයන්ට ලැබෙන මිල පහත් මට්ටමක පැවතීමත්, හේන් අස්වැන්නෙන් ලැබෙන ආදායම පහත් මට්ටමක පැවතීමට හේතු වී ඇත.

හේන් නිෂ්පාදන අතුරින් වම්බටු හා ආනමාළු එළවළු වර්ග අස්වනු නෙලූ අවස්ථාවේ දීම විකුණනු ලබන අතර, කව්පි, මුංඇට, මිරිස් වැනි භෝග වර්ගයන් පසුව විකිණීම සඳහා තබා ගනු ලැබේ.

හේන් නිෂ්පාදන අලෙවිය සඳහා මාර්ග කිහිපයක්ම යොදා ගනු ලැබේ. මේ අතරින් ප්‍රධාන අලෙවි මාර්ග දෙකක් සඳහන් කළ හැක. එනම් හේන් වලට හෝ ගම් වලට පිටතින් පැමිණ භෝග වර්ග මිලදී ගන්නා වෙළෙන්දන් හා ගම තුල හෝ ආසන්නයේ ස්ථානගතව ඇති කුඩා වෙළඳ සැල් (කඩ) හිමියන්ය. හේන් භෝග අලෙවි කළ අයගෙන් 72% ක්ම ඉහත කී මාර්ග දෙක මගින් තම නිෂ්පාදන අලෙවි කර ඇත. හේන් නිෂ්පාදන අලෙවි මාර්ග දෙස බලන විට ඒ සඳහා රජයේ සංවිධානයක් නොමැති වීම මෙහිදී ඇති අඩුපාඩුවක් ලෙස සඳහන් කළ හැක.

7.4 වගුව

ගොවීන් වාර්තා කළ පරිදි හේන් නිෂ්පාදන සඳහා ලැබුණු මිල මට්ටම්

| භෝගය | ඒකකය | 1977/78 මහ උපරිම මිල (රු:) | 1977/78 මහ අවම මිල (රු:) | 1977 යල උපරිම මිල (රු:) | 1977 යල අවම මිල (රු:) |
|---|---|---|---|---|---|
| මිරිස් | රාත්තල් 1 | 9.36 | 8.70 | 12.00 | 10.00 |
| වම්බටු | රාත්තල් 1 | 0.55 | 0.26 | 0.60 | 0.10 |
| කව්පි | බුසල් 1 | 96.11 | 78.57 | 128.57 | 73.57 |
| තල | බුසල් 1 | - | - | 102.09 | 85.71 |
| කුරක්කන් | බුසල් 1 | 16.00 | 16.00 | - | - |
| බඩ ඉරිඟු | බුසල් 1 | 33.90 | 30.50 | 26.00 | 26.00 |
| මුං ඇට | බුසල් 1 | - | - | 120.00 | 90.00 |

ඉහතින් දැක්වූ පරිදි හේන් නිෂ්පාදන සඳහා ගොවීන්ට ගෙවන මිල සාමාන්‍යයෙන් අඩු අගයක් පෙන්නුම් කරන අතර විශේෂයෙන් වම්බටු, කව්පි හා එළවළු යන්හිදියේ මිල ඉතා අධික වශයෙන් විචල්‍ය වේ. හේන් නිෂ්පාදන අංශය සඳහා සහතික මිල මට්ටමක් ඇති කරවීම එහි නිෂ්පාදනය වැඩි කරවීමට හේතුවක් විය හැක.

මෙහි ගොවීන්ගේ දුෂ්කරතාවන් අතුරින් ප්‍රධාන ප්‍රශ්න දෙකක් පැහැදිලිව නිරූපණය විය. එනම් නිෂ්පාදන සඳහා ලැබෙන අඩු මිල මට්ටම හා ඒවායේ අලෙවි මාර්ගයන්ගේ හිඟ බවයි.

කෘෂිකාර්මික නිෂ්පාදන මිලදී ගැනීම සම්බන්ධයෙන් ඇති එකම අලෙවි මධ්‍යස්ථානය වශයෙන් දැනට මෙහි දක්නට ඇත්තේ සමූපකාර සමිති පමණි. මෙහිදීද මූලික අවධානය යොමු වී ඇත්තේ වී සඳහා පමණි. මෙම අතිරේක භෝග වගාවන් දියුණු කිරීමට නම් එම නිෂ්පාදන සඳහා ක්‍රමවත් අලෙවි පහසුකම් හා සහතික මිල මට්ටමක් ඇති කරවීම වැදගත් ක්‍රියා මාර්ගයක් විය යුතුය.

## 8 ආයතනික සම්බන්ධතා

### 8.1 ග්‍රාමීය ආයතන

ගොවිපල ආධාරක සේවාවන්; කෘෂි කර්ම ව්‍යාප්ති කටයුතු, ගො විරය, ගොවිඋපකරණ සැපයීම් සහ අලෙවිකරණ මාර්ගයන් පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

අධ්‍යයන ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු වලදී අත්‍යාවශ්‍ය සේවාවන් සපයන ආයතන කීපයක් අතුරින් පොහොර කෘෂිරසායන ද්‍රව්‍ය ආදියේ ප්‍රධාන සැපයුම් මාර්ගය ග්‍රාමීය සමුපකාර සමිතිය වේ. මෙයට අමතරව වී මිළදී ගැනීමේ කටයුතු වලදී වී අලෙවි මණ්ඩලයේ නියෝජිතවරුන් වශයෙන් ද මෙම සමුපකාර සමිති කටයුතු කරති. කෘෂිකාර්මික ණය සපයන ප්‍රධාන බැංකු දෙකක් වූ ලංකා බැංකුව හා මහජන බැංකුවේ ශාඛා හා ග්‍රාමීය බැංකු මෙම ප්‍රදේශයේ ආයතනික ණය සැපයීමේ මාර්ගයන් වේ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් පරිපාලනමය කටයුතු සහ පොහොර බෙදාදීම, සුළු වාරිමාර්ග නඩත්තු කිරීම ආදී වෙනත් ග්‍රාමීය මට්ටමේ සැපයුම් සේවාවන් පවත්වාගෙන යන අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය මඟින් ගොවි උපදෙස් කටයුතු මෙහෙයවයි.

විවිධ ග්‍රාමීය ආයතනයන් විසින් අධ්‍යයන ප්‍රදේශය සඳහා දැනට සපයනු ලබන සේවාවන් පිළිබඳව ප්‍රදේශ අනුව කළ වර්ගීකරණයන් 8.1 වගුව මගින් දැක්වේ.

8.1 වගුව

සංවර්ධන ප්‍රදේශ අනුව ග්‍රාමීය ආයතන හා ඒවායේ
සේවා අංශයන්හි ව්‍යාප්තිය

| ආයතනය/ සේවා අංශය | ඒකක ගණන හෝ සේවය සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | අංක 5 ප්‍රදේශය | අංක 6 ප්‍රදේශය | අංක 7 ප්‍රදේශය | අංක 8 ප්‍රදේශය | මුළු ප්‍රදේශය |
| ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරීන් | 1 | 1 | 1 | 1 | 4 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරු (A.I) | 1 | 1 | 1 | 1 | 4 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් (K.V.S.) | 4 | 2 | 4 | 7 | 17 |
| ශාඛා සමුපකාර සමිති සංඛ්‍යාව | 7 | 5 | 9 | 6 | 27 |
| සමුපකාර සමිතිය සපයන වෙනත් සේවා: | | | | | |
| 1. පොහොර අලෙවිය | 5 | – | 5 | 3 | 13 |
| 2. කෘමිනාශක අලෙවිය | 5 | 1 | 5 | 3 | 14 |
| 3. වී මිලදී ගැනීම | 7 | 4 | 7 | 2 | 20 |
| 4. අතිරේක භෝගවල මිලදී ගැනීම | 7 | 2 | 1 | – | 10 |
| බැංකු ශාඛාවන් | | | | | |
| 1. ලංකා බැංකුව | 1 | – | 1 | 1 | 3 |
| 2. මහජන බැංකුව | 1 | – | – | 1 | 2 |
| 3. ග්‍රාමීය බැංකුව | 1 | – | 1 | 1 | 3 |

නිෂ්පාදනය අතින් ඇති පහත් මට්ටම මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික අංශයේ දක්නට ඇති සාමාන්‍ය ලක්ෂණයක් වී තිබේ. මෙයට මූලික හේතු සාධක වශයෙන් අඩුමටත් ජල සැපයුම් තත්වය දැක්විය හැක. මෙම අඩු ජල සැපයුම් තත්වයට හේතු වන්නේ දියුණු ශිල්පීය ක්‍රම භාවිච්චිය අඩු නමයි. ක්‍රමවත් ආකාරයකින් සිදු නොවන ගොඩ ඉඩම් වගාවත්, බහුල වශයෙන් සිදුවන හේන් වගාවත් මෙහි දක්නට ඇති අනෙකුත් වැදගත් අංග අතර වේ. හේන් ගොවිතැන මෙම ප්‍රදේශයේ වැදගත් ආර්ථික කටයුත්තක් වුවත් එවැනි වගා ක්‍රමයන් වී වගාව මෙන්නොව ආයතනික සේවා සඳහා ඉතා අඩු ඉල්ලුමක් පෙන්නුම් කරයි.

ප්‍රදේශයේ ඇති ග්‍රාමීය ආයතන මගින් සැපයෙන සේවාවන් ප්‍රයෝජනයට ගැනීමේ පහත් මට්ටම, පළාතේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳව ඇති තත්වය පිළිබිඹු කරයි. මෙයට බලපාන හේතුව විය හැක්කේ මෙම ආයතන යනී සමහරෙක් විසින් සපයන සේවාවන් පිළිබඳව ඇති අඩුපාඩුකම්ය. බීජ්තර වී, පොහොර, කෘෂිරසායන ද්‍රව්‍ය හා ගොවි උපකරණ සැපයීම නිෂ්පාදන අලෙවිය, ණය පහසුකම්, ව්‍යාප්ති සේවා සහ භෝග රක්ෂණය වැනි සේවාවන් සැපයුම් තත්වය අනුව බලන විට මෙම ප්‍රදේශයේ සිදුවන කෘෂිකර්මය මුදල් සපයන කර්මාන්තයකට වඩා යැපුම් මට්ටමේ පවතින්නක් බව කිව හැක. ආයතනික සේවාවන් කෙරෙහි ඇති අඩු රඳා පැවැත්ම ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල අඩු දියුණුවටද හේතු වී ඇත. 1977/78 මහ කන්නයේදී වී වගාව සම්බන්ධයෙන් ඇති ආයතනික රඳා පැවැත්මේ ප්‍රමාණය 8.2 වගුව මගින් දක්වයි. වී වගාකළ ගොවීන්ගෙන් භාගයක් පමණ වගා ණය ලබා ගැනීම, පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය ලබා ගැනීම යන සේවාවන් සඳහා ආයතනික මාර්ග උපයෝගී කර ගත්හ.

8.2 වගුව

**වී වගාවට සම්බන්ධ සේවාවන් ලබා ගැනීම සඳහා ආයතනික පහසුකම් මත රඳා පැවැත්ම (1977/78 මහ)**

| සේවාව | සේවාවන් ලබාගත් ගොවීන් සංඛ්‍යාව සහ එහි ප්‍රතිශතය: ගොවීන් ගණන | මුළු ගොවීන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (මුළු ගණන–512) | මහකන්නයේ වගා කළ ගොවීන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (මුළු ගණන–301) |
|---|---|---|---|
| වගා ණය | 148 | 29 | 49 |
| බීජ්තර වී මිලදී ගැනීම | 29 | 6 | 10 |
| පොහොර මිලදී ගැනීම | 124 | 24 | 41 |
| කෘෂිරසායන ද්‍රව්‍ය ලබා ගැනීම | 146 | 29 | 49 |
| වී අලෙවි කිරීම | 70 | 14 | 23 |
| වගා රක්ෂණය | 78 | 15 | 26 |

8.2 වගා ණය

8.2.1 වී වගාව සඳහා ණය ගැනීම

මහ කන්නයේ වී වගා කළ ගොවීන්ගේ මුළු සංඛ්‍යාවෙන් භාගයක්

පළමුවෙනි වගා කටයුතු සඳහා ආයතනික මාර්ග වලින් ණය ලබා ගෙන ඇත. එහෙත් අංක 6 ප්‍රදේශයේ ගොවීන් වගා ණය අඩුවෙන්ම යොදාගත් බව පෙන්නුම් කරයි. බැංකු ශාඛාවන් නැති කම මෙම ප්‍රදේශයේ ණය ලබා ගැනීමේ ප්‍රමාණය අඩුවීමට බල පෑ හේතුවක් විය හැක. තවත් හේතුවක් වශයෙන් දැක්විය හැක්කේ මෙම ප්‍රදේශයේ ගොවීන් හේන් වගාවෙන් වැඩිපුර මුදල් ආදායමක් ලබාගනීමයි.

අධ්‍යයනයට අදාළ ප්‍රදේශ හතර තුළ ණය ලබා ගැනීම හා මුදල් යෙදවුම් භාවිතා කිරීම අතර ඇත්තේ අඩු සම්බන්ධතාවයකි. එසේ වුවද ප්‍රදේශ අංක 5 තුළ මුදල් යෙදවුම් යොදා ගැනීමේ ඉහළ මට්ටමක් තිබුණත් ණය පහසුකම් ප්‍රයෝජනයට ගැනීම අතින් අංක 7 හා 8 ප්‍රදේශ අතර දී වෙනසක් නො පෙනුනි. පොහොර භාවිතාව අතින් ඉහළ අගයක් වාර්තා කළ අංක 6 ප්‍රදේශයේ ණය පහසුකම් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉතාමත් අඩු මට්ටමකිනි.

8.3 වගුව

වී වගාව සඳහා ණය ලබා ගැනීම

| | ප්‍රදේශය තුළ ණය ලබාගත් අයගේ ප්‍රමාණය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රදේශ අංක 5 | | ප්‍රදේශ අංක 6 | | ප්‍රදේශ අංක 7 | | ප්‍රදේශ අංක 8 | | මුළු ප්‍රදේශය | |
| | අ | ආ | අ | ආ | අ | ආ | අ | ආ | අ | ආ |
| යල 1977 | 4 | 6 | – | – | 2 | 9 | 3 | 20 | 9 | 7 |
| මහ 1977/78 | 48 | 43 | 17 | 29 | 32 | 56 | 44 | 60 | 141 | 47 |

(අ) = ණය ලබාගත් අයගේ ගණන

(ආ) = ණය ලබා ගත් අයගේ සංඛ්‍යාව කන්නයේ වී වගා කළ අයගේ ප්‍රතිශතයක් ලෙස

යල කන්නයේදී ණය ලබා ගෙන ඇත්තේ ඉතා සුළු ගොවීන් ප්‍රමාණයකි. මහ කන්නයේදී ණය ලබා ගැනීම ඉහළ මට්ටමකින් නිරූපණය වන්නේ 1977 අගෝස්තු මාසයේදී ක්‍රියාත්මක වූ ණය දීමේදී වූ ලිහිල් භාවයන්ය. කලින් ලබා ගත් ණය නො ගෙවූ අයටද නව දුරටත් ණය ලබා දීම සුදුසු බව දැක්වූ රජයේ ප්‍රතිපත්තිය අනුව මහ කන්නයේදී ලබා ගත් ණය ප්‍රමාණය මේ ආකාරයෙන් වැඩි වීමට හේතු විය.

අධ්‍යයන දත්ත මගින් නව දුරටත් පැහැදිලි වන පරිදි වගා ණය ලබා ගැනීමේදී ආයතනික මාර්ගය ඒ සඳහා වැඩියෙන්ම වැදගත් වන අංශයයි. මහ කන්නයේදී වගා ණය වලින් 94% ක්ම ලබා ගෙන ඇත්තේ ආයතනික මාර්ගයන් ගෙනි. ගොවිපිල කටයුතු සඳහා මුදල් පාවිච්චි කිරීමේදී නෑදෑයින් හා මිත්‍රයන්ගෙන් ලබාගත් ණය ඉතාම අඩු වැදගත් කමක් පෙන්නුම් කෙරීන. නෑදෑ හිතවතුන්ගෙන් ලබා ගත් ණය ප්‍රමාණය මෙන්ම ගෙවූ පොලියද අඩු වූ අතර ඒවා ලබා ගැනීමට ගොවීන් දක්වා ඇත්තේ අඩු සැලකිල්ලකි.

8.4 වගුව වී වගාව සඳහා ණය පහසුකම් ප්‍රයෝජනයට ගැනීම
1977/78 මහ

| ප්‍රදේශය | ණයලබාගත් මාර්ගය | ණයලබාගත් ගොවීන් ගණන | ගත්ණය ප්‍රමාණය (රුපියල්) | වාර්ෂික පොලිය (%) | අක්කරයකට ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|---|---|---|
| 5 | පුද්ගලික | 3 | 711 | 7.67 | 149.68 |
| | ආයතනික | 44 | 56250 | 12.16 | 516.29 |
| | යහළුවන් හා නෑදෑයින්ගෙන් | 2 | 400 | 10.00 | 100.00 |
| 6 | පුද්ගලික | 2 | 1,020 | 6.00 | 408.00 |
| | ආයතනික | 15 | 15,363 | 11.73 | 722.96 |
| | යහළුවන් හා නෑදෑයින්ගෙන් | - | - | - | - |
| 7 | පුද්ගලික | - | - | - | - |
| | ආයතනික | 31 | 28,564 | 11.90 | 389.95 |
| | යහළුවන් හා නෑදෑයින්ගෙන් | 2 | 300 | - | 66.67 |
| 8 | පුද්ගලික | - | - | - | - |
| | ආයතනික | 44 | 50.671 | 11.07 | 367.74 |
| | යහළුවන් හා නෑදෑයින්ගෙන් | - | - | - | - |
| ව්‍යාපාර ප්‍රදේශය | පුද්ගලික | 5 | 1,731 | 7.00 | 238.76 |
| | ආයතනික | 134 | 150,848 | 11.69 | 559.84 |
| | යහළුවන් හා නෑදෑයින්ගෙන් | 4 | 700 | 5.00 | 82.35 |

8.2.2 ගොඩ ඉඩම් වගාව සඳහා ණය භාවිතා කිරීම

හේන් වගා හැරුණ විට වෙනත් ගොඩ ඉඩම් වගාවේ යෙදුනු ගොවීන් ප්‍රදේශය තුල දක්නට ලැබුනේ කලාතුරකින් අතලොස්සක් පමණි. ඔවුන්ගෙන්ද කෙනෙක් එකක් පමණ මහ කන්නයේදී ණය ලබා ගත් අතර යල කන්නයේදී ණය ලබා ගත්තේ

6% ක් පමනි. මෙහිදීද ණය ලබා ගැනීමේදී ආයතනික අංශය වැදගත් වී ඇත. වගා ණය යොදවා ගත් ප්‍රදේශයන් අනුව සලකා බැලීමේදී ප්‍රදේශ අංක 8 ට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රදේශ අංක 8 විසින් ණය වශයෙන් ලබා ගෙන තිබුනි.

8.3 ද්‍රව්‍යමය යෙදවුම්සැපයුම

8.3.1 බීජවර වී

කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය විසින් සැලසෙන එක් සැපයුම් සේවාවක් වශයෙන් බීජවර වී නිෂ්පාදනය හා බෙදා හැරීම මෙහෙයවනු ලැබේ. කලින්ද සාකච්ඡා කළ පරිදි වැඩි දියුණු කළ නව වී වර්ග අධ්‍යයන ප්‍රදේශය තුල උසස් මට්ටමකින් භාවිතා කළද නුවුහුන් බීජ වර්ග භාවිතා කර ඇත්තේ ගොවීන්ගෙන් 9% ක ප්‍රමාණයකි.

8.3.2 පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය

වී වගාවට අදාළ යෙදවුම් වලදී ආයතනික අංශය වැදගත්ම සැපයුම් මාර්ගය වේ. සහනාධාර ක්‍රමය යටතේ ග්‍රාමීය මට්ටමින් පොහොර සැපයීම මෙහෙයවනු ලබන්නේ සමුපකාර සමිති විසිනි. ආයතනික මාර්ගයන්ගෙන් පොහොර මිළදී ගත් මුළු ප්‍රමාණය 8.5 වගුව මඟින් දැක්වේ.

කෘෂි රසායන ද්‍රව්‍ය සැපයීම අතින් ආයතනික අංශයට ලැබී ඇත්තේ අඩු වැදගත් කමකි. මහ සහ යල කන්නවලදී කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා කළ ගොවීන්ගෙන් 53% හා 43% ක් ආයතනික මාර්ග වලින් ඒවා මිළදී ගෙන ඇත. අනෙක් ප්‍රමාණය පුද්ගලික අංශයෙන් මිළදී ගෙන ඇත.

8.5 වගුව

ආයතනික මාර්ග වලින් පොහොර මිළදී ගැනීම

| ප්‍රදේශය | පොහොර භාවිතා කළ ප්‍රමාණය | ගොවීන්ගණන | ආයතනික මාර්ගවලින් මිළදී ගත් පොහොර භාවිතා කළ අයගේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 5 | 87 | 71 | 82 |
| 6 | 37 | 25 | 68 |
| 7 | 28 | 17 | 61 |
| 8 | 18 | 11 | 61 |
| මුළු අධ්‍යයන ප්‍රදේශය | 170 | 124 | 73 |

8.4 ව්‍යාප්ති සේවාවන් මගින් සැපයුනු සේවාවන් ප්‍රයෝජනයට ගැනීම

මෙයට අදාළ විස්තර ඉදිරිපත් කිරීමට කෘෂිකර්ම ව්‍යාප්ති අංශය කොටස් දෙකකට බෙදා වෙන් කෙරේ. එනම් 1. ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවකයන් යෙදවීම මගින් කෙලින්ම ගොවියන් හා සම්බන්ධවන ව්‍යාප්ති සේවා හා 2. ගුවන් විදුලිය හා මුද්‍රිත ප්‍රකාශන ආදී වක්‍ර මාර්ගයන්ගෙන් සිදුවන ව්‍යාප්ති සේවාවන්ය. ව්‍යාප්ති සේවයේදී සමූහ වශයෙන් සිදුවන ව්‍යාප්ති කටයුතු වලට වඩා පුද්ගලික වශයෙන් ගොවීන් හා ව්‍යාප්ති නිලධාරීන් මුණ ගැසීම මගින් සිදුවන ව්‍යාප්ති කටයුතු දියුණු මට්ටමක පවතී. (8.6 වගුව) මෙම වගුවෙන් දැක්වෙන තොරතුරු අනුව සම්ප්‍රදායික ව්‍යාප්ති ක්‍රමයක්වූ සාමූහික ව්‍යාප්ති අංශයට දක්වා ඇත්තේ ඉතා අඩු අවධානයක් බව හැඟේ. දැනට තිබෙන තත්වයන් අනුව විවිධ මට්ටමේ දැනීම් ඇති ගොවීන් සිටින මෙවැනි අවස්ථාවල සමහර විට පුද්ගලික වශයෙන් උපදෙස් දීම සාමූහික ක්‍රමයට වඩා කාර්යක්ෂම විය හැක. කෙසේ වුවද සාමූහික අධ්‍යාපනික ක්‍රම ගැන අවධානය යොමු කිරීම විශේෂයෙන් වැදගත් යයි සැලකිය හැක්කේ ඒ සඳහා යන වියදම අතින් සලකා බලන විටය.

8.6 වගුව

ව්‍යාප්ති සේවාවන් මගින් සැපයුනු සේවාවන් ප්‍රයෝජනයට ගැනීම
1977/78 මහ
ගොවීන් විසින් ලබා ගත් සේවා ප්‍රමාණය

| සේවාව | ප්‍රදේශ අංක 5 | | ප්‍රදේශ අංක 6 | | ප්‍රදේශ අංක 7 | | ප්‍රදේශ අංක 8 | | අධ්‍යයන ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගොවීන් | % | ගොවීන් | % | ගොවීන් | % | ගොවීන් | % | ගොවීන් | % |
| පුද්ගලික ව්‍යාප්ති සේවා ලබාගත් | 71 | 39 | 25 | 20 | 34 | 33 | 44 | 42 | 174 | 34 |
| ක්ෂේත්‍ර දිනයන්ට සහභාගිවූ | 8 | 5 | 5 | 4 | – | – | 3 | 3 | 16 | 3 |
| පුහුණු පංති වලට සහභාගිවූ | 9 | 5 | 7 | 6 | – | – | 6 | 6 | 22 | 4 |
| ක්ෂේත්‍ර ආදර්ශනයන්ට සහභාගිවූ | 2 | 1 | 1 | 1 | – | – | 2 | 2 | 5 | 1 |

කෘෂි කාර්මික කටයුතු වල දියුණු තත්වය අනුව විශේෂයෙන් මුද්‍රිත ප්‍රකාශන පුවත්පත් හා ගුවන් විදුලිය වැනි ජන මාධ්‍යයන්ට ගොවීන් විසින් දක්වන ලැදියාවද විශේෂ වැදගත් තැනක් ගනී. එහිදී මෙම ගොවි ජනතාව ගුවන් විදුලිය මාධ්‍යය මගින් සැපයෙන කෘෂිකාර්මික වැඩ සටහන් අනෙක් සංනිවේදන මාර්ග වලට වඩා වැදගත් කොට සලකති.

අධ්‍යයන ප්‍රදේශයේ වැසියන්ගෙන් 27% ක් දිනපතාම පුවත්පත් කියවන අතර 38% ක් අවස්ථාවක් ලද විටෙක පුවත් පත් කියවන බව පැවසූහ. ගුවන් විදුලි මාධ්‍ය අනුගමනය කරන මුළු ප්‍රදේශයේ ජනගහනයෙන් 39% ක් නිති පතාම මෙන් ගුවන් විදුලියට සවන් දෙන්නන් වශයෙන්ද 33% ක් සමහර අවස්ථාවලදී පමණක් සවන් දෙන්නන් වශයෙන්ද වාර්තා කොට තිබුණි. රට තුළ ගොවිජනතාව අතර කියවීමේ හා ලිවීමේ හැකියාව සාමාන්‍යයෙන් උසස් මට්ටමක පවතින නිසා ජන මාධ්‍යයන් උපයෝගී කර ගනිමින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු තව තවත් වැඩි දියුණු කර ගැනීමටද මග සැලැස්විය හැක.

8.7 වගුව

කෘෂිකාර්මික ප්‍රවෘත්ති කියවන්නන් හා කෘෂිකාර්මික ගුවන් විදුලි වැඩ සටහන් අසන්නන්ගේ ව්‍යාප්තිය

| | අංක5 ප්‍රදේශ ගොවීන් ගණන | % | අංක6 ප්‍රදේශ ගොවීන් ගණන | % | අංක7 ප්‍රදේශ ගොවීන් ගණන | % | අංක8 ප්‍රදේශ ගොවීන් ගණන | % | මුළු අධ්‍යයන ප්‍රදේශය ගොවීන් ගණන | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකම් උපදේශ පත්‍රිකා කියවන අය | 22 | 12 | 21 | 17 | 24 | 23 | 10 | 10 | 77 | 15 |
| කෘෂිකම් සඟරා කියවන අය | 17 | 9 | 16 | 13 | 16 | 16 | 9 | 9 | 58 | 11 |
| නිතිපතා ගුවන්විදුලි කෘෂි කාර්මික වැඩ සටහන් වලට සවන් දෙනඅය | 39 | 22 | 29 | 23 | 30 | 29 | 28 | 27 | 126 | 26 |
| යම් යම් අවස්ථාවලදී පමණක් ගුවන් විදුලි කෘෂිකාර්මික වැඩ සටහන් වලට සවන් දෙන අය | 46 | 26 | 28 | 22 | 20 | 19 | 19 | 18 | 113 | 22 |

(ප්‍රදේශයේ මුළු කුටුම්භයන්ගේ ප්‍රතිශතය අනුව මෙම අගයන් දක්වා ඇත. ඒ අනුව මුළු කුටුම්භයන් සංඛ්‍යාව ප්‍රදේශ අංක 5=180 ක්ද ප්‍රදේශ අංක 6= 125 ක් ද ප්‍රදේශ අංක=103 ක්ද ප්‍රදේශ අංක 8=104 ක්ද මුළු අධ්‍යයන ප්‍රදේශයේම=512 ක්ද විය)

### 8.5 ආයතනික පහසුකම් යටතේ වී අලෙවිය

1977/78 මහ කන්නයේදී ගොවීන්ගෙන් 41% ක වී අලෙවි කළ බව වාර්තා කළ අතර මුළු නිෂ්පාදන ප්‍රමාණයෙන් 31% ක් ප්‍රමාණයක් අලෙවි කර තිබුණි. 8.8 වගුවෙන් දැක්වෙන පරිදි සමූපකාර වලට අලෙවි කළ ප්‍රමාණයට වඩා පුද්ගලික වෙළඳුන්ට අලෙවි කළ ප්‍රමාණය වැඩි විය. එය ප්‍රමාණයෙන් 50% ක් පමණ විය. යල කන්නයේදී ද නිෂ්පාදිත ප්‍රමාණයෙන් විශාල කොටසක් අලෙවි කළ බව වාර්තා කළ අතර සමූපකාරය හා පුද්ගලික වෙළඳ යන අංශ දෙකටම සමාන ආකාරයකින් මේවා අලෙවි කර තිබිණ.

## 9. සමාජ ව්‍යුහය හා එහි පරිවර්තන ලක්‍ෂණ

සමාජ සංවිධානය හා පුරාණ ගමක වෙනස්වීම් මෙම පරිච්ඡේදය මගින් සලකා බලනු ලැබේ. පුරාණ ගම මෙම ප්‍රදේශයේ පොදු ප්‍රජා ලක්‍ෂණයක් වේ. මෙම ප්‍රදේශයේ පුරාණ ගම් 160 ක් පමණ ඇති අතර ප්‍රදේශයේ සමාජ ක්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ඉන් එක් ගමක් වූ 'තඹුත්තේගම' පිළිබඳව වඩා විස්තරාත්මකව අධ්‍යයනය කරන ලදී . මෙමගින් මුළු ප්‍රදේශය පුරාම පැතිර පවතින සමාජ – සංස්කෘතික හා ආර්ථික කටයුතු යන අංශ දෙක පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගත හැක.

### 9.1 ජනාවාස

හෞතික වශයෙන් සෑම පුරාණ ගමකටම ආවේණික වූ අංග සතරක් ඇත. එනම් ග්‍රාමීය වැව, ග්‍රාමීය ජනාවාස (පුරාණ ගම්මැද්ද) වැවට පහළින් පිහිටි කුඹුරු යාය (පුරාණ වෙල සහ අක්කර ඩෙල)සහ තැලෑවයි. ඒ හැර ගම තුල පිහිටි වෙනත් පොදු ඉඩම්ද මෙයට ඇතුලත් වේ. තඹුත්තේගම තුල ජනාවාස 3 ක් හා ඉහත කී අනෙක් සෑම අංශයන්මද දක්නට ලැබිණ.

පසුගිය වකවානුව තුලදී තඹුත්තේගම තුල ජනගහනය සීඝ්‍ර ආකාරයෙන් වැඩි විය. උදාහරණ වශයෙන් 1932 දී කුටුම්භයන් 89 ක් යටතේ සිට සාමාජිකයන් 450 සංඛ්‍යාව, 1962 වන විට කුටුම්භයන් 186 ක් යටතේ සාමාජිකයන් 812 දක්වා වැඩිවී තිබිණ. 1978 වන විට කුටුම්භයන් 238 ක් යටතේ 1250 ක සාමාජික සංඛ්‍යාවක් දක්වා මෙම ප්‍රමාණය වැඩි වී තිබිණ. රටතුල ක්‍රියාත්මක වූ සමහර ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමයන්ට මෙම පුරාණ ගම්ද හසුවීම් නිසා ඒවායේද ජනගහනය වැඩි වීමට එය හේතු විය. 1951–1964 අතර වකවානුවේදී තඹුත්තේගම ප්‍රදේශයේ ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර 4 ක් ආරම්භ කර තිබුනි. ඒ අනුව පුරාණ ගම්වල ජනාවාසයන් කොටස් දෙකක්වශයෙන් වර්තමානයේදී දැකිය හැක. එනම් පුරාණ ගම්මැද්ද හා නව ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර වශයෙනි.

1978 මැයි වලදී තඹුත්තේගම තුළ පහත දැක්වෙන ජනාවාස ක්‍රම යටතේ ගෘහස්ථ කුටුම්භයන් 238 ක් පැතිරී තිබුණු ආකාරය පහත දැක්වේ.

| ජනාවාසය | කුටුම්භයන්ගේ ගණන | % |
|---|---|---|
| ගලගම්මැද්ද | 90 | 38 |
| කලුන්ද ගම්මැද්ද | 53 | 22 |
| රත් ඔරුව ගම්මැද්ද | 29 | 12 |
| ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම | 66 | 28 |
| මුළු ගණන | 238 | 100 |

මෙම දත්ත මගින් පෙන්නුම් කරන පරිදි මුළු කුටුම්භයන්ගෙන් හතරෙන් තුනකට ආසන්න ප්‍රමාණයක්ම තවමත් ජීවත් වන්නේ පුරාණ ගම්වලය. පුරාණ ගම් වැසියන් විසින් ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර යටතේ පදිංචි වී සිටින ජනපදිකයන් හඳුන්වනු ලබන්නේ 'පිට ගම්කාරයින්' වශයෙනි. මෙම ප්‍රදේශයේ මෙන්ම ගම තුළද සමාජ-සංස්කෘතික වශයෙන් බලන විට පුරාණ ගම් වැසියන් හා නව ජනපදිකයන් අතර විශාල වශයෙන් වෙනස් කම් දක්නට ලැබේ.

නේවාසික කණ්ඩායම්

සෑම පුරාණ ගම්මැද්දක්ම එක්තරා ප්‍රමාණයක් කොටුව ගෝත්‍ර නමින් හඳුන්වනු ලබන ගෙවතු කීපයකින් සමන්විත වේ. මෙවැනි වත්තක කණ්ඩායම්, කිහිපයක් පදිංචිව සිටිති. ඥාති සම්බන්ධතා දේශපාලනික සම්බන්ධකම් හා සමාන ආදායම් ලැබීම වැනි සාධක මෙවැනි කණ්ඩායම් එකම වත්තක පදිංචි වීම සඳහා බලපායි.

පුරාණ ගම් වැසියෙකු ආශ්‍රිතව දැකිය හැකි ලක්ෂණ කීපයකි. පුරාණ වෙලෙන් කොටසක් අයත්ව තිබීම හා වත්ත තුළ පදිංචිව සිටින කණ්ඩායමේ සාමාජිකයෙකු වීම මේ අතරින් වැදගත් වේ. නමුත් මෙම ගැමියන්ට දැනට ගම තුළ ඉඩම් අයිති නැති අතර පුරාණ වෙලේ්පංගු හිමියෝද නොවෙති. මේ අනුව පුරාණ ගම් වැසියකු ලෙස සැලකිය හැකි එකම සාධකය වන්නේ වත්තක පදිංචිව සිටීම සමග එම කණ්ඩායමේ සාමාජිකයෙකු වීම පමණි.

## 9.2 ඥාති සම්බන්ධතා

ගම් වැසියන්ගේ හැසිරීමට බලපාන කරුණු අතරින් ඥාති සම්බන්ධතා ප්‍රධාන සාධකයක් වේ. ඥාති සම්බන්ධතාවන්ගේ මූලික ස්ථානය 'පවුල' යි. ඥාති කොට්ඨාශයන් දෙකක් හඳුනාගැනීම සඳහා ගම්වාසීන් විසින් 'පවුල' යන නම භාවිතා කරති. පින් පළමුවැන්න මා පිය දෙදෙනා හා දරුවන් අයත් වන (න්‍යෂ්ටික) පවුලයි. මෙහිදී නිවසේ ආර්ථික කටයුතු හා පරිභෝජන කටයුතු සම්පාදනය කෙරෙන්නේ පියා විසිනි.

අස්වනු නෙලන කාලයේදී හා නිවසක වහලක් අළුත් වැඩියා කිරීම වැනි අවස්ථාවකදී එම කාර්යය තමාට තනිව කිරීමට අපහසු බැවින් අසල්වාසීන්ගේ සහයෝගය ලබා ගැනීමට සිදුවේ. මෙවැනි සමාජ අන්තර් සබඳතා මගින් මෙම ගම්වැසියන් කාලයක්, දුරක් අවමකර ගනිති.

පුරාණ ගම්වල පවතින සමාජ සංවිධානයේ තවත් වැදගත් ලක්ෂණයක් නම් ඥාති සබඳතා ඇතිකර ගැනීමේ ක්‍රියාවලියයි. එකම කුලයකට අයත් ජන සමූහය එකම වරිගයකට අයත් වෙති. මෙහිදී වැදගත් වන කරුණු දෙකක් නම් ගමේ සියළුම සාමාජිකයන් එකම කුලයකට අයත් වීම හා එම පුරාණ ගමෙන් පිටස්තර අය හා දක්වන දැන හැඳුනුම්කමය. බොහෝ ගම් වැසියන් ... දූ දරුවන් තම ගම තුළම විවාහ සබඳතා ඇති කර ගන්නවාට කැමැත්තක් දක්වන අතර වෙනත් පුරාණ ගමක් හා විවාහ සබඳතා සිදුවීමේදී වැදගත් වන්නේ දැන හැඳුනුම්කමයි.

ඥාති සබඳතා හා විවාහ සම්බන්ධතා වලදී හැරුණු විට දැනට පුරාණ ගම්තුල 'වරිග' වලට ලැබෙනුයේ අඩු සැලකිල්ලකි. වැඩ වසම් නිලයක්වූ 'රටේ මහත්මයා' තනතුර අහෝසි වීම, ගම් තුල සිවිල් නීතිය පැතිර යාම, ජන සංක්‍රමණය සමාජ කටයුතු සඳහා පිටස්තරයින්ගේ බලපෑම ඇතිවීම යනාදිය මෙයට හේතු වී ඇත.

මෙම පද්ධතියන් කාලය අනුව හා එකිනෙක පුද්ගලයින්ගේ හැඟීම් ආදිය අනුව බොහෝ විට වෙනස් වේ. තඹුත්තේගම මෙන්ම අනෙකුත් පුරාණ ගම්වලින් වැඩි සංඛ්‍යාවක්ද බොහෝ දුරට ස්වාධීන වන අතර එකම කුලයකින් සමන්විත ජනගහණයක් දක්නට ලැබේ. මෙම සමාජ ක්‍රමය ශක්තිමත් සමාජ සංවිධානයක් වන්නේ එය ස්වාධීනව ක්‍රියාත්මක වන එකිනෙකට බැඳී පවත්නා පුද්ගලික සබඳතා ඇති ජන කොට්ඨාශයකින් සමන්විත වීමයි. සමාජ කටයුතු සම්බන්ධයෙන් මෙහිදී තවත් වැදගත් අංග දෙකක් නම් ගම තුල පවත්නා සංස්කෘතිය හා ආගමයි.

9.3 සමාජීය වෙනස්වීම්

රාජ්‍ය අංගයේ කටයුතු වල බලපෑමෙන් 1935 සිට මෙම සමාජ සංවිධානයේ වෙනස්කම් දැකගත හැක. කෙසේ වෙතත් කරුණු කීපයක බලපෑමෙන් මෙම ප්‍රදේශයේ සමාජ විපර්යාස සිදුවන බව සඳහන් කළ හැක.

9.3.1 පිටස්තර අය ගම තුලට පැමිණීම

1940 ස් ගණන් පමණ වන තුරු පුරාණ ගම්තුල එතරම් සමාජ විපර්යාසයන් සිදු නොවුන අතර ඉන් පසු ඇතිවූ නොයෙක් බාහිර බලවේගයන් නිසා එම පද්ධතිය වෙනස් විය. වර්ෂ 1930 ත් 1960 ත් අතර බිහිවූ නව ජනපද ව්‍යාපාර නිසා කුරුණෑගල, කෑගල්ල, කොළඹ, ගාල්ල වැනි පළාත් වලින් උතුරුමැද පළාතට විශාල වශයෙන් ජන සංක්‍රමණයක් සිදු විය. නව සංවර්ධන ව්‍යාපාර වල කොන්ත්‍රාත් කරුවන්, කම්කරුවන් ආදීන් වශයෙන් මෙම සංක්‍රමණිකයන්ගේ පැමිණීම සිදු විය. වැව් ප්‍රතිසංස්කරණය, මහා මාර්ග තැනීම, කැලෑ එළි කිරීම වැනි කාර්යයන් සඳහා සමහරු පැමිණි අතර ඔවුන්ට කෑම සැපයීම ආදී සේවාවන් සැපයීමට තවත් පිරිසක් මෙම ප්‍රදේශ කරා ගොස් පදිංචි වූහ. මොවුන්ගෙන් සමහරෙක් මාර්ග දෙපස පිහිටි රජයේ ඉඩම් අල්ලාගෙන ක්‍රම ක්‍රමයෙන් එහි පදිංචි වූහ. මෙම ඉඩම් පිහිටියේ පුරාණ ගම් මායිම් වලය. රජයේ ඉඩම් වල පදිංචි වී ඇති මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට නිලධාරීන් උත්සාහ දැරුවද 1950 – 65 අතර සිදුවූ ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ එම පදිංචි කරුවන්ට නීත්‍යානුකූල අයිතිය ලැබිණ. පුරාණ ගම් වැසියන් විසින් එකිනෙක ගම්වැද්ද වල් සාදාගෙන ජීවත් වීමට දැක්වූ කැමැත්ත නිසා පාරවල් ආසන්නය යෙක් තම ගම් සීමාවන් පුළුල් කිරීමට හෝ වෙළඳපලවල්, නගර ආදිය ඇති කර

වීමට උත්සාහ නොදැරූහ. මෙම පුරාණ ගම් තුල සීඝ්‍රයෙන් ජනගහණය වැඩිවීම නිසා ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයන්ට අනුව ගම් මායිම්වල පිටස්තර ප්‍රදේශවල අය සමග පදිංචි වීමට මෙම පුරාණ ගම්වැසියන්ට ද සිදු විය. මෙම නිසා පුරාණ ගම්වැසියන් හා පිට ප්‍රදේශවලින් පැමිණි අය අතර සම්බන්ධතාවයන් ඇති විය. මේ සම්බන්ධතා නිසා පුරාණ ගම් වැසියන්ට වෙළඳ ආර්ථිකය හඳුනාගැනීමටද අවස්ථාව සැලසින. මේ හේතුවෙන් ඔවුන්ගේ පාරිභෝජන කටයුතු, ආගමික විශ්වාස ආදියේ වෙනස්කම්ද ඇති විය. නිෂ්පාදන අලෙවි කටයුතු, වෙළඳ සැල් පවත්වාගෙන යාම, වඩු කර්මාන්තය, ගමනාගමනය ආදී කටයුතු මෙතැන් සිට පිට ප්‍රදේශවලින් පැමිණි අයගේ ඒකාධිකාරීත්වය යටතේ ක්‍රියාත්මක විය.

9.3.2 ජනගහණය සීඝ්‍රයෙන් වැඩිවීම

සීමිත සම්පත් ප්‍රමාණයක් මත ඍජු පැවති ජනගහණය වැඩිවීම නිසා පහත සඳහන් සමාජ - ආර්ථික වෙනස්කම් මෙම ගම් තුල සිදු විය.

I. පුරාණ ගම්වල තිබූ කුඹුරු හා ගොඩ ඉඩම් කුඩා කොටස් වශයෙන් බෙදීයාම නිසා කෘෂිකාර්මික කම්කරුවන් හා ඉඩම් නොමැති අය වශයෙන් අලුත් කොට්ඨාශ දෙකක් ඇතිවිය,

II. අලුතින් බිහිවූ නව ගම් පුළුල් කිරීමේ ජනපද ව්‍යාපාර, ගම් තුළ සිදුවූ ජනගහණ වර්ධනය පාලනය කිරීමට උදව් විය. එමෙන්ම මෙම නව ජනපද හා ගම්මැද්ද ජනපද අතර සමාජමය වෙනස්කම් වර්ධනය විය. උදාහරණ වශයෙන් තඹුත්තේගම තුල පිහිටි ගලගම්මැද්ද පාරම්පරික චාරිත්‍ර ආරක්‍ෂා කරන උසස් ගම්මැද්දක් ලෙස සලකන අතර රන්ඔරුව ගම්මැද්ද ඊට වඩා පහත් තත්වයක ලා සලකති. ඊට හේතුව රන්ඔරුව ගම්මැද්ද තුල සිටින ජනයා දුප්පත් වීම හා ඔවුන් අතර වරිගයෙන් පිට විවාහ සිදුවීමත්ය.

9.3.3 ග්‍රාමීය සංවිධාන හා දේශපාලන පක්ෂ ක්‍රමය

බොහෝ කාලයක් තහවුරුව පැවති ගොවිකාරක සභා, ගම්මුලාදෑනි ක්‍රමය සහ වෙල්විදානේ තනතුර වැනි ග්‍රාමීය මට්ටමේ ආයතන අහෝසි වීමෙන් නොයෙකුත් වෙනස්කම් ගම තුල ඇති විය. ගමේ සම්පත් දියුණු කර ගැනීමට තරඟකාරී දේශපාලන සංවිධාන ක්‍රමයක් බිහිවූ අතර ග්‍රාමීය මට්ටමෙන් අලුත් සුළු නිලධාරීන් පංතියක්ද බිහිවිය.

එමෙන්ම මෙසේ බිහිවූ අළුත් ආයතනවල උදාහරණ වශයෙන් පලදාවර්ධන කමිටු ආදියේ උසස් නිලතල මෙම ගම්වාසීන්ටද ලබා ගත හැකි විය. තවද ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික කටයුතු හා වෙනත් සංවර්ධන කටයුතු දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමෙන් හා දිස්ත්‍රික් මට්ටමෙන් තවත් ප්‍රාදේශීය නිලධාරීන් ගණනාවක් පත් කෙරුණි. මේ නිසා රටේ ප්‍රාදේශීය පරිපාලන සංවිධානය මධ්‍ය පරිපාලන ක්‍රමය සමග ඇඩි සම්බන්ධතාවයක් ඇති විය.

ගමේ පොදු කටයුතු සම්බන්ධයෙන් විශාල සේවාවක් දේශපාලන පක්ෂ සංවිධානයමගින් ඉටු වේ. පැරණි වැඩවසම් පාලන ක්‍රමය වෙනුවට ගමේ නියෝජිතයන් සම්බන්ධවූ නව පාලන ක්‍රමයක් ඇති විය. 1972 කෘෂිකාර්මික පලදාවර්ධන පනත හා කෘෂි කාර්මික ඉඩම් පනත අනුව ගොවිකාරක සභා හා වලදා වර්ධන කමිටු වෙනුවෙන් නියෝජිතයන් පත් කෙරුනේ මහජන ඡන්ද විමසීමකින් නොව ප්‍රදේශයේ මන්ත්‍රීවරයාගේ නම් කිරීම අනුවයි. ඒ අනුව මෙම සංවිධාන වල නිලතල දැරූ පුද්ගලයන් බොහෝ විට එම ප්‍රදේශයේ පදිංචි කරුවන් හෝ ඉඩම් හිමියන් නොවූ අතර, දේශපාලනික වශයෙන් ඇති බලවත්කම අනුව එසේ පත් වූහ.

පුරාණ ගම්වැසියන්ගේ මතය අනුව මෙම ආයතනික හා දේශපාලනික වෙනස්වීම් නිසා ගමේ පැවති පාරම්පරික සමාජ ක්‍රමය පහත් තත්වයකට ඇද වැටින. මෙම තත්වය පිළිබිඹු කරන අංශ කීපයක් පහත දැක්වේ.

(I) ගමේ ස්වාධීනත්වය හුරන්වීම, මෙම ප්‍රදේශයේ ලේ නෑකම් ඇති පවුල්වල අඩ දබර පෙරට වඩා වැඩි අතර දැන් එය ගමේ සාමාන්‍ය තත්වයක් බවට පත්ව ඇත.

(II) අවුරුදු 20 කට පමණ පෙරදී පුරාණ වෙලට අයත් ඉඩම් විකිණීම ගැන සිතීමට පවා නො හැකි තත්වයක් තිබූ නමුත් වර්තමානයේදී පිටස්තර අයට ඉඩම් විකිණීම බහුල වශයෙන් සිදුවේ.

(III) තරුණ පරම්පරාව විනය අහිමි පිරිහුණු තත්වයක පැවීම, සුරාව සූදුව හා වෙනත් මත්ද්‍රව්‍ය පාවිච්චිය ගමේ ගැටවර පිරිස අතර සාමාන්‍ය දෙයක් වී ඇත.

(IV) ආයතනික අංශයේ නිලතල දරණ අය පාරම්පරික වටිනාකම් හා සමාජ ධර්මතාවයන් ආරක්ෂාකිරීමට උනන්දු වී නැත.

9.3.4 රජය විසින් ආරම්භ කරනු ලැබූ විශාල සංවර්ධන ව්‍යාපාර

රාජාංගන සහ මහවැලි ව්‍යාපාරය වැනි නව ව්‍යාපාරයන්හි ජනාවාස රටාව, ජල පාලනය, සමාජ සංවිධානය මෙම පුරාණ ගම්වල පවතින තත්වයට වඩා හාත්පසින්ම

වෙනස් විය. ව්‍යාපාර ප්‍රදේශයේ දැනට ජීවත්වන ජනතාවගේ සමාජ ආර්ථික තත්වය දියුණු කිරීම මෙම නව ව්‍යාපාරවල එක් අරමුණක් වූ බැවින් ඒ පිළිබඳව තව දුරටත් විමසා බැලීම වැදගත් වේ.

## 9.4 නව ජනාවාස පිළිබඳව ගොවීන්ගේ ආකල්පයන්

අධ්‍යයන ප්‍රදේශය තුළ ඇති වැදගත්ම තත්වය නම් මෙහි පවතින සමාජ සංවිධානයයි. මෙමගින් අධ්‍යයන ප්‍රදේශයේ පදිංචි ජනපදිකයන් වර්ග තුනක් හඳුනාගත හැක. (අ) ආදිම පුරාණ ගම්වාසීන් (ආ) ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම යටතේ හා අනවසර පදිංචිකරුවන් වශයෙන් සිටින පිට පළාත්වල වැසියන් (ඇ) පිට ප්‍රදේශවලින් පැමිණි නව ජනපද වැසියන්; ඉදිරියේදී ඇතිවන නව ජනාවාස වල පදිංචි කරුවන් ගෙන් වැඩි කොටසක්ම පැරණි පුරාණ ගම්වැසියන් ගෙන් හා ඉඩම් සංවර්ධන ආඥාපනතට අයත් පදිංචි කරුවන් ගෙන් සමන්විත විය හැකි අතර නව ජනපදිකයන් මීට වඩා අඩු ප්‍රමාණයක් එනම් නව ජනාවාස යෝජනා ක්‍රමයන්හි ජනගහණයෙන් 40% ක් පමණ වනු ඇත.

මෙම ජනාවාස හා එම ජනාවාස වල පදිංචි වී සිටින විවිධ ආකාරයේ ජනපදිකයින්ගේ අන්තර් සබඳතාවයන් මත මෙම ව්‍යාපාරයේ දියුණුව හෝ පරිහානිය රඳා පවතී. එබැවින් මෙම ජනපදවාසීන්ගේ ඥාති සබඳතා පිළිබඳව කෙටියෙන් විමසා බැලිනු, සමීක්ෂණ කාල සීමාව වනවිට (1978) නව ජනපද වාසීන් මෙම ප්‍රදේශයේ පදිංචියට පැමිණ නොසිටි''නිසා පුරාණ ගම්වැසියන් හා පිට ප්‍රදේශවලින් පැමිණි පදිංචි කරුවන් අතර මෙම විග්‍රහය සිදු කෙරිනු.

සමාජ සම්ප්‍රදායයන් හා සංස්කෘතික කරුණු අතින් තමන් පිටස්තර ප්‍රදේශවලින් පැමිණි අයට වඩා වැදගත් වූ කණ්ඩායමක් යයි පුරාණ ගම්වාසීන් කල්පනා කරති. ඔවුන්ගේ හැඟීම අනුව පුරාණ ගම්වැසියෙක් නො වන සෑම කෙනෙක්ම පිටස්තර පුද්ගලයෙකි. නමුත් මෙය සත්‍ය තත්වයක් නො වේ. පිටස්තර ප්‍රදේශවලින් පැමිණි අය තමන්ගේ කුඹුරු ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගත්තා යයි පුරාණ ගම් වාසීන් සිතති. එමෙන්ම පුරාණ ගම් වාසීන්ගේ ඊර්ෂ්‍යාව නිසා තමන්ට හොඳ වගා කරුවකු බවට පත්විය නොහැකි යයි පිටස්තර ප්‍රදේශවලින් පැමිණි අය සිතති.

නව ජනාවාස ව්‍යාපාර කෙරෙහි මෙම දෙපිරිස විසින්ම සැලකිල්ලක් දක්වති. බොහෝ පුරාණ ගම්වැසියන් තම පුරුදු ස්ථාන අතහැර කුමා යාමට කැමති නැත. විශේෂයෙන් මේ තත්වය දක්නට ඇත්තේ ඉඩම් හිමි පංතිය අතරය.

ඔවුන් දක්වන අදහස නම් මෙම පුරාණ ගම්තුල පවතින වැව් අළුත්වැඩියා කොට වැඩි වැඩි යෙන් වගා කටයුතු කිරීමට රජය පහසුකම් සැලසිය යුතු බවත් නව ජනපද ව්‍යාපාරයන්හි පිටස්තර ප්‍රදේශවාසීන් පදිංචිකරවිය යුතු බවත්ය. ඉඩම් අයිතියක් නොමැති පුරාණ ගම් වැසියන් තමන්ට වගා කිරීමට සුදුසු බිමක් කුමන ප්‍රදේශයකින් ලැබුණත් එයට පදිංචියට යෑමට කැමැත්තෙන් සිටිත්. අනෙක් අතට අනවසර පදිංචි කරුවන් හා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් හිමි අය තමාට වඩා හොඳ වා රිමාර්ග පහසුකම් සහිත බිම් කැබැල්ලක් ලබා ගැනීමට උත්සාහ ගනිමින් සිටිති.

පිට ප්‍රදේශයක පදිංචියට යාමේදී තමන්ගේ නිදහස ආරක්ෂා කර ගැනීමට මෙම ජනපදික කොට්ඨාශ දෙකටම අවශ්‍ය විය. අළුත් ජනාවාසවලටද ඔවුන්ගේ වර්තමාන චාරිත්‍ර විධි ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යාමට ඔවුන් බලාපොරොත්තු විය. එසේනොකට විරුද්ධ කුල හා ආගම් සහිත අමුතු ප්‍රදේශයක ජීවත් වීමට බොහෝ දෙනෙක් සම්පූර්ණයෙන්ම විරුද්ධ වූහ. අනෙක් අතට නිවාස සාදා ගැනීමේදී ඔවුන්ට මුදලින් දීමනාවක් ලැබුනද තමන්ගේ පුරුදු පරිසරයට ගැලපෙන පරිදි හා තමන්ගේ බඩු බාහිරාදිය තබා ගැනීමට පහසු වන ආකාරයට ඒවා ගොඩ නගා ගැනීමට අපහසු වේ යයි ඔව්හු සැක පහල කළහ. කෙසේ වුවද පුරාණ ගම් වැසියන් හා නව පදිංචි කරුවන් මෙම ප්‍රදේශයේ වටිනා සම්පත් වර්ග දෙක වූ භූමිය හා ජලය ආරක්ෂා කර ගනිමින් එම ප්‍රදේශයේ සංවර්ධනයක් ඇති කිරීමට ඔව්හු උත්සුක වූහ. මෙය පුරාණ ගම්වැසියන් හා නව ජනපද වාසීන් අතර පෙර තිබූ තත්වයම වෙනස් ස්වරූපයක් ගත්තු තත්වයකි.

අවසාන වශයෙන්, මෙම නව ජනපද යෝජනා ක්‍රම සඳහා ජනපදිකයන් තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය අනුව වූ අනුපිළිවෙල පහත දැක්වේ.

(1) සංවර්ධන යෝජනා ක්‍රමය නිසා තමන්ගේ ඉඩම් අහිමිවූ පුරාණ ගම්වාසීන්
(2) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඇති ඉඩම්වල හා අනවසර ඉඩම්වල පදිංචි පිට පළාත්වල අය
(3) ව්‍යාපාර ප්‍රදේශයට ආසන්නයේම සිටින වියළි කලාපයේ පදිංචි කරුවන්
(4) තෙත් කලාපයෙන් තෝරා ගත් ගොවීන්

උපග්‍රන්ථය – I

## "එච්" – ප්‍රදේශයේ පස හා දේශගුණික තත්වය

එච් ප්‍රදේශයට වර්ෂාව ලැබෙන්නේ ඔක්තෝබර් සිට මාර්තු දක්වා වූ මහ කන්නයේදී පමණි. මෙය අඟල් 50 ක[1] වාර්ෂික වර්ෂා පතනයක් වේ. මේ අනුව මාධ්‍ය වාර්ෂික වර්ෂාපතන ව්‍යාප්තිය මගින්, වියළි කාලපරිච්ඡේද දෙකක්ද ඇතුළත් දේශගුණික රටාවක් විදහා දක්වයි. ජනවාරි සිට මාර්තු දක්වාත් කෙටි වියළි කාලයකුත් ජූනි සිට සැප්තැම්බර් දක්වා දීඝ වියළි කාලයකුත් මෙහිදී දැකගත හැක. (උපග්‍රන්ථය (I) රූප සටහන)

එච් 4 උප ප්‍රදේශයේ නිරිතදිග තුඩුවට ආසන්නව 'එච්' ප්‍රදේශය මධ්‍යයේ පිහිටි මහ ඉලුප්පල්ලම මධ්‍යස්ථානයෙන්ද ලබාගත් දේශගුණික තොරතුරු මෙම උප ග්‍රන්ථයේ අංක I වගුව මගින් දක්වයි. එමගින් 1971 – 1977 අතර සාපේක්ෂ ආර්ද්‍රතාවයේ වෙනස්වීම්ද මාධ්‍ය උපරිම හා අවම උෂ්ණත්වයද නිරූපණය වේ. දත්තයන් පෙන්වන පරිදි දිවා කාලයට වඩා රාත්‍රී කාලයේදී සාපේක්ෂ ආර්ද්‍රතාවය ඉහළ අගයක් ගනී. නිරිත දිග මෝසම් සුළං හා ඊසාන දිග මෝසම් සුළං මත සාපේක්ෂ ආර්ද්‍රතාවය බොහෝ දුරටම රඳා සිටි බව පැහැදිලි වේ.

පෙබරවාරි මාර්තු දක්වා වියළි කාලසීමාවේදී ආර්ද්‍රතාවය පහත් මට්ටමක පැවැති අතර ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා තෙත් කාලයේදී එය ඉහළ මට්ටමක පැවතිනි. මාසික මාධ්‍ය උෂ්ණත්වය ෆැරන්හයිට් 76° සිට 83° දක්වාත් අවම උෂ්ණත්වය ෆැරන්හයිට් 84° සිට 93° දක්වාත් විය.

---

1. 1931–60 දක්වා අවුරුදු 30 ක කාලයක් තුළ වාර්ෂික වර්ෂාපතනයේ මධ්‍යනය අඟල් 58.4 ක් වූ අතර 1968 – 1977 දක්වා අවුරුදු 10 ක කාලපරිච්ඡේදයේදී එය අඟල් 50.5 ක් විය. (කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව)
2. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව; මහඉලුප්පල්ලම මධ්‍යස්ථානය

මෙම ප්‍රදේශයේ පස සෑම තැනම එකාකාරී වූ අතර ප්‍රධාන පස්වර්ග දෙකක් හඳුනාගත හැක.

1. හොඳින් ජලවහනය වන තද දුඹුරු සිට රතුවන් දුඹුරු පස (Reddish Brown earths)

2. දුර්වල ජලවහනයකින් යුත් මෘදු, තද දුඹුරු සිට තද අළු පැහැති පස (Low Humic gley)

ප්‍රදේශයේ බිම් ප්‍රමාණයෙන් 60% ක් පමණ රතුවන් දුඹුරු පස් වලින්ද ඉතිරි 40% අඩු හියුමික් ග්ලේ පස් වලින්ද යුක්තවේ. රතු දුඹුරු පස් වෙන්කර ගන්නේ දේශගුණික බලපෑමෙන් විපරිතවූ ආග්නේය පාෂාණවලින් ලබාගත් ද්‍රව්‍යයන් වර්ධනය කර, පොළව මට්ටමේ සිට අඩි 2–4 ප්‍රමාණයක බොරළු, වැලි, ලෝම තට්ටුව විසටනය කිරීමෙනි.

භූමි පරිභෝගය හා සංවර්ධනය අනුව පස්වල වැදගත් ගුණාංග කිහිපයක් දැක්විය හැක.

1. 'අඩු හියුමික් ග්ලේ පස්'වල කාන්දුවීමේ අනුපාත ය පැයකට අඟල් 0.17 ක් වන අතර රතු දුඹුරු පස්වල එම ප්‍රමාණය පැයකට අඟල් 0.3 කටත් වැඩිය.

2. II. තෙතමනය රඳා සිටීමේ ධාරිතාවය අඩු බව
(පස් අඩියකට අඟල් 1.2 සිට 1.6 දක්වා)
III. සනත්වයේ ඉහළ මට්ටම –(ග්‍රෑම් 1.6 –1.7/ ඝන සෙන්ටිමීටර් 3)
IV. රොන්මඩ ප්‍රමාණය අතිශ් පහත් අගයක් පැවතීම.

ඇමිණුම 1 (ප්‍රස්ථාර 1)

මාසික මධ්‍ය වර්ෂාපතනය හා උෂ්ණත්වයේ ව්‍යාප්තිය

මහඉලුප්පල්ලම මධ්‍යස්ථානය–



ඇමිනුම 1 –වගුව(1)

## දේශගුණික දත්ත

ඇමිනුම 1–වගුව(1)

| වර්ෂාපතනය (අඟල්) | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝ: | නොවැ: | දෙසැ: | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍යය (1931–196) | 5.54 | 1.91 | 4.64 | 7.24 | 4.18 | 1.33 | 1.43 | 1.61 | 3.05 | 9.46 | 9.96 | 8.06 | 58.41 |
| සාමාන්‍යය (1968–1977) | 2.30 | 1.75 | 2.41 | 8.00 | 3.08 | 0.48 | 0.92 | 1.83 | 3.20 | 9.63 | 8.07 | 8.86 | 50.53 |
| සාපේක්ෂ ආර්ද්‍රතාවය | | | | | | | | | | | | | |
| දිවාකල සාමාන්‍යය (1971–1977) | 68.0 | 62.0 | 59.4 | 67.0 | 71.1 | 67.6 | 65.1 | 64.6 | 63.0 | 70.7 | 74.0 | 77.9 | |
| රාත්‍රී කල සාමාන්‍යය | | | | | (සම්පූර්ණ කර නැත) | | | | | | | | |
| උෂ්ණත්වය (ෆැරන්හයිට්) | | | | | | | | | | | | | |
| උපරිමයේ සාමාන්‍යය (1971–1977) | 84.9 | 89.3 | 93.0 | 92.9 | 89.7 | 90.3 | 90.9 | 90.7 | 91.4 | 88.8 | 87.1 | 83.8 | |
| අවමයේ සාමාන්‍යය (1971–1977) | 67.2 | 68.4 | 70.9 | 74.1 | 76.1 | 76.5 | 75.8 | 75.5 | 75.1 | 73.6 | 71.7 | 70.4 | |
| සාමාන්‍යය | 76.0 | 78.8 | 82.0 | 83.5 | 82.9 | 83.4 | 83.3 | 83.1 | 83.2 | 81.2 | 79.4 | 77.1 | |

1 මූලය – කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව: (මහඉලුප්පල්ලම, කෘෂිකර්ම මධ්‍යස්ථානය)

ඇමුණුම 2

## ස්ත්‍රී පුරුෂ භාවය අනුව හා වයස් කාණ්ඩ අනුව ගෘහ කුටුම්භයන්ගේ ව්‍යාප්තිය

| වයස් කාණ්ඩ | ප්‍රදේශ අංක 5 | | | | | | ප්‍රදේශ අංක 6 | | | | | | ප්‍රදේශ අංක 7 | | | | | | ප්‍රදේශ අංක 8 | | | | | | පියලු ප්‍රදේශ | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පිරිමි | | ගැහැණු | | එකතුව | | පිරිමි | | ගැහැණු | | එකතුව | | පිරිමි | | ගැහැණු | | එකතුව | | පිරිමි | | ගැහැණු | | එකතුව | | පිරිමි | | ගැහැණු | | එකතුව | |
| | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % | පු: | % |
| 0 - 5 | 74 | 14.1 | 86 | 15.6 | 160 | 14.8 | 66 | 16.9 | 63 | 16.1 | 129 | 16.5 | 45 | 14.4 | 32 | 12.1 | 77 | 13.4 | 50 | 17.5 | 58 | 18.6 | 108 | 18.0 | 235 | 15.5 | 239 | 15.7 | 474 | 15.6 |
| 6 -10 | 68 | 12.9 | 90 | 16.4 | 158 | 14.7 | 55 | 14.0 | 68 | 17.4 | 123 | 15.7 | 46 | 14.7 | 29 | 11.0 | 75 | 13.0 | 43 | 15.0 | 55 | 17.6 | 98 | 16.4 | 212 | 14.0 | 242 | 15.9 | 454 | 15.0 |
| 11-15 | 75 | 14.2 | 68 | 12.4 | 143 | 13.3 | 51 | 13.0 | 56 | 14.3 | 107 | 13.7 | 45 | 14.4 | 42 | 15.9 | 87 | 15.1 | 35 | 12.2 | 33 | 10.6 | 68 | 11.4 | 206 | 13.6 | 199 | 13.1 | 405 | 13.4 |
| 16-20 | 78 | 14.8 | 81 | 14.7 | 159 | 14.8 | 58 | 14.8 | 48 | 12.3 | 106 | 13.6 | 48 | 15.4 | 44 | 16.7 | 92 | 16.0 | 29 | 10.1 | 44 | 14.1 | 73 | 12.2 | 213 | 14.1 | 217 | 14.3 | 430 | 14.3 |
| 21-25 | 45 | 8.5 | 44 | 8.0 | 89 | 8.3 | 37 | 9.0 | 35 | 9.0 | 72 | 9.2 | 23 | 7.4 | 22 | 8.4 | 45 | 7.8 | 30 | 10.5 | 35 | 11.2 | 65 | 10.9 | 135 | 8.9 | 136 | 9.0 | 271 | 8.9 |
| 26-30 | 37 | 7.0 | 35 | 6.4 | 72 | 6.7 | 21 | 5.4 | 30 | 7.7 | 51 | 6.5 | 19 | 6.1 | 18 | 6.8 | 37 | 6.4 | 24 | 8.4 | 28 | 9.0 | 52 | 8.7 | 101 | 6.7 | 111 | 7.3 | 212 | 7.0 |
| 31-35 | 18 | 3.4 | 36 | 6.5 | 54 | 5.0 | 19 | 4.8 | 14 | 3.6 | 33 | 4.2 | 9 | 2.9 | 13 | 4.9 | 22 | 3.8 | 17 | 5.9 | 12 | 3.8 | 29 | 4.8 | 63 | 4.2 | 75 | 4.9 | 138 | 4.5 |
| 36-40 | 27 | 5.1 | 36 | 6.5 | 63 | 5.8 | 19 | 4.8 | 18 | 4.6 | 37 | 4.7 | 18 | 5.8 | 12 | 4.5 | 30 | 5.2 | 14 | 4.9 | 10 | 3.2 | 24 | 4.0 | 78 | 5.1 | 76 | 5.0 | 154 | 5.1 |
| 41-45 | 29 | 5.5 | 17 | 3.1 | 46 | 4.3 | 14 | 3.6 | 17 | 4.3 | 31 | 4.0 | 14 | 4.5 | 15 | 5.7 | 29 | 5.1 | 7 | 2.5 | 11 | 3.5 | 18 | 3.0 | 64 | 4.2 | 60 | 4.0 | 124 | 4.1 |
| 46-50 | 21 | 4.0 | 12 | 2.2 | 33 | 3.1 | 14 | 3.6 | 9 | 2.3 | 23 | 2.9 | 13 | 4.2 | 5 | 1.9 | 18 | 3.1 | 7 | 2.5 | 12 | 3.8 | 19 | 3.2 | 55 | 3.6 | 38 | 2.5 | 93 | 3.1 |
| 51-55 | 19 | 3.6 | 15 | 2.7 | 34 | 3.1 | 10 | 2.6 | 12 | 3.1 | 22 | 2.8 | 8 | 2.6 | 7 | 2.7 | 15 | 2.6 | 12 | 4.2 | 3 | 1.0 | 15 | 2.5 | 49 | 3.2 | 37 | 2.5 | 86 | 2.8 |
| 56-60 | 13 | 2.5 | 7 | 1.3 | 20 | 1.8 | 10 | 2.6 | 8 | 2.0 | 18 | 2.3 | 6 | 1.9 | 12 | 4.5 | 18 | 3.1 | 7 | 2.5 | 8 | 2.6 | 15 | 2.5 | 36 | 2.4 | 35 | 2.3 | 71 | 2.3 |
| 61-65 | 9 | 1.7 | 7 | 1.3 | 16 | 1.5 | 3 | 0.8 | 6 | 1.5 | 9 | 1.2 | 4 | 1.3 | 3 | 1.1 | 7 | 1.2 | 4 | 1.4 | - | - | 4 | 0.7 | 20 | 1.3 | 16 | 1.1 | 36 | 1.2 |
| 66-70 | 7 | 1.3 | 9 | 1.6 | 16 | 1.5 | 10 | 2.6 | 4 | 1.0 | 14 | 1.8 | 7 | 2.2 | 4 | 1.5 | 11 | 1.9 | 2 | 0.7 | 1 | 0.3 | 3 | 0.5 | 26 | 1.7 | 18 | 1.2 | 44 | 1.4 |
| ≥ 71 | 7 | 1.3 | 7 | 1.3 | 14 | 1.3 | 4 | 1.0 | 3 | 0.8 | 7 | 0.9 | 7 | 2.2 | 6 | 2.3 | 13 | 2.3 | 5 | 1.7 | 2 | 0.7 | 7 | 1.2 | 23 | 1.5 | 18 | 1.2 | 41 | 1.4 |
| පියලු වයස් කාණ්ඩ | 527 | 100 | 550 | 100 | 1077 | 100 | 391 | 100 | 391 | 100 | 782 | 100 | 312 | 100 | 264 | 100 | 576 | 100 | 286 | 100 | 312 | 100 | 598 | 100 | 1516 | 100 | 1517 | 100 | 3033 | 100 |

ඇමුණුම 3

## මූලික සේවා මධ්‍යස්ථාන වලට සමීපතාවය

| සේවා මධ්‍යස්ථාන | සැතපුම් එකක් ඇතුලත | | | | සැතපුම් 5 ක් ඇතුලත | | | | සැතපුම් 10 ක් ඇතුලත | | | | සැතපුම් 10 ට වැඩි | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 5 | 6 | 7 | 8 | 5 | 6 | 7 | 8 | 5 | 6 | 7 | 8 | 5 | 6 | 7 | 8 |
| දුම්රිය ස්ථානය | 2.2 | 20.8 | 22.5 | 2.0 | 28.3 | 81.6 | 56.8 | 8.7 | 78.9 | 96.8 | 89.1 | 28.9 | 21.1 | 3.2 | 10.9 | 71.1 |
| බස් පාර | 82.2 | 93.6 | 84.5 | 78.8 | 100.0 | 100.0 | 100.0 | 100.0 | - | - | - | - | - | - | - | - |
| පාසැල | 73.3 | 76.8 | 88.2 | 80.9 | 100.0 | 100.0 | 100.0 | 99.1 | - | - | - | - | - | - | - | - |
| ආරෝග්‍යශාලාව/ ඩිස්පෙන්සරිය | 24.6 | 43.2 | 41.2 | 34.6 | 97.8 | 100.0 | 93.2 | 91.3 | 100.0 | - | 100.0 | 100.0 | - | - | - | - |
| තැපැල් කාර්යාලය | 26.1 | 25.6 | 47.5 | 57.7 | 97.8 | 94.4 | 95.0 | 97.8 | 100.0 | 100.0 | 100.0 | 100.0 | - | - | - | - |
| බැංකුව | 21.7 | 16.8 | 22.5 | 32.7 | 95.6 | 59.2 | 66.6 | 89.4 | 99.5 | 84.8 | 98.0 | 100.0 | 0.5 | 15.2 | 2.0 | - |
| සමූපකාරය | 50.0 | 64.8 | 83.5 | 66.0 | 98.9 | 99.2 | 100.0 | 100.0 | 100.0 | 100.0 | - | - | - | - | - | - |
| පොලිස් ස්ථානය | 0.5 | 31.2 | 2.0 | 34.0 | 13.3 | 71.2 | 32.7 | 88.4 | 52.2 | 88.0 | 90.1 | 100.0 | 47.8 | 12.0 | 9.9 | - |
| වෛද්‍ය මධ්‍යස්ථානය | 40.2 | 55.2 | 39.2 | 41.2 | 98.3 | 97.6 | 74.5 | 90.2 | 100.0 | 100.0 | 100.0 | 99.0 | - | - | - | 1.0 |
| පොළ | 2.4 | 33.1 | 25.7 | 6.7 | 59.8 | 97.6 | 58.4 | 52.8 | 97.1 | 100.0 | 92.1 | 81.0 | 2.9 | - | 7.9 | 19.0 |

ඇමිණුම 4 (I)

## වයස, අධ්‍යාපනික තත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ගෘහස්ථයින්ගේ ව්‍යාප්තිය – ප්‍රදේශ අංක 5

| වයස් කාණ්ඩ (අවුරුදු) | ස්ත්‍රී පුරුෂ භාවය | අධ්‍යාපනික මට්ටම * 1 | 2 | 3 | 4 | 5 | සියළු කාණ්ඩ |
|---|---|---|---|---|---|---|---|
| 0–5 | පිරිමි | 64 | 2 | 8 | 0 | 0 | 74 |
| | ගැහැණු | 75 | 2 | 9 | 0 | 0 | 86 |
| 6–9 | පිරිමි | 0 | 2 | 50 | 1 | 0 | 53 |
| | ගැහැණු | 0 | 6 | 68 | 0 | 0 | 74 |
| 10–13 | පිරිමි | 0 | 7 | 40 | 19 | 0 | 66 |
| | ගැහැණු | 0 | 8 | 35 | 16 | 0 | 59 |
| 14–19 | පිරිමි | 0 | 11 | 27 | 36 | 15 | 89 |
| | ගැහැණු | 0 | 11 | 35 | 39 | 8 | 93 |
| 20–29 | පිරිමි | 0 | 5 | 23 | 35 | 18 | 81 |
| | ගැහැණු | 0 | 6 | 29 | 39 | 10 | 84 |
| 30–39 | පිරිමි | 0 | 3 | 14 | 17 | 8 | 42 |
| | ගැහැණු | 0 | 15 | 28 | 19 | 10 | 72 |
| 40–49 | පිරිමි | 0 | 8 | 34 | 14 | 4 | 60 |
| | ගැහැණු | 0 | 16 | 12 | 6 | 2 | 36 |
| 50–65 | පිරිමි | 0 | 8 | 21 | 16 | 3 | 48 |
| | ගැහැණු | 0 | 19 | 6 | 3 | 2 | 30 |
| 66 ට වැඩි | පිරිමි | 0 | 3 | 4 | 6 | 1 | 14 |
| | ගැහැණු | 0 | 13 | 3 | 0 | 0 | 16 |
| සියළු කාණ්ඩ | පිරිමි | 64 | 49 | 221 | 144 | 49 | 527 |
| | ගැහැණු | 75 | 96 | 225 | 122 | 32 | 550 |

කුටුම්භ සංඛ්‍යාව = 180

* අධ්‍යාපනික මට්ටමේ කේතයන්

1. පාසැල් නොයන අවුරුදු 5 ට අඩු
2. පාසැල් නොයන අවුරුදු 5 ට වැඩි
3. 5 ශ්‍රේණිය දක්වා
4. 6 වන ශ්‍රේණිය සිට අ. පො. ස. (සා. පෙ)
5. අ. පො. ස (සා. පෙළ) සමත් සහ ඉන් ඉහළ

ඇමුණුම 4 (II)

වයස, අධ්‍යාපන මට්ටම සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ගෘහස්ථයින්ගේ ව්‍යාප්තිය – ප්‍රදේශ අංක 6

| වයස් කාණ්ඩ (අවුරුදු) | ස්ත්‍රී පුරුෂ භාවය | අධ්‍යාපනික මට්ටම* 1 | 2 | 3 | 4 | 5 | සියළු කාණ්ඩවල |
|---|---|---|---|---|---|---|---|
| 0– 5 | පිරිමි | 52 | 4 | 10 | 0 | 0 | 66 |
| | ගැහැණු | 53 | 4 | 6 | 0 | 0 | 63 |
| 6– 9 | පිරිමි | 0 | 4 | 39 | 0 | 0 | 43 |
| | ගැහැණු | 0 | 9 | 45 | 1 | 0 | 55 |
| 10–13 | පිරිමි | 0 | 4 | 37 | 8 | 0 | 49 |
| | ගැහැණු | 0 | 3 | 33 | 17 | 0 | 53 |
| 14–19 | පිරිමි | 0 | 4 | 18 | 32 | 6 | 60 |
| | ගැහැණු | 0 | 8 | 16 | 24 | 7 | 55 |
| 20–29 | පිරිමි | 0 | 3 | 20 | 29 | 11 | 63 |
| | ගැහැණු | 0 | 6 | 19 | 26 | 11 | 62 |
| 30–39 | පිරිමි | 0 | 3 | 19 | 7 | 5 | 34 |
| | ගැහැණු | 0 | 9 | 17 | 9 | 5 | 40 |
| 40–49 | පිරිමි | 0 | 1 | 18 | 12 | 1 | 32 |
| | ගැහැණු | 0 | 8 | 12 | 7 | 0 | 27 |
| 50–65 | පිරිමි | 0 | 3 | 15 | 11 | 1 | 30 |
| | ගැහැණු | 0 | 16 | 6 | 5 | 0 | 27 |
| 66 ට වැඩි | පිරිමි | 0 | 4 | 4 | 6 | 0 | 14 |
| | ගැහැණු | 0 | 7 | 2 | 0 | 0 | 9 |
| සියළු කාණ්ඩවල | පිරිමි | 52 | 30 | 180 | 105 | 24 | 391 |
| | ගැහැණු | 53 | 70 | 156 | 89 | 23 | 391 |

කුටුම්භ සංඛ්‍යාව = 125

* අධ්‍යාපනික මට්ටමේ කේතයන්

1. පාසැල් නොයන අවුරුදු 5 ට අඩු
2. පාසැල් නොයන අවුරුදු 5 ට වැඩි
3. පස්වන ශ්‍රේණියට පහළ
4. 6 වන ශ්‍රේණිය අ. පො. ස (සා. පෙ)
5. අ. පො. ස (සා. පෙ) සමත් සහ ඉන් ඉහල

ඇමිණුම 4 (III)

වයස, අධ්‍යාපන මට්ටම, සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සාමාජිකයන්ගේ ව්‍යාප්තිය – ප්‍රදේශ අංක 7

| වයස් කාණ්ඩ (අවුරුදු) | ස්ත්‍රී පුරුෂ භාවය | අධ්‍යාපනික මට්ටම* 1 | 2 | 3 | 4 | 5 | සියළු කාණ්ඩවල |
|---|---|---|---|---|---|---|---|
| 0–5 | පිරිමි | 38 | 1 | 6 | 0 | 0 | 45 |
| | ගැහැණු | 29 | 1 | 2 | 0 | 0 | 32 |
| 6–9 | පිරිමි | 0 | 0 | 35 | 0 | 0 | 35 |
| | ගැහැණු | 0 | 0 | 19 | 0 | 0 | 19 |
| 10–13 | පිරිමි | 0 | 0 | 27 | 11 | 0 | 38 |
| | ගැහැණු | 0 | 4 | 15 | 16 | 0 | 35 |
| 14–19 | පිරිමි | 0 | 1 | 17 | 24 | 12 | 54 |
| | ගැහැණු | 0 | 4 | 8 | 31 | 6 | 49 |
| 20–29 | පිරිමි | 0 | 1 | 13 | 29 | 11 | 54 |
| | ගැහැණු | 0 | 5 | 12 | 16 | 12 | 45 |
| 30–39 | පිරිමි | 0 | 1 | 8 | 8 | 4 | 21 |
| | ගැහැණු | 0 | 4 | 13 | 14 | 2 | 33 |
| 40–49 | පිරිමි | 0 | 3 | 13 | 11 | 2 | 29 |
| | ගැහැණු | 0 | 5 | 8 | 3 | 3 | 19 |
| 50–65 | පිරිමි | 0 | 3 | 7 | 10 | 2 | 22 |
| | ගැහැණු | 0 | 19 | 3 | 0 | 0 | 22 |
| 66 ට වැඩි | පිරිමි | 0 | 4 | 6 | 4 | 0 | 14 |
| | ගැහැණු | 0 | 8 | 2 | 0 | 0 | 10 |
| සියළු කාණ්ඩවල | පිරිමි | 38 | 14 | 132 | 97 | 31 | 312 |
| | ගැහැණු | 29 | 50 | 82 | 81 | 22 | 264 |

කුටුම්භ සංඛ්‍යාව = 103

* අධ්‍යාපනික මට්ටමේ සංකේතයන්:

1. පාසැල් නොයන අවුරුදු 5 ට අඩු
2. පාසැල් නොයන අවුරුදු 5 ට වැඩි
3. පස්වන ශ්‍රේණියට පහළ
4. 6 වන ශ්‍රේණිය – අ. පො. ස (සා. පෙළ)
5. අ. පො. ස (සා. පෙළ) සමත් සහ ඉන් ඉහළ

ඇමිණුම 4 (IV)

## වයස, අධ්‍යාපන මට්ටම සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සාමාජිකයන්ගේ ව්‍යාප්තිය – ප්‍රදේශ අංක 8

| වයස් කාණ්ඩ (අවුරුදු) | ස්ත්‍රී පුරුෂ භාවය | අධ්‍යාපනික මට්ටම* 1 | 2 | 3 | 4 | 5 | සියලු කාණ්ඩවල |
|---|---|---|---|---|---|---|---|
| 0–5 | පිරිමි | 48 | 1 | 1 | 0 | 0 | 50 |
| | ගැහැණු | 53 | 2 | 3 | 0 | 0 | 58 |
| 6–9 | පිරිමි | 0 | 5 | 32 | 2 | 0 | 39 |
| | ගැහැණු | 0 | 3 | 39 | 0 | 0 | 42 |
| 10–13 | පිරිමි | 0 | 4 | 17 | 6 | 0 | 27 |
| | ගැහැණු | 0 | 1 | 21 | 12 | 0 | 34 |
| 14–19 | පිරිමි | 0 | 2 | 12 | 22 | 0 | 36 |
| | ගැහැණු | 0 | 0 | 24 | 17 | 6 | 47 |
| 20–29 | පිරිමි | 0 | 2 | 14 | 26 | 9 | 51 |
| | ගැහැණු | 0 | 7 | 26 | 22 | 11 | 66 |
| 30–39 | පිරිමි | 0 | 4 | 15 | 12 | 5 | 36 |
| | ගැහැණු | 0 | 4 | 13 | 5 | 3 | 25 |
| 40–49 | පිරිමි | 0 | 1 | 6 | 8 | 0 | 15 |
| | ගැහැණු | 0 | 6 | 8 | 3 | 0 | 17 |
| 50–65 | පිරිමි | 0 | 2 | 11 | 12 | 0 | 25 |
| | ගැහැණු | 0 | 17 | 3 | 0 | 0 | 20 |
| 66 ට වැඩි | පිරිමි | 0 | 1 | 3 | 3 | 0 | 7 |
| | ගැහැණු | 0 | 3 | 0 | 0 | 0 | 3 |
| සියලු කාණ්ඩවල | පිරිමි | 40 | 22 | 111 | 91 | 14 | 286 |
| | ගැහැණු | 53 | 43 | 137 | 59 | 20 | 312 |

කුටුම්භ සංඛ්‍යාව = 104

* අධ්‍යාපනික මට්ටමේ කේතයන්

1. පාසැල් නොයන අවුරුදු 5 ට අඩු
2. පාසැල් නොයන අවුරුදු 5 ට වැඩි
3. පස්වන ශ්‍රේණියට පහළ
4. 6 වන ශ්‍රේණිය (අ. පො. ස) සා. පෙළ
5. අ. පො. ස (සා. පෙළ) සමත් සහ ඉන් ඉහළ

ඇමිණුම 5

## වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කරන ලද ශ්‍රම හමුදාවේ අධ්‍යාපනික ව්‍යුහය

| | පිරිමි | | | | | | | ගැහැණු | | | | | | | එකතුව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වයස්කාණ්ඩ (අවුරුදු) | පාසැල්නොගිය | පස්වන ශ්‍රේණියට පහල | 6 වන ශ්‍රේණිය (අ.පො.ස සා.පෙළ) | අ.පො.ස (සා.පෙ) සමත් | අ.පො.ස (උ.පෙ) සමත් | වෙනත් සුදුසුකම් | එකතුව | පාසැල් නොගිය | පස්වන ශ්‍රේණියට පහල | 6 වන ශ්‍රේණිය (අ.පො.ස සා.පෙළ) | අ.පො.ස (සා.පෙ) සමත් | අ.පො.ස (උ.පෙ) සමත් | වෙනත් සුදුසුකම් | එකතුව | පාසැල් නොගිය | පස්වන ශ්‍රේණියට පහල | 6 වන ශ්‍රේණිය (අ.පො.ස සා.පෙළ) | අ.පො.ස (සා.පෙළ) සමත් | අ.පො.ස (උ.පෙ) සමත් | වෙනත් සුදුසුකම් | එකතුව* |
| 14–19 | 16 | 60 | 48 | 10 | 1 | – | 135 | 23 | 77 | 51 | 5 | 1 | – | 157 | 39 | 137 | 99 | 15 | 2 | – | 292 |
| 20–29 | 18 | 69 | 109 | 38 | 2 | 3 | 239 | 27 | 83 | 99 | 32 | 4 | 1 | 246 | 45 | 152 | 208 | 70 | 6 | – | 485 |
| 30–39 | 12 | 58 | 43 | 17 | 1 | 2 | 133 | 36 | 71 | 47 | 15 | 1 | 5 | 175 | 48 | 129 | 90 | 32 | 2 | – | 308 |
| 40–49 | 12 | 72 | 46 | 2 | – | 4 | 136 | 35 | 41 | 21 | 1 | – | 2 | 100 | 47 | 113 | 67 | 3 | – | 6 | 236 |
| 50–59 | 9 | 48 | 35 | 2 | – | 2 | 96 | 38 | 14 | 8 | 1 | – | – | 61 | 47 | 62 | 43 | 3 | – | 2 | 157 |
| 60–65 | 6 | 8 | 11 | 1 | – | 1 | 27 | 26 | 4 | 3 | – | – | – | 33 | 32 | 12 | 14 | 1 | – | 1 | 60 |
| එකතුව | 73 | 315 | 292 | 70 | 4 | 12 | 766 | 185 | 290 | 229 | 54 | 6 | 8 | 722 | 258 | 605 | 521 | 124 | 10 | 20 | 1538 |

* වයස අවුරුදු 14 සහ 65 අතර දුබලතා වලින් පෙලෙන වැඩපල කල නොහැකි අය, පාසැල් සිසුන් සහ පූජ්‍ය පක්ෂය අත් හැර ඇත.